6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍ර ලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම	2022 වර්ෂයේදී කමිටු 03ක් පමණක් පවත්වන ලදී.	රටතුළ පැවති සෞඛ්‍ය තත්වය සහ ප්‍රවාහන අපහසුතා හේතුවෙනි.	2022 සහ ඉදිරිය සඳහා මාර්ගෝපදේශ දැඩිව අනුගමනය කිරීම
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලනොවේ	සැලසුම් කළ දිනට සම්පූර්ණ නොකිරීම.	1. සමීක්ෂණ වාර්තාව විගණකාධිපත් වෙත ඉදිරිපත්කරන ලදී. 2. සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කෙරෙමින් පවතී.
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකර තිබීම	අනුකූලනොවේ	සැලසුම් කළ දිනට සම්පූර්ණ නොකිරීම.	1. සමීක්ෂණ වාර්තාව විගණකාධිපත්

				වෙත ඉදිරිපත්කරන ලදී. 2. සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කෙරෙමින් පවතී.
8.5	ගර්භිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූලනොවේ	සැලසුම් කළ දිනට සම්පූර්ණ නොකිරීම.	1. සමීක්ෂණ වාර්තාව විගණකාධිපත් වෙත ඉදිරිපත්කරන ලදී. 2. සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කෙරෙමින් පවතී.
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සදහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	පැවති ඉන්ධන සීමා කිරීම/ QR ක්‍රමය යටතේ ඉන්ධන නිකුත් කිරීම හේතුවෙන් වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම සිදු කර නොමැත.	ඉන්ධන දහනය පිළිබඳ ගැටළු පවතින වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීමට පියවර ගනු ඇත.
9.6	කල්බදු කාල සීමාව අවසානයේදී කල්බදු වාහන ලොග් පොතේ පූර්ණ අයිතිය පවරා තිබීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය	අනුකූල වේ		
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා සූදානම්කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචන වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම		අනුකූල නොවීම	ශේෂයන් නිරවුල් කිරීමට කඩිනමින් පියවර ගනිමින් සිටී.
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා ඇති ප්‍රතිපාදනවල සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු (1) 94.රෙ.ප්‍රකාරවඑලඹී ඇති බැරකම් වර්ෂ ,	අනුකූල වේ		

	අවසානයේ දී ඉතිරිව ඇති ප්‍රතිපාදන සීමාව නොඉක්මවීම			
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	අත්තිකාරම් සීමාවන්ට අනුකූල වීම අනුකූලවේ	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වසරකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම	අනුකූල වේ		
13.1	කාලය ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මූ .රෙ.**571** ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුමලේඛනය / යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
14	අග්‍රිම ගිණුම	අනුකූල වේ		
14.1	සමාලෝචන වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මූ .රෙ.**371** ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මූ .රෙ.**371** ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මූ .රෙ.**176** අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	**2017.09.20** දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වක්‍රලේඛ අංක **04/2017** ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ **8** වන හා **10** වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පුද්ගල ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක **05/2008** හා **05/2018(1)** දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වක්‍රලේඛ අනුව	සකස් කරමින් පවතී.		

	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම			
18.2	එම චක්‍ර ලේඛයේ **2.3** ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර තිබීම	සකස් කරමින් පවතී.		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	**2018.01.24** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **02/2018** ඇමුණුම **02** ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම	අනුකූල නොවේ	මේ වෙනුවට, දේශීය පුහුණු වැඩසටහන් සඳහා වනාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් මානව සම්පත් සංවර්ධන අංශය මගින් සකස් කර ඇත.මෙම ක්‍රියාකාරී සැලසුම නිසි පරිදි සම්පූර්ණ කර ඇත. තවද මෙම ක්‍රියාකාරී සැලැස්ම දෙපාර්තමේන්තුවේ සෑම අංශයකම අවශ්‍යතාවන් සපුරා ඇත.	චක්‍ර ලේඛයට අනුව අනාගතයේදී මානව සම්පත් සැලසුමක් සකස් කිරීමට පියවර ගනු ඇත.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය **12** කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	ඉහත කී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම දෙපාර්තමේන්තුවේ සෑම අංශයකම සේවකයන් ආවරණය කරමින් පුහුණු අවශ්‍යතාවන් කෙරෙහි අවධානය යොමු කර ඇත. එබැවින්, ධූරාවලියේ සෑම අයකුටම අවම වශයෙන් වාර්ෂිකව පැය **12**ක පුහුණුවක් ලැබේ. නමුත් රාජකාරී පරිසරයේ ඇතැම් බාධකයන් හේතුවෙන් සියලුම සේවකයින්ට පුහුණුවකට සහභාගී වීමට අවස්ථාවක් නොලැබෙනු ඇත.	ලිත් වර්ෂයක් තුළ පුහුණුව ලබන සේවකයින් සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගනු ඇත.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම **01** හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	මෙය මානව සම්පත් සංවර්ධණ අංශයේ විෂය පථය යටතට නොගැනේ. ඒ	

			වෙනුවට එය මානව සම්පත් කළමනාකරණ අංශයේ විෂය පථයට අයත් වේ.	
19.4	ඉහත චක්‍රලේඛයේ **6.5** ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ය නිලධාරියකු පත් කර තිබීම	අනුකූල නොවේ	ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම පිළිබඳ සාමූහික වගකීමක් ඉහළ ජ්‍යෙෂ්ය කළමනාකරණයේ සහ මධ්‍යම කළමනාකරණයේ නිලධාරීන්ට පවතී.	චක්‍රලේඛයෙන් යෝජනා කර ඇති පරිදි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කිරීමට පියවර ගනු ඇත.
20	විගණන ඡේද සඳහා ප්‍රතිචාර		ඉහත කී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම දෙපාර්තමේන්තු වේ සෑම අංශයකම සේවකයන් ආවරණය කරමින් පුහුණු අවශ්‍යතාවන් කෙරෙහි අවධානය යොමු කර ඇත. එබැවින්, ධූරාවලියේ සෑම අයකුටම අවම වශයෙන් වාර්ෂිකව පැය **12**ක පුහුණුවක් ලැබේ. නමුත් රාජකාරී පරිසරයේ ඇතැම් බාධකයන් හේතුවෙන් සියලුම සේවකයින්ට පුහුණුවකට සහභාගී වීමට අවස්ථාවක් නොලැබෙනු ඇත.	ලිත් වර්ෂයක් තුළ පුහුණුව ලබන සේවකයින් සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගනු ඇත.
20.1	පෙර වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගනන ඡේදයේ දක්වා ඇති අඩුපාඩු නිවැරදි කර ඇත.		අනුකූල නොවේ.	සමාලෝචනය වෙමින් පවතී

8.1 බලාත්මක කිරීමේ පර්ෂදය

8.1.1 නිවාරණ අංශය

8.1.2 සමාජ ආරක්ෂණ අංශය

8.1.2.1 මත්ද්‍රව්‍ය පාලන අංශය

8.1.2.2 ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂා කිරීමේ අංශය

8.1.2.3 පාරිභෝගික ආරක්ෂණ ඒකකය

8.1.2.4 වරාය පාලන ඒකකය

8.1.3 මධ්‍යම බුද්ධි අංශය

8.1.4 මධ්‍යම විමර්ශන අංශය

8.1.5 නීති කටයුතු අංශය

8.1.6 අවදානම් කළමනාකරණ අංශය

8.1.7 මධ්‍යම අපහරණ අංශය

8.1.1 නිවාරණ අංශය

ශ්‍රී ලංකා රේගුවේ නීති බලාත්මක කරන ප්‍රධාන හස්තය වන්නේ නිවාරණ අංශයයි.එය කොළඹ වරාය, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ, අනෙකුත් වරායන්, ආයෝජන කලාප සහ රේගුවේ අනෙකුත් සියළුම මෙහෙයුම් ප්‍රදේශයන්හි ආවේක්ෂණ කටයුතු සිදු කරයි.

එහි ප්‍රධාන අරමුණු වන්නේ;

- නීති විරෝධී භාණ්ඩ ජාවාරම් වාණිජ වංචා ,හා නීති විරෝධී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය වැළැක්වීම.
- වංචා අනාවරණය කර ගැනීම, නීති විරෝධී ලෙස ජාවාරම් කරන ලද භාණ්ඩ අල්ලා ගැනීම, පරීක්ෂණ හා විමර්ශණ පැවැත්වීම, නඩු කටයුතු මෙහෙයවීම.
- ආදායම් නියමිත පරිදි එකතු කිරීම සහතික වීම.
- සමාජයේ සමාජ ආර්ථිකසංස්කෘතික හා පාරිසරික , වශයෙන් වැදගත්කමක් දක්වන දෑ සුරක්ෂිත කිරීම.
- කොළඹ වරාය ඇතුළු අනෙකුත් වරායන්බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හා මත්තල මහින්ද , රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළඅවේක්ෂණ කටයුතු පවත්වා ගැනීම.
- මුහුදු යාත්‍රා සංචරණ පාලනය හා දේශසීමා මෙහෙයුම් කටයුතු.

01 රූපය : ශ්‍රී ලංකා රේගුවේ උප නිවාරණ කාර්යාලවල පිහිටීම



2022 වසරේ නිවාරණ අංශයේ අනාවරණය කරගැනීම්

1.1 <u>නව සිද්ධි</u>

1.1.1	කාර්ය මණ්ඩලය විසින් ආරම්භ කරන ලද/ අනාවරණය කරන ලද සිද්ධි	141
1.1.2	වෙනත් නියෝජිතායතන මගින් ඉදිරිපත් කරන ලද සිද්ධි	33
1.1.3	ලියාපදිංචිවූ මුළු සිද්ධි සංඛ්‍යාව **(1.1 + 1.2)**	174
1.1.4	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව	
1.1.4.1	*රේගු වැරදි නොමැතිව නිමකරන ලද සිද්ධි සංඛ්‍යාව*	18
1.1.4.2	*වෙනත් ඒකක/ශාඛාවන් වෙත භාරදුන් සිද්ධි*	0
1.1.4.3	*සාමාන්‍ය ක්‍රමය යටතේ ක්‍රියාකිරීම සඳහා නිදහස් කළ සිද්ධි*	0
1.1.4.4	*රඳවා ගැනීමට පෙර බෙදා හැරීම් සිදුකර ඇත*	0
1.1.4.5	සාර්ථකව නිමකරන ලද සිද්ධි	
1.1.4.5.1	*දණ්ඩන/ තහනම් කිරීම් / අතිරේක සටහන්කර සහිතව අවසන් කරන ලද සිද්ධි*	53
1.1.4.5.2	*අතිරේක සටහන්කර පමණක් සහිතව අවසන් කරන ලද සිද්ධි (මිල නියම කිරීම මගින්)*	6
1.1.4.5.3	*අතිරේක සටහන්කර පමණක් සහිතව අවසන් කරන ලද සිද්ධි (නිවාරණය මගින්)*	4
(අ)	*අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාවේ එකතුව (1.1.4.1 සිට 1.1.4.5.3 දක්වා එකතුව)*	81
1.1.5	අවසන් කළ යුතුව ඇති සිද්ධි	
1.1.5.1	*රේගු විමර්ශන අවසන් කර නොමැති සිද්ධි*	9
1.1.5.2	*පරීක්ෂණ නිමකර නොමැති සිද්ධි*	82
1.1.5.3	*ලිහිල් කිරීම් සඳහා අභියාචනා සළකා බැලිය යුතු සිද්ධි*	1
1.1.5.4	*ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැන්වීම් ඉදිරිපත්කළ සිද්ධි*	1
(ආ)	අවසන් කල යුතුව ඇති සිද්ධි සංඛ්‍යාවේ එකතුව **(1.1.5.1 සිට 1.1.5.4 දක්වා එකතුව)**	93



02 රූපය : 2022 වසරේදී නිවාරණ අංශය මගින් ආරම්භ කරන ලද නව රේගු සිද්ධිවල තත්ත්වය

1.2	**පෙර සිද්ධි**		
1.2.1	වසර ආරම්භයේදී අවසන් කිරීමට ඇති සිද්ධි		1447
1.2.2	වසර තුළ අවසන් කරන ලද සිද්ධි		
	1.2.2.1	රේගු වැරදි නොමැතිව නිමකරන ලද සිද්ධි සංඛ්‍යාව	160
	1.2.2.2	වෙනත් ඒකක/ශාඛාවන් වෙත භාරදුන් සිද්ධි	7
	1.2.2.3	සාමාන්‍ය ක්‍රමය යටතේ ක්‍රියාකිරීම සඳහා නිදහස් කළ සිද්ධි	0
	1.2.2.4	රඳවා ගැනීමට පෙර බෙදා හැරීම් සිදුකර ඇත	0
	1.2.2.5	සාර්ථකව නිමකරන ලද සිද්ධි	
	1.2.2.5.1	දණ්ඩන/ තහනම් කිරීම් / අතිරේක සටහන්කර සහිතව අවසන් කරන ලද සිද්ධි	117
	1.2.2.5.2	අතිරේක සටහන්කර පමණක් සහිතව අවසන් කරන ලද සිද්ධි (මිල නියම කිරීම මගින්)	28
	1.2.2.5.3	අතිරේක සටහන්කර පමණක් සහිතව අවසන් කරන ලද සිද්ධි (නිවාරණය මගින්)	1
(අ)	1.2.2.6	අවසන් කරන ලද අධිකරණ නඩු සංඛ්‍යාව	0
	වසර තුළ අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාවේ එකතුව(**1.2.2.1** සිට **1.2.2.6** දක්වා එකතුව)		**313**
1.2.3	අවසන් කළ යුතුව ඇති සිද්ධි		
	1.2.3.1	රේගු විමර්ශන අවසන් කර නොමැති සිද්ධි	48
	1.2.3.2	පරීක්ෂණ නිමකර නොමැති සිද්ධි	959
	1.2.3.3	ලිහිල් කිරීම් සඳහා අභියාචනා සළකා බැලිය යුතු සිද්ධි	5
	1.2.3.4	ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැන්වීම් ඉදිරිපත්කළ සිද්ධි	59
	1.2.3.5	භාණ්ඩ අපහරණය කළ යුතුව ඇති සිද්ධි	42
	1.2.3.6	අවසන් කළ යුතුව ඇති නඩු	21
(ඇ)	අවසන් කල යුතුව ඇති සිද්ධි සංඛ්‍යාවේ එකතුව (1.2.3.1 සිට 1.2.3.6 දක්වා එකතුව)		**1134**



රූපය : 2022 වසරට පෙර ආරම්භ කරන ලද පෙර රේගු සිද්ධිවල තත්ත්වය

සාරාංශය

වසර තුළ අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාවේ එකතුව (අ +ඇ)	394
රේගු වැරදි නොමැතිව නිමකරන ලද සිද්ධි සංඛ්‍යාව	178
වෙනත් ඒකක/ශාඛාවන් වෙත භාරදුන් සිද්ධි	7
සාමාන්‍ය ක්‍රමය යටතේ ක්‍රියාකිරීම සඳහා නිදහස් කළ සිද්ධි	0
රඳවා ගැනීමට පෙර බෙදා හැරීම් සිදුකර ඇත	0
වසර තුළ සාර්ථකව අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාවේ එකතුව (1.1.4.5 + 1.2.2.5)	23
දණ්ඩන/ තහනම් කිරීම් / අතිරේක සටහන්කර සහිතව අවසන	147
අතිරේක සටහන්කර පමණක් සහිතව අවසන් කරන ලද සිද්ධි (මිල නියම කිරීම මගින්)	34
අතිරේක සටහන්කර පමණක් සහිතව අවසන් කරන ලද සිද්ධි (නිවාරණය මගින්)	5
අවසන් කරන ලද අධිකරණ නඩු සංඛ්‍යාව	0

වසර අවසානයේදී අවසන් කිරීමට නියමිත සිද්ධි සංඛ්‍යාවේ එකතුව(ආ+ඇ)	1227
රේගු විමර්ශන අවසන් කර නොමැති සිද්ධි	53
පරීක්ෂණ නිමකර නොමැති සිද්ධි	1034
ලිහිල් කිරීම් සඳහා අභියාචනා සළකා බැලිය යුතු සිද්ධි	5
ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැන්වීම් ඉදිරිපත්කළ සිද්ධි	64
භාණ්ඩ අපහරණය කළ යුතුව ඇති සිද්ධි	38
අවසන් කළ යුතුව ඇති නඩු	33

02.අල්ලාගැනීම්

2.1	වසර ආරම්භයේදී අල්ලා ගන්නා ලද වාහන සංඛ්‍යාව	52
2.2	වසර තුළ අල්ලා ගන්නා ලද වාහන සංඛ්‍යාව	13
2.3	වසර තුළ නිදහස් කරන ලද වාහන සංඛ්‍යාව	14
2.4	වසර අවසානයේදී අල්ලා ගන්නා ලද වාහන සංඛ්‍යාවේ එකතුව	51
2.5	වසර ආරම්භයේදී අල්ලා ගන්නා ලද බහාළුම් සංඛ්‍යාව	14
2.6	වසර තුළ අල්ලා ගන්නා ලද බහාළුම් සංඛ්‍යාව	12
2.7	වසර තුළ නිදහස් කරන ලද බහාළුම් සංඛ්‍යාව	13
2.8	වසර අවසානයේදී අල්ලා ගන්නාලද බහාළුම් සංඛ්‍යාවේ එකතුව	13
2.9	සිගරට් කාටූන (සිගරට් 10,000) සංඛ්‍යාව	400
2.10	ස්ප්‍රීතු බෝතල් සංඛ්‍යාව	0
2.11	අල්ලා ගන්නා ලද භාණ්ඩ වල මුළු වටිනාකම	0

03. අයකර ගැනීම්

3.1	රාජසන්තක කරන ලද භාණ්ඩවල වටිනාකම	රු.11,444,671.99
3.2	වසර ආරම්භයේදි අයකර ගත යුතු දණ්ඩන/රාජසන්තක කිරීම්	රු.199,057,275.00
3.3	වසර තුළ පනවන ලද දණ්ඩන/රාජසන්තක කිරීම්	රු.507,765,893.62
3.4	වසර තුළ අයකර ගන්නා ලද තීරු බදු සහ වෙනත් බදු	
3.4.1	රේගු බදු	රු.50,862,476.00
3.4.2	අධිභාර	0
3.4.3	එකතු කළ අගය මත බදු	රු.88,923,289.66
3.4.4	වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු	රු.44,044,766.20

3.4.5	ජාතිය ගොඩනැගීමේ බදු	0
3.4.6	නිෂ්පාදන බදු	0
3.4.7	ආනයන සෙස්	රු.283,965.19
3.4.8	EDB සෙස්	0
3.4.9	නිෂ්පාදන	0
3.4.10	ඒකාබද්ධ බදු	0
3.4.11	යාත්‍රා ගාස්තු	0
3.4.12	අධිභාර	රු.745,450
3.4.13	අතිකාල	රු.8,595,175.84
3.4.14	පරිගණක ගාස්තු	0
3.4.15	විශේෂ තැන්පතු	රු.400,000.00
3.4.16	වෙනත් අයකර ගැනීම්	රු.60,282,055.00
3.4.17	විකිණීමෙන් ලද මුදල්	-
	එකතුව	254,137,177.89

3.5	වසර තුළ අයකර ගන්නා ලද දණ්ඩන/ රාජසන්තක කිරීම්	**රු.415,172,226.62**
3.6	වසර අවසානයේදී අයකර ගැනිමට නියමිත දණ්ඩන/රාජසන්තක කිරීම්	රු.291,650,942.00
3.7	මිල පිරික්සුම් ඒකකයෙන් අයකර ගත් අතිරේක සටහන්කර	**රු.33,104,661.00**



03 රූපය: දණ්ඩන අයකර ගැනීම්

04. ඇපකර/තැන්පතු

4.1	වසර ආරම්භයේදී ඇති වාණිජ ඇපකර වටිනාකම	83,848,207.00
4.2	වසර තුළ පිළිගත් වාණිජ ඇපකර වටිනාකම	9,427,404.00
4.3	වසර තුළ නිදහස් කරන ලද වාණිජ ඇපකර වටිනාකම	0
4.4	වසර තුළ ඉල්ලා සිටින ලද වාණිජ ඇපකර වටිනාකම	0
	වසර අවසානයේ ඇති වාණිජ ඇපකර වටිනාකම	**93,275,611.00**
	වසර ආරම්භයේදී ඇති වාණිජ ඇපකර සංඛ්‍යාවේ එකතුව	2
	වසර තුළ පිළිගත් වාණිජ ඇපකර සංඛ්‍යාවේ එකතුව	1
	වසර තුළ නිදහස් කරන ලද වාණිජ ඇපකර සංඛ්‍යාවේ එකතුව	0
	වසර අවසානයේදී ඇති වාණිජ ඇපකර සංඛ්‍යාවේ එකතුව	**3**
4.5	වසර ආරම්භයේදී ඇති බැංකු ඇපකර වටිනාකම	415,954,378.50
4.6	වසර තුළ පිළිගත් බැංකු ඇපකර වටිනාකම	87,349,705.00
4.7	වසර තුළ නිදහස් කරන ලද බැංකු ඇපකර වටිනාකම	3,878,050.00
4.8	වසර තුළ විශේෂ තැන්පතුවක් ලෙස අයකරගෙන තැන්පත් කරන ලද බැංකු ඇපකර වටිනාකම	0
	වසර අවසානයේ ඇති බැංකු ඇපකර වටිනාකම	**499,426,033.50**
	වසර ආරම්භයේදී ඇති බැංකු ඇපකර සංඛ්‍යාවේ එකතුව	31
	වසර තුළ පිළිගත් බැංකු ඇපකර සංඛ්‍යාවේ එකතුව	9
	වසර තුළ නිදහස් කරන ලද බැංකු ඇපකර සංඛ්‍යාවේ එකතුව	2
	වසර අවසානයේදී ඇති බැංකු ඇපකර සංඛ්‍යාවේ එකතුව	38

8.1.2 සමාජ ආරක්ෂණ අංශය

8.1.2.1 මත්ද්‍රව්‍ය පාලන ඒකකය

දැක්ම

රටතුළ විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ජාවාරම් වැළැක්වීම , එම ද්‍රව්‍යවල පූර්වගාමී රසායනික ද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීම සහ ඒවායේ නීති විරෝධී භාවිතය පිළිබඳව සෝදිසි කිරීම සඳහා ගතිකව ක්‍රියාත්මක වන නීති බලාත්මක කිරීමේ ප්‍රමුඛ නියෝජිතායතනයක් වීම.

මෙහෙවර

- විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය වල අනිසි හා නීති විරෝධී සංසරණය වැළැක්වීම සහ මර්දනය.
- අදාළ නීති බලාත්මක කිරීම සඳහා රජයේ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය නොවන බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීම සම්බන්ධයෙන් විවිධ ජාත්‍යන්තර සම්මුතීන් යටතේ ජාතික බැඳීම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සහතික වීම.
- අදාළ විදේශීය බලධාරීන් හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- පවත්නා හා මතුවෙමින් පවතින අභියෝග තක්සේරු කිරීමට සහ විශ්ලේෂණය කිරීමට කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- මත්ද්‍රව්‍ය අනිසි භාවිතය පිළිබඳව සමාජය දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

නීති සහ රෙගුලාසි

- **1869** අංක **17** දරන රේගු ආඥා පනත
- **1984** අංක **13** දරන පනත ලෙස සංශෝධනය කරන ලද **1929** අංක **17** දරණ විෂ, අබිං වර්ග හා අන්තරායකර ඖෂධ පිළිබඳ ආඥා පනත
- **2022** අංක **41** දරන විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ (සංශෝධන) පනත
- **1980** අංක **27** දරන විලවුන්, ආලේපන උපාංග සහ ඖෂධ පනත
- **2008** අංක **1** දරන මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය නීතිවිරෝධී ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත
- පූර්වගාමී පාලන අධිකාරියේ රෙගුලාසි, අංකදින **10** මැයි **2010** හා **7/1653**ැනි අතිවිශේෂ ගැසට් නිවේදනය
- **1999** අංක **8** දරන දුම්කොළ බදු පනත
- දුම්කොළ බදු පනතේ රෙගුලාසි, **2009** ජූලි මස **17** දිනැති අංක **1610/28** දරන අති විශේෂ ගැසට් නිවේදනය
- දරන දණ්ඩ නීති සංග්‍රහ පනත **22** අංක **1993**
- **2018** අංක **26** දරන සුරාබදු පනත

මත්ද්‍රව්‍ය පාලන අංශයට අනුයුක්ත නිලධාරීන් විසින් ඉටුකරන ලද කාර්යයන්

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පැය **24** පුරා සෝදිසි කිරීම.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ **CCTV**ආරක්ෂක කැමරා පද්ධති මාර්ගයෙන් මගීන් නිරීක්ෂණය කිරීම සහ ලුහුබැඳීම.
- මාර්ග, සම්භවය, ගමන් රටාව සහ චර්යා රටා ආදිය සැලකිල්ලට ගනිමින් අවදානම් පැතිකඩ මත පදනම්ව මගීන් හඳුනා ගැනීම සහ මැදිහත් වීම.
- ගුවන් භාණ්ඩ, මුහුදු භාණ්ඩ, තැපැල් සහ කුරියර් භාණ්ඩ යනාදිය අහඹු ලෙස නිරීක්ෂණය කිරීම.
- මධ්‍යම තැපැල් හුවමාරුවේ දිනපතා වාරිකා සහ අධීක්ෂණය.
- මධ්‍යම තැපැල් හුවමාරුවේ අවදානම් පැතිකඩ භාවිතා කරමින් මත්ද්‍රව්‍ය ප්‍රභව රටවලින් පැමිණෙන පාර්සල් අහඹු ලෙස රඳවා තබා ගැනීම.
- ගුවන් හා මුහුදු මාර්ග හරහා ප්‍රවාහනය වන වාණිජ ආනයන හා අපනයන මගින් විෂ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය ජාවාරම හඳුනා ගැනීම සහ වැළැක්වීම.
- විශ්වාසනීය තොරතුරු මත පරීක්ෂණ සිදු කිරීම.

- ආයතනය තුළ මෙන්ම සාමාන්‍ය මහජනයා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රජයේ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- පූර්වගාමී රසායනික ආනයන, ප්‍රතිනැවිගත කිරීම් හා අපනයන අධීක්ෂණය කිරීම.
- පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය වැනි වෙනත් මෙහෙයුම් ආයතන සමඟ ඒකාබද්ධ මෙහෙයුම් සිදු කිරීම.

වගුව **01 :** පසුගිය වසර 7 තුළ **(2016-2022)** මත්ද්‍රව්‍ය පාලන ඒකකය මගින් කළ අනාවරණයන්

විෂ මත්ද්‍රව්‍ය වර්ගය	මුළු ප්‍රමාණය (කි.ග්‍රෑ)
කොකේන්	1259.1
හෂිස්	21.504
මෙතම්ෆෙටමීන්	43.202
කංසා	29.568
හෙරොයින්	19.52
ඛාට්	336.3
ඩයස්පාම්	19.76
කංසා තෙල්	0.202
එකතුව	**1729.156**



01 රූපය **:** පසුගිය වසර 7 තුළ**(2016-2022)** අත්අඩංගුවට ගත් මුළු මත්ද්‍රව්‍ය ප්‍රමාණයන්

මෙම වර්ෂයේදී සමස්ත සිදුවීම් **67** ක් වාර්තා වූ අතර කි.ග්‍රෑ. **20.181** ක මත්ද්‍රව්‍ය ප්‍රමාණයක් අත්අඩංගුවට ගන්නා ලදී. **2022** වර්ෂයේදී වැඩිම අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාවක් සහිත රටවල් ලෙස උගන්ඩාව, කෙන්යාව, බ්‍රසීලය, මහා බ්‍රිතාන්‍යය, කැනඩාව, නෙදර්ලන්තය සහ ජර්මනිය හඳුනාගන්නා ලදී.

පසුගිය වසර හතක කාලය තුළ (**2016** සිට **2022** දක්වා) මත්ද්‍රව්‍ය කි.ග්‍රෑ. **1729.156** ක ප්‍රමාණයක් අත්අඩංගුවට ගන්නා ලදී.එයට කොකේන්, හෙරොයින්, මෙතම්ෆෙටමීන්, කංසා, හෂිස්, ඛාට්, ඩයස්පාම් සහ කංසා තෙල් ඇතුළත් වේ.

වගුව **02:** පසුගිය වසර හය තුළ අත්අංගුවටගත් මත්ද්‍රව්‍ය පිළිබඳ සමස්ත සාරාංශය

මත්ද්‍රව්‍ය වර්ගය	2016 (කි.ග්‍රෑ.)	2017 (කි.ග්‍රෑ.)	2018 (කි.ග්‍රෑ.)	2019 (කි.ග්‍රෑ.)	2020 (කි.ග්‍රෑ.)	2021 (කි.ග්‍රෑ.)	2022 (කි.ග්‍රෑ.)
කොකේන්	1232.04	-	2.38	10.16	0.08	3.122	11.318
හෂිස්	-	0.08	15.74	3.05	-	2.634	-
මෙතම්ෆෙටමීන්	0.52	-	1.61	16.87	17.757	1.933	4.512
කංසා	5.41	1.42	8.83	3.96	1.576	4.021	4.351
හෙරොයින්	8.83	8.86	1.83	-	-	-	-
ඛාට්	-	32.00	199.64	73.50	31.16	-	-
ඩයස්පාම්	-	-	19.76	-	-	-	-

කංසා තෙල්	-	-	-	-	0.064	0.138	-



02 රූපය : පසුගිය වසර හය තුළ අත්අංගුවටගත් මත්ද්‍රව්‍ය පිළිබඳ සමස්ත සාරාංශය

2016 -2022 කාලය තුළ මත්ද්‍රව්‍ය වර්ගය අනුව අත්අඩංගුවට ගැනීම්.

කොකේන්



වසර	ප්‍රමාණය (කි.ග්‍රෑ)
2016	1232.04
2017	0
2018	2.38
2019	10.16
2020	0.08
2021	3.122
2022	11.318

2022 වසරේදී අත්අඩංගුවට ගැනීම් **07**ක් මගින් කොකේන් කි.ග්‍රෑ.**11.318**ක ප්‍රමාණයක් හසුකර ගැනීමට හැකිවිය.

2016 වර්ෂයේදී කොකේන් අත්අඩංගුවට ගැනීම් හදිසියේ ඉහළ යාමට හේතුව ලෙස හඳුනාගනු ලබන්නේ rip-on rip-off ජාවාරම් ක්‍රමය යොදා ගනිමින් ප්‍රතිනැවිගත කිරීමේ වරායන් හරහා කොකේන් විශාල ප්‍රමාණයන්ගෙන් ජාවාරම් කිරීමට තැත්

කිරීමයි; කෙසේවුවද, ප්‍රතිනැවතත කිරීමේ වරායන් ගෙන් ජාවාරම් සැඟවීමට ජාවාරම්කරුවන් අපොහොසත් වී තිබුණි. එබැවින්, ශ්‍රී ලංකා රේගුවට ඔවුන්ව අත්අඩංගුවට ගැනීමට හැකි විය.

හෙරොයින්



	ප්‍රමාණය (කි.ග්‍රෑ)
2016	8.83
2017	8.86
2018	1.83
2019	0
2020	0
2021	0
2022	0

2022 වර්ෂයේදී හෙරොයින් අත්අඩංගුවට ගැනීම් කිසිවක් වාර්තා නොවීය.

මෙතම්ෆෙටමීන්



වසර	ප්‍රමාණය (කි.ග්‍රෑ)
2016	0.52
2017	0
2018	1.61
2019	16.87
2020	17.76
2021	1.93
2022	4.512

2022 වර්ෂයේදී අත්අඩංගුවට ගැනීම් **21**ක් වාර්තා වූ අතර එම ප්‍රමාණය කි.ග්‍රෑ.**4.512**ක් විය.
ඒවා නෙදර්ලන්තය, කැනඩාව, මහා බ්‍රිතාන්‍යය හා මෙක්සිකෝව යන රට වලින් ගෙන්වනු ලැබීය .

කංසා



වසර	ප්‍රමාණය (කි.ග්‍රෑ)
2016	5.41
2017	1.42
2018	8.83
2019	3.96
2020	1.58
2021	4.02
2022	4.351

2022 වසරේදී කි.ග්‍රෑ.**4.351** කට අදාළ කංසා සම්බන්ධ සිද්ධීන් **39** ක් වාර්තා විය. ඒවා ප්‍රධාන වශයෙන්ම කැනඩාව සහ මහා බ්‍රිතාන්‍ය යන රටවලින් ගෙන එනු ලැබීය.

හෂීස්



වසර	ප්‍රමාණය (කි.ග්‍රෑ)
2016	0
2017	0.08
2018	15.74
2019	3.05
2020	0
2021	2.63
2022	0

2022 වර්ෂයේදී හෂීස් අත්අඩංගුවට ගැනීම් කිසිවක් වාර්තා නොවීය.

ඛාට්



වසර	ප්‍රමාණය (කි.ග්‍රෑ)
2016	0
2017	32
2018	199.64
2019	73.5
2020	31.16
2021	0
2022	0

2022 වර්ෂයේදී ඛාට් අත්අඩංගුවට ගැනීම් කිසිවක් වාර්තා නොවීය.

වගුව **02 : 2016** සිට **2022** දක්වා කාලසීමාවේදී ස්ථානය අනුව අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය

ස්ථානය	**2022 (කි.ග්‍රෑ)**	**2021 (කි.ග්‍රෑ)**	**2020 (කි.ග්‍රෑ)**	**2019 (කි.ග්‍රෑ)**	**2018 (කි.ග්‍රෑ)**	**2017 (කි.ග්‍රෑ)**	**2016 (කි.ග්‍රෑ)**	**Total (කි.ග්‍රෑ)**
බ.ජා.ගු	8.683	3.027	-	19.28	18.77	8.86	18.1	76.72
තැපැල්	10.757	-	39.19	83.76	222.8	33.5	0.52	390.527
ඩීඑච්එල්	-	2.234	0.24	2.44	-	-	-	4.914
යූපීඑස්	0.741	2.044	16.36	2.05	-	-	-	21.195
කලම්බු කාගෝ	-	4.583	3.35	-	-	-	-	7.933
නිවාරණ	-	-	-	0.01	-	-	-	0.01
ගුවන් භාණ්ඩ	-	-	-	-	8.22	-	-	8.22
ආර්සීටී	-	-	-	-	-	-	1228.18	1228.18
සීසීඊ	-	-	-	-	-	-	-	-
මීඩ්කෝ	-	-	0.55	-	-	-	-	0.55
එකතුව (කි.ග්‍රෑ)	**20.181**	**11.888**	**59.69**	**107.54**	**249.79**	**42.36**	**1246.8**	**1738.249**

2022 වර්ෂයෙහිදී සිදු කරන ලද ජාත්‍යන්තර මෙහෙයුම්

ලයන්ෆිෂ් (LIONFISH) මෙහෙයුම

- මත්ද්‍රව්‍ය හා නීතිවිරෝධී ද්‍රව්‍ය
- ජාත්‍යන්තර පොලිසිය(INTERPOL) මඟින් මෙහෙයවන ලදී.
- **2022** ජූලි මස පවත්වන ලදී.

නොක්අවුට් (KNOCKOUT) මෙහෙයුම

- නව මනෝවර්තක ද්‍රව්‍ය (NPS)
- INCB මඟින් මෙහෙයවන ලදී.
- 2022 දෙසැම්බර් මස පවත්වන ලදී.

වගුව **03: 2021** හා **2022** වසරවල සිදුකරන ලද අනාවරණය කිරීම් සන්සන්දනය

2021		**2022**
ප්‍රමාණය (ග්‍රෑ)		ප්‍රමාණය (ග්‍රෑ)
-	බාට්	-
4,021	කංසා	4,351
1,933	මෙතම්ෆෙටමීන්	4,512
-	හෙරොයින්	-
3,122	කොකේන්	11,318
2,634	හෂිස්	-
138	කංසා තෙල්	-
11,848	එකතුව	**20,181**

<u>මත්ද්‍රව්‍ය පාලන අංශය පිළිබඳ අපගේ ඇගයීම</u>

ශක්තීන් • කැපවීමෙන් ක්‍රියා කරන කාර්ය මණ්ඩලය • පළපුරුදු නිලධාරීන් • ශරීර පරිලෝකන)scan (යන්ත්‍රයක් පැවතීම. • සීසීටීවී අධීක්ෂණ පහසුකම් සහිත වීම.	දුර්වලතා • ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිකම • මත්ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා වැඩි දියුණු කළ පරීක්ෂණ කට්ටල සහ උපාංග නොමැති වීම. • මඟීන් ඉලක්ක කිරීම සහ ලුහුබැඳීම සඳහා උපකාරී වන අයුරින් සැකසූ දත්ත සමුදායක් නොමැති වීම.
අවස්ථාවන් • මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුකරනු ලබන නව මාර්ග සහ ක්‍රම හඳුනා ගැනීම • යම්තාක් දුරකට වෙනත් අදාල ආයතන සමඟ එක්ව වැඩ කිරීමට ලැබී ඇති අවස්ථාව	තර්ජන • විශ්ලේෂණ වාර්තා ලබා ගැනීම ප්‍රමාද වීම. • අන්තර් නියෝජ්‍යායතන සහයෝගීතාව නොමැතිකම • මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳ ජාත්‍යන්තර පුහුණු අවස්ථාවන් නොමැතිවීම

8.1.2.2 ජෛව විවිධත්ව සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය

පසුබිම

පාරිසරික අපරාධ යනු ස්වාභාවික ලෝකයට පමණක් නොව ජාතික හා ජාත්‍යන්තර ආරක්ෂාව, සමාජ හා ආර්ථික සංවර්ධනය සහ ගෝලීය සෞඛ්‍ය කෙරෙහි ද දැඩි අහිතකර බලපෑම් ඇති කරන බරපතල ගෝලීය ගැටලුවක් බවට පත්ව ඇත .විද්‍යාඥයින් විශ්වාස කරන අන්දමට පෘථිවිය මේ වන විට භයවන මහා නෂ්ටප්‍රාප්තියට මුහුණදෙමින් සිටින අතර හුදෙක් තනි සත්ව විශේෂයක, එනම් මිනිසාගේ ක්‍රියාකාරකම් හේතුකොට වඳවීම සිදු වන එකම අවස්ථාව ද එයයි .වර්තමානයේ 150,300 කට අධික වූ ජෛව විශේෂයන් සංඛ්‍යාවක් ස්වභාවික සම්පත් සංරක්ෂණය පිලිබඳ ජාත්‍යන්තර සංගමයේ) IUCN) රතු දත්ත ලේඛනයෙහි ලැයිස්තුගත කර ඇති අතර ඉන් 41% ක් උභය ජීවීන් ද , 37% ක් මෝරුන් ද 36 %ක් කොරල්පර ගොඩනගන්නා වූ ජීවීන් ද, 34% ක් කේතුධර ශාක ද, , 27%ක් ක්ෂීරපායින් ද 13% ක් කුරුළු විශේෂ ද වශයෙන් විශේෂ 42,100 කට අධික ප්‍රමාණයක් වඳවියාමේ තර්ජනයට ලක්ව ඇත .මේ අතර නීති විරෝධී වනජීවී වෙළඳාම, මෙම ජෛව විවිධත්ව සංහාරයට ප්‍රමුඛ දායකත්වයක් සපයයි .වාර්ෂික ඇස්තමේන්තුගත වටිනාකම ඇ.ඩො .බිලියන 23ක් පමණ වන නීතිවිරෝධී වනජීවී වෙළඳාම මත්ද්‍රව්‍ය ,ව්‍යාජානුකරණය සහ මිනිස් ජාවාරමට පසුව ලෝකයේ හතරවන සංවිධානාත්මක අපරාධය ලෙස හඳුනාගනු ලැබේ.

ඝර්ම කලාපයෙහි පිහිටා තිබීම හේතුවෙන් ජෛව විවිධත්වයෙන් අනූන රටක් වන ශ්‍රී ලංකාවේ මානව ක්‍රියාකාරිත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස ආවේනික සතුන් සහ ශාක විශේෂයන් වඳවියාමේ තර්ජනයකට ලක්ව ඇත .එමෙන්ම ,විවිධ ඛනිජ සම්පත් රාශියකින් ආඩ්‍ය වූ ශ්‍රී ලංකාවේ පිහිටි මෙම ඛනිජ ද්‍රව්‍ය අතුරෙන් සමහරක් ශ්‍රී ලංකාවටම සුවිශේෂී වන ලොව ඉහළම ගුණාත්මක බවකින් යුතු ඛනිජ ලෙස පිළිගැනේ .මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය කාලය මුළුල්ලේම මෙම සම්පත් ජාවාරම් කිරීමට ගත් නීති විරෝධී ප්‍රයත්න රැසක් වාර්තා වී තිබේ.

එපමණක් නොව ,සංස්කෘතික දේපළ මංකොල්ලය දේශ සීමා අතර සිදුවන ඉතා පැරණිතම සංවිධානාත්මක අපරාධයක් ලෙස පිළිගැනෙන අතර වර්තමානයේදී එවැනි අපරාධ ලොවපුරා ව්‍යාප්ත වූ සංසිද්ධියක් බවට පත්ව ඇත .ශ්‍රී ලංකා රේගුව විසින් අවධානයට ගෙන ඇති ප්‍රමුඛතා ලැයිස්තුවේ ද මෙය ඉහළින්ම පවතී. සංස්කෘතික දේපළ ජාවාරම මගින් ජාතික උරුමයන් ලෙස අතිශය වැදගත්කමක් උසුලන වටිනා සංස්කෘතික වස්තූන් ක්ෂය වී යාමත් ඒවා පිළිබඳ දැනුවත්වීමේ හෝ දැකබලා ගැනීමේ අවස්ථාව ක්‍රමයෙන් සමාජයට අහිමිව යාමටත් හේතු වේ .සෑම වසරකම කෞතුකාගාර ,දේවස්ථාන පෞද්ගලික කෞතුක භාණ්ඩ එකතූන් හා රජයේ ආයතන වලින් කෞතුක භාණ්ඩ දහස් සංඛ්‍යාවක් අතුරුදන් වේ .පෞරාණික ආයුධවල සිට සිතුවම් දක්වා, පැරණි කාසිවල සිට ඔරලෝසු දක්වා, ආගමික වටිනාකමකින් යුත් වස්තූන්ගේ සිට පුරාවිද්‍යාත්මක සොයාගැනීම් දක්වා, ලෝකයේ පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික උරුමයේ කොටසක් වන නිදර්ශක දස දහස් ගණනක් සොරාගනු ලැබේ .

දේශසීමා අතර සිදුවන මෙම නීති විරෝධී ක්‍රියාකාරකම් මැඩපැවැත්වීමේ අවශ්‍යතාවය අවබෝධ කරගනිමින් 1993වර්ෂයේදී මෙම ජෛව විවිධත්ව ,සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය ආරම්භ කරනු ලැබීය .එම අවධියේ දී ජෛව විවිධත්ව ආරක්ෂණ අංශය ලෙස හඳුන්වනු ලැබූ මෙම අංශය රේගු පරිපාලනයක් තුළ විශේෂිතව ස්ථාපිත කරනු ලැබූ ලොව ප්‍රථම රේගු ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය බවට විශ්වාස කෙරේ .එතැන් සිට මෙම ඒකකය ශ්‍රී ලංකාවේ මිල කළ නොහැකි වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව හා ශාක විශේෂ, ස්වාභාවික සම්පත් සහ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයමින් සිය කාර්යයන් ඉටු කිරීමෙහි නියැලී සිටී .තවද ,ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය (BCNP) මගින් ශ්‍රී ලංකා රේගුවෙහි සමාජ සහ පාරිසරික ආරක්ෂක ක්‍රමෝපායික අරමුණු කැපී පෙනෙන ලෙස ශක්තිමත් කෙරේ.

දැක්ම

ජෛව විවිධත්ව සහ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම පිළිබඳව කටයුතු කරන දකුණු ආසියාවේ විශිෂ්ටතම රේගු අංශය වීම.

මෙහෙවර

ජෛව විවිධත්ව ,සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂා කිරීම උදෙසා නීති බලාත්මක කිරීම සහ වෙළඳාම කෙරෙහි පහසුකම් සපයන අතර නියමිත ආදායම උත්පාදනය පිළිබඳව සහතික වීම .

ශාඛා ව්‍යුහය



පෛව විවිධත්ව ,සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය විසින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්

ශාක හා සත්ත්ව සහ ආශ්‍රිත නිෂ්පාදන එහා මෙහා රැගෙන යාමට අදාළව ජාතික සහ ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම.

- ඛනිජ ලවණ වැනි අනෙකුත් ස්වාභාවික සම්පත් එහා මෙහා රැගෙන යාමට අදාළව ජාතික නීති බලාත්මක කිරීම
- සංස්කෘතික දේපළ සහ කෞතුක භාණ්ඩ සංචලනය හා සම්බන්ධ ජාතික සහ ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම..
- බලපත්‍ර සහ අවසර පත්‍රයන්හි දක්වා ඇති කොන්දේසි වලට අනුකූල වන බවට සහතික වීම.
- පෛව විද්‍යාත්මක, ස්වභාවික සහ සංස්කෘතික වශයෙන් වැදගත් භාණ්ඩ දේශ සීමා අතර සංචලනය අධීක්ෂණය සහ නියාමනය සඳහා අදාළ පාලන පිළිවෙත් නීතිගත කිරීමේ දී විවිධ රේඛීය ආයතන වෙත ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් ලබාදීම.

මෙහෙයුම් ව්‍යුහය



2022 වසර සඳහා කාර්යසාධනය

- වර්ෂය තුළදී ජාවාරම් සහ අනුකූල නොවීමේ ප්‍රයත්නයන් **04** ක් මැඩපැවැත්වීමට BCNP කළමනාකරණය කරගෙන ඇත.



01 රූපය: **2022** වර්ෂයේදී විවිධ භාණ්ඩ වර්ග යටතේ BCNP විසින් සිදු කරන ලද අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව.

විස්තරය	සංඛ්‍යාව
ආරම්භකරන ලද සිද්ධි සංඛ්‍යාව	04 Nos.
සම්පූර්ණ කරන ලද සිද්ධි සංඛ්‍යාව	0 Nos.
දඩ හා රාජසන්තක කිරීම් මගින් අයකරගත් මුළු මුදල	Rs. 2,010,000
අයකරගත් අතිරේක සටහන්කර වල (A/E) එකතුව	-
විකිණීමෙන් ලද මුළු මුදල්	Rs. 5,536,999.80
2022 වසරේ අයකරගත් මුළු මුදල	Rs. 7,546,999.80

වගුව **01 : 2022** වසර සඳහා මුළු සිද්ධි සංඛ්‍යාලේඛණ

භාණ්ඩ වර්ගය	අත්අඩංගුවට ගත් මුළු ප්‍රමාණය
වල්ලපට්ටා	**කි.ග්‍රෑ.** 33.65
වල්ලපට්ටා තෙල්	**මි.ලී.**220
පැරණි කාසි	1880

වගුව **02 : 2022** වර්ෂයේ සැළකිය යුතු අනාවරණය කර ගැනීම්

1. අදාළ බලධාරීන්ගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව වල්ලපට්ටා **(*Gyriops walla*)** අපනයනය කිරීමට තැත් කිරීම.

නීතිවිරෝධී අයුරින් වල්ලපට්ටා (*Gyriops walla*) අපනයනය කිරීමට තැත්කිරීමක් **2022.03.22** දින BCNP විසින් අනාවරණය කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍රයක් සහිත මගියෙකු විසින් අදාළ බලධරයින්ගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව ශ්‍රී ලංකාවේ සිට ඩුබායි වෙත වල්ලපට්ටා (*Gyriops walla*) අපනයනය කිරීමට තැත් කිරීමක් පිළිබඳව තොරතුරු සහ බුද්ධි තොරතුරු මත පදනම්ව සොයා ගන්නා ලදී. වල්ලපට්ටා (*Gyriops walla*) දැව කැබලි සහිත බෑග් දෙකක් පරීක්ෂණය අතරතුරදී නිලධාරීන් විසින් සොයාගනු ලැබිණි. වල්ලපට්ටා (*Gyriops walla*) යනු ආවේණික ශාකයක් වන අතර එහි සුවඳ විලවුන්මය වටිනාකම ඉතා මැතකදී හඳුනා ගන්නා ලදී. සුවඳ විලවුන් නිපදවීමේදී භාවිතා කරනු ලබන වෙනත් රටවල ඉතා ඉහළ මිලක් සහිත රෙසීනමය ද්‍රව්‍යයක් (**දුම්මල**) ඒ මගින් නිපදවේ. වල්ලපට්ටා යනු වන නිෂ්පාදනයක් ලෙස සැළකෙන බැවින් අපනයනය තහනම් වේ. වන සංරක්ෂණ ආඥාපනත **(469** අධිකාරය) අනුව වල්ලපට්ටා *(Gyriops walla)* අපනයනය කිරීම/ රටෙන් බැහැරට ගෙන යාම සීමා කර ඇති අතර ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් අවසර පත්‍රයක් ලබා ගත යුතු වන නමුත් එවැනි කිසිදු අවසර පත්‍රයක් ඉදිරිපත් කිරීමට ඉහත සඳහන් මගියා අපොහොසත් වී ඇත. පුළුල්ව පරීක්ෂා කිරීමේදී වල්ලපට්ටා දැව (*Gyriops walla*) කැබලි **කි.ග්‍රෑ. 29.15** ක් සොයාගන්නා ලදී.



බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළින් සොයාගත් වල්ලපට්ටා *(Gyriops walla)*

2. ගුවන් භාණ්ඩ සත්‍යෝක්ෂණ පර්යන්තයේදී පෞරාණික කාසි පෙට්ටියක් අත්අඩංගුවට ගැනීම

ගුවන් භාණ්ඩ සත්‍යෝක්ෂණ පර්යන්තයේදී පෞරාණික කාසි පෙට්ටියක් හොර රහසේ රැගෙන යාමට ගත් ප්‍රයත්නයක් **2022.04.21** වන දින ජෙව විවිධත්ව ,සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය මගින් අනාවරණය කරගන්නා ලදී.

තොරතුරු මත පදනම්ව අනාවරණය කරගනු ලැබූයේ ‘‘කාසි’’ ලෙස ප්‍රකාශ කරන ලද කුරියර් පැකේජයක් අදාළ බලධරයින්ගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව ශ්‍රී ලංකාවේ සිට තායිවානය දක්වා අපනයනය කිරීමට අපනයනකරු උත්සාහ දරමින් සිටින බවයි. පරීක්ෂණ සිදුකිරීමේදී නිලධාරීන් විසින් සොයා ගන්නා ලද්දේ පැකේජය තුළ පෞරාණික කාසි අඩංගු වන බවයි. තවද, මෙම කාසි **2-5** ශත වර්ෂයන්ට අයත් රෝම කාසි බව පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මගින් සොයා ගෙන ඇත.
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව කෞතුක වස්තූන් අපනයනය කිරීම, **1940** අංක **09** දරණ පුරාවස්තු ආඥාපනත**(394** අධිකාරය**)** යටතේ වන උල්ලංඝනය කිරීමක් වන අතර එවැනි කිසිදු අවසර පත්‍රයක් ඉදිරිපත් කිරීමට ඉහත කී අපනයනකරු අපොහොසත් වී ඇත. පුළුල් පරීක්ෂණයේදී පෞරාණික කාසි **1880** ක් සොයාගන්නා ලදී.



ගුවන් භාණ්ඩ සත්‍යෝක්ෂණ පර්යන්තයේදී සොයාගන්නා ලද කාසි පෙට්ටිය

රැස්වීම් ,පුහුණු වැඩසටහන් ,වැඩමුළු ,දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අනෙකුත් සහයෝගීතාවයන්

මාසය	ක්‍රියාකාරකම
ජනවාරි	• සූත්‍ර සංග්‍රහ කමිටු රැස්වීම- ආයුර්වේද දෙපාර්තමේන්තුව

පෙබරවාරි	• ජෛව සංරක්ෂණය පිළිබඳ Cartagena ප්‍රොටොකෝලයට අනුව ජාතික ජෛව සංරක්ෂණ රාමුවෙහි 5 වන ව්‍යාපෘති කමිටු රැස්වීම ක්‍රියාත්මක කිරීම
මාර්තු	• සංස්කෘතික වස්තූන් ජාවාරම් කිරීමට සහ මංකොල්ලකෑමට එරෙහි උපත්‍රම
අප්‍රේල්	• සහකාර රේගු අධිකාරීවරුන් සඳහා PR ආශ්‍රිත පුහුණුව • රේගු පරීක්ෂකවරුන් සඳහා ධාරිතා සංවර්ධනය
මැයි	• වන ජීවී අපරාධ වලට එරෙහි වීම පිළිබඳ ශ්‍රී ලංකා ජාතික පුහුණුව
සැප්තැම්බර්	• පරිසර අමාත්‍යාංශය විසින් පවත්වන ලද ඕසෝන් විද්‍යාව පිළිබඳ පුහුණුව • වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද කලාපීය මෝර හා මඩු විශේෂ පිළිබඳ වැඩමුළුව • පරිසර අමාත්‍යාංශය මගින් පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන • ධීවර අංශයේ අපරාධ පිළිබඳ ජාතික වැඩමුළුව-ශ්‍රී ලංකාව සඳහා වන නීල පරිසර ව්‍යාපෘතිය
ඔක්තෝබර්	• මුහුදු කැකිරි ජලජීවී වගාව සඳහා වන තාක්ෂණික සහාය සහ ක්ෂය වූ වන සම්පත් සකස් කිරීම, නැවත පිරවීම සහ කළමනාකරණය පිළිබඳ ආරම්භක වැඩමුළුව
නොවැම්බර්	• සුදුසුකම්ලත් කාන්තාවන් සඳහා වන කලාපීය රැස්වීම – කලාපීය සහයෝගීතාවය දිරිමත් කිරීම සඳහා වන ධීවර අපරාධ නීති බලාත්මක කිරීමේ නිලධාරීන් • රසායනික, ජෛව විද්‍යාත්මක සහ පුපුරණශීලී සමුද්‍රීය දූරස්ථ දැනුවත් කිරීමේ පුහුණුව • අන්තරායකර රෝග පිළිබඳ කාරක ජාතික ඉන්වෙන්ට්‍රියක් සකස් කිරීම පිළිබඳ වැඩසටහන(NIDP)- ශ්‍රී ලංකාව • රජය අංශයේ නිලධාරීන් සඳහාවන ධාරිතා සංවර්ධන වැඩසටහන- නීතිවිරෝධී තටයුතු පිළිබඳ එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහනේ දූෂණ විරෝධී නවෝත්පාදනය

8.1.2.3 පාරිභෝගික හා සමාජ ආරක්ෂණ අංශය

රටේ දැනට පවතින නියෝගයන්ට හා ප්‍රමිතීන්ට අනුව ආනයන භාණ්ඩයන්හි තත්වය හා ප්‍රමිතිය පාලනය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ අරමුණ ඇතිව 2011 වසරේ දී පාරිභෝගික හා සමාජ ආරක්ෂණ අංශය ස්ථාපිත කරන ලදී. පාරිභෝගික හා සමාජ ආරක්ෂණ අංශ, ආනයන හා අපනයන භාණ්ඩ වලට අදාළ බුද්ධිමය දේපළ හිමිකම් (IPR) සඳහා ශ්‍රී ලංකා රේගුවේ නාභීය ලක්ෂය වේ. වෙනත් අදාළ ආයතන සමග සහයෝගීතාවය ඇතිව ජාත්‍යන්තර සම්මුතීන්ට අදාළ බැඳීම් බලාත්මක කිරීම හරහා පරිසරය සුරැකීමට ද අප දායක වේ.

ප්‍රධාන කාර්ය භාරයන්

1. යම් උල්ලංඝනයවීම් හෝ වංචා වළක්වා ගැනීම පිණිස බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පනත (IPR) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (SLS), ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත, පාරිභෝගික කටයුතු අධිකාරි පනත (CAA), මධ්‍යම පරිසර අධිකාරිය පරමාණුක ,බලශක්ති අධිකාරී පනත, සෞඛ්‍යය දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක අමාත්‍යාංශය නියම කර ඇති රේගුවට සම්බන්ධ නීතිවල අවශ්‍යතාවයන් බලාත්මක කිරීම. එම ආයතන හා අණ පනත්වල අධිකාරි බලයෙන් ආවරණය වන සියළුම ආනයන රේගුවෙන් නිදහස් කර ගැනීමට පෙර පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය (CPU) වෙත යොමු කළ යුතු වේ.
2. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය (CPU) විසින් ඉහත බලාධිකාරීන් සම්බන්ධයෙන් අනුමැතිය ලබාදීම් පිළිබඳව ලේඛනයක් පවත්වා ගෙන යනුලැබේ.
3. අදාළ අධිකාරීන් සම්බන්ධ ඉහත විෂයන් පිළිබඳ රේගු ක්‍රියාපරිපාටීන් යාවත්කාලීන කිරීම.
4. අවශ්‍ය අවස්ථාවලදී පරීක්ෂණ අංගන වෙත පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශයෙහි (CPU) කාර්ය මණ්ඩලය යොමු කිරීම.
5. රේගු ආඥාපනත යටතේ වූ රෙගුලාසි සහ හඳුනාගනු ලැබ ඇති ඒහා සම්බන්ධ අනෙකුත් නීතිරීති සමාලෝචනය කිරීම.
6. ඉහත කාර්යයන් හා සම්බන්ධ අනෙකුත් පනත් සහ ආඥාවන් සමඟ කියවිය යුතු රේගු ආඥාපනත ප්‍රකාරව නීති බලාත්මක කිරීම.
7. ප්‍රතික්ෂේප කරන ලද භාණ්ඩ සහ උපද්‍රව සහිත අනෙකුත් ආනයනයන් ප්‍රතිඅපනයනය අධීක්ෂණය කිරීම.
8. ඉහත විෂයන් පිළිබඳ ජාතික සහ අන්තර්ජාතික සම්මේලනවලදී ශ්‍රී ලංකා රේගුව නියෝජනය කිරීම.
9. බුද්ධිමය දේපළ හිමිකම් හා පාරිසරික කරුණු සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම.
10. විෂය කරුණු සම්බන්ධයෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
11. ජාතික හා ජාත්‍යන්තර මෙහෙයුම්වලදී WCO, INTERPOL, EUROPOL හා මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සම්බන්ධීකරණය කිරීම.

ප්‍රධාන කාර්යය- 01: බුද්ධිමය දේපළ හිමිකම් (IPR) යටතේ ගැනෙන වෙළඳ භාණ්ඩ වලට අදාල රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම			
ප්‍රධාන පියවර	ඉලක්කය	තත්‍ය	ලඟාකර නොගත්තේ නම්, හේතුව
(1) ලියාපදිංචි වෙළඳ සන්නාම ලබාගැනීම; (ශ්‍රී ලංකාවේ තහනම් කරන ලද ආනයන;) සහ බුද්ධිමය දේපළ හිමිකම් යටතේ ගැනෙන වෙළඳ භාණ්ඩ වලට අදාල බලාත්මක කිරීමේ නියෝගයන්හි සඵලතාව වැඩිකිරීම සඳහා සියළුම රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදාහැරීම.	100%	100%	
(2) බුද්ධිමය දේපළ හිමිකම් යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අදාළ රෙගුලාසි සහ නියමයන් සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.	100%	100%	
(3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත අංක (2) හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම.	100%	100%	
(4)) රේගු ක්‍රියා පටිපාටීන් පිළිබඳ හිමිකම් දරන්නන්ගේ දැනුම වැඩි කිරීම	100%	100%	

ප්‍රධාන කාර්යය - **02:** **ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)** යටතේ ගැනෙන වෙළඳ භාණ්ඩවලට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.			
ප්‍රධාන පියවර	ඉලක්කය	තත්‍ය	ලභාකර නොගත්තේ නම්, හේතුව
1) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ; ආනයනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකයක් අවශ්‍ය වන; ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් අවශ්‍ය වන; නිල භාණ්ඩ ලැයිස්තුවක් ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි ගත කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදාහැරීම	100%	100%	
(2)ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රතික්ෂේපිත ආනයනයට අදාළ රෙගුලාසි සහ අවශ්‍යතා සම්බන්ධයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සකස් කරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.	100%	100%	
(3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත අංක **(2)** හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම.	100%	100%	
(4) පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම හා වෙළඳාම පහසුකරලීම සඳහා නව රෙගුලාසි සැකසීම	100%	100%	

ප්‍රධාන කාර්යය - **03:** බුද්ධිමය දේපළ නීති **(IP Law)** බලාත්මක කිරීම			
ප්‍රධාන පියවර	ඉලක්කය	තත්‍ය	ලභාකර නොගත්තේ නම්, හේතුව
(1) බුද්ධිමය දේපළ අයිතියට අදාළ නීති බලාත්මක කිරීම පිළිබඳ රේගු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	100%	100%	
(2) බුද්ධිමය දේපළ හිමිකම් උල්ලංඝනය කරමින් ආනයනය කර ඇති බවට සැක කෙරෙන භාණ්ඩ රඳවා ගැනීම.	100%	100%	
(3) රේගු ආඥා පනතේ **125 (අ)** හා **125 (ආ)** වගන්ති වලට අනුකූලව **"ක්‍රියාකිරීම සඳහා යෙදවීම"** සම්බන්ධයෙන් කටයුතු කිරීම.	100%	100%	
(4) බුද්ධිමය දේපළ හිමිකම් උල්ලංඝනය කිරීම් හසුකර ගැනීම් වාර්තා කිරීම.	100%	100%	
(5) WCO හා **RILO** වෙත කාලීනව ප්‍රතිපල වාර්තා කිරීම	100%	100%	

ප්‍රධාන කාර්යය - **04:** මොන්ට්‍රියල් සම්මුතිය මගින් ආවරණය කරනු ලබන ඕසෝන් ස්ථරයට හානිවිය හැකි ද්‍රව්‍ය ආනයනය කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේදී ඵලදායීබව ඉහළ නැංවීම			
ප්‍රධාන පියවර	ඉලක්කය	තත්‍ය	ලභාකර නොගත්තේ නම්, හේතුව
(1) ජාතික ඔසෝන් ඒකකයේ, පරිසර අමාත්‍යාංශයේ පූර්ව ලියාපදිංචි සහආනයන කිරීමට පෙර ආනයන බලපත්‍රයක් අවශ්‍යවන භාණ්ඩ පිළිබඳ නිල ලැයිස්තුවක් ලබා ගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන්ට සහ බලාත්මක කරන නිලධාරීන්ට එම තොරතුරු බෙදා හැරීම	100%	100%	
(2). වඩා හොඳ අනුකූලතාවක්/ බලාත්මක කිරීමක් සඳහා ඕසෝන් ස්ථරයට හානිකර ද්‍රව්‍ය සහ ඉහත **(2)**හි සඳහන් ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතා පිළිබඳව රේගු සටහන්කර සකස් කරන හා බලාත්මක කරන නිලධාරීන්ට දැනුම ලබාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.	100%	100%	

(3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත අංක **(2)** හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාර්ෂික නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම			
(4) ඉල්ලීම් වලට අනුව ඕසෝන් ස්ථරයට හානිවන ද්‍රව්‍ය ආනයන පිළිබඳ දත්ත ජාතික ඕසෝන් ඒකකයට ලබාදීම	100% 100%	100% 100%	
(5) යම් සැක සහිත භාණ්ඩ තොග විස්තර ලබාගැනීම හා ඉලක්ක කිරීම	100%	100%	

ප්‍රධාන කාර්යය - **05:** බාසල් ප්‍රඥප්තිය මගින් ආවරණය වන හානිකර අපද්‍රව්‍ය දේශ සීමා හරහා සංක්‍රමණයවීමට අදාළ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම.			
ප්‍රධාන පියවර	ඉලක්කය	තත්‍ය	ලභාකර නොගත්තේ නම්, හේතුව
(1) බේසල් සම්මුතියෙහි ඇමුණුම් **I** සහ ඇමුණුම් **III** යටතට ඇතුලත්; ශ්‍රී ලංකාව තුළට අපනයන කිරීම තහනම් කරන ලද අනෙකුත් හානිකර භාණ්ඩ; ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වන්නාවූ භාණ්ඩවල නිල ලයිස්තුවක් ලබාගැනීම හා එම දත්ත රේගු ප්‍රකාශන ක්‍රියාවලිය සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන්ට ලබාදීම	100%	100%	
(2) රජයේ අනෙකුත් නියෝජිතායතනයන්ගේ සහාය ඇතිව වඩාත් උචිත අනුගතවීමේ ක්‍රියාමාර්ග ගැනීම බලාත්මක කිරීම සඳහා, බාසල් ප්‍රඥප්තිය යටතේ සඳහන් වන හානිකර අපද්‍රව්‍ය; • ශ්‍රී ලංකාව තුළට ආනයන කිරීම තහනම් කරන ලද අනෙකුත් හානිකර භාණ්ඩ; • ආනයනය කිරීමට පෙර ආනයන පාලන බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය වන්නාවූ පරිසරයට සංවේදී අනෙකුත් භාණ්ඩ; ආනයනය කරන ලද හානිකර භාණ්ඩ තොග හඳුනාගත් අවස්ථාවකදී අනුගමනය කළ යුතු ආරක්ෂිත ක්‍රියාමාර්ග සහ එවැනි අවස්ථාවකදී ගත යුතු අනුමත කළ ක්‍රියාමාර්ග අනුගතකර ගැනීම සඳහා රේගු ප්‍රකාශන සකස් කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම;	100%	100%	
(3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත අංක **(2)** හි සඳහන් අවශ්‍යතාවන් ඇතුළත් කරමින් වාර්ෂික නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම	100%	100%	
(5) යම් සැක සහිත භාණ්ඩ තොග විස්තර ලබාගැනීම හා ඉලක්ක කිරීම.	100%	100%	

ප්‍රධාන කාර්යය - **06:** ස්ටොක්හෝම් සම්මුතිය මගින් ආවරණය වන දිගුකල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය ආනයන කිරීමට අදාළ රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම.			
ප්‍රධාන පියවර	ඉලක්කය	තත්‍ය	ලභාකර නොගත්තේ නම්, හේතුව
(1) ස්ටොක්හෝම් සම්මුතියේ ඇමුණුම් අ, ආ, සහ ඇ හි ලැයිස්තු ගත කර ඇති;	100%	100%	
• ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද;			
• දිගු කල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම තොරතුරු බෙදා හැරීම.			
(2) දිගු කල් පවතින කාබනික දූෂක ද්‍රව්‍ය පිළිබඳව සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.	100%	100%	
(3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත අංක **(2)**හි සඳහන් අවශ්‍යතාවන් ඇතුළත් කරමින් වාර්ෂික නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩිදියුණු කිරීම	100%	100%	
(4) යම් සැක සහිත භාණ්ඩ තොග විස්තර ලබාගැනීම හා ඉලක්ක කිරීම.	100%	100%	

ප්‍රධාන කාර්යය - **07:** රොටර්ඩෑම් සම්මුතිය මගින් ආවරණය වන පූර්ව දැනුම්දීමේ අනුමැතිය **(PIC)** ක්‍රියාවලිය බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.			
ප්‍රධාන පියවර	ඉලක්කය	තත්‍ය	ලඟාකර නොගත්තේ නම්, හේතුව
(1) රොටර්ඩෑම් සම්මුතිය තුළ ආවරණය කරනු ලැබූ;	100%	100%	
• ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීම තහනම් කරන ලද;			
• පළිබෝධනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා **(ROP)** යටතේ පූර්ව ලියාපදිංචිය අවශ්‍ය වන්නාවූ			
ආනයනය කිරීමට පෙර පළිබෝධනාශක පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයාගේ නිර්දේශය මත නිකුත් කරනු ලැබූ ආනයන බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ; අන්තරායදායක රසායන සහ කෘමිනාශක පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම තොරතුරු බෙදා හැරීම			
(2) පළිබෝධනාශක ආනයනය සම්බන්ධ රෙගුලාසි සහ අවශ්‍යතා පිළිබඳව සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදුකරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.	100%	100%	
(3) වඩාත් හොඳ ස්වේච්ඡා අනුකූලවීම් සඳහා ඉහක අංක **(2)** හි සඳහන් අවශ්‍යතාවයන් ඇතුලත් කරමින් වාප්පු නිෂ්කාශණ නියෝජිතයින්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම.	100%	100%	

ප්‍රධාන කාර්යය - **08:** රසායනික අවි සම්මුතිය **(CWC)** යටතේ ගැනෙන භාණ්ඩ වලට අදාල නියෝග බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම **(**රසායන අවි වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය,තොග රැස්කිරීම තහනම් කිරීම සහ ඒවා විනාශකිරීම පිළිබඳ සම්මුතිය**)**			
ප්‍රධාන පියවර	ඉලක්කය	තත්‍ය	ලඟාකර නොගත්තේ නම්, හේතුව
(1) රසායනික අවි ප්‍රඥප්තිය;	100%	100%	
• ශ්‍රී ලංකාව තුළ ආනයනය තහනම් කරන ලද;			
• ආනයනය කිරීමට පෙර ආනයන බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය කරන;			
• රසායනික පිළිබඳ නිල ලැයිස්තු ලබාගැනීම සහ සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදු කරන නිලධාරීන් සහ බලාත්මක කරන නිලධාරීන් වෙත එම තොරතුරු බෙදා හැරීම			
(2) හානිකර රසායන ද්‍රව්‍ය සම්බන්ධ රෙගුලාසි සහ අවශ්‍යතා පිළිබඳව සියළුම රේගු ප්‍රකාශන ක්‍රියාවලි සිදුකරන නිලධාරී සහ බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම.	100%	100%	
(3) වඩාත් හොඳ ස්වෙච්ඡා අනුකූලවීම සඳහා ඉහත අංක හි සඳහන් **(2)** අවශ්‍යතාවයන් ඇතුළත් කරමින් වාප්පු නිෂ්කාශන නියෝජිතයන්ගේ පුහුණු විෂය මාලාව වැඩි දියුණු කිරීම.	100%	100%	
(4) යම් සැක සහිත භාණ්ඩ තොග විස්තර ලබාගැනීම හා ඉලක්ක කිරීම.	100%	100%	

ප්‍රධාන කාර්යය – **09** අනෙකුත් පාර්ශවකරුවන් සහ රජයේ ආයතන සමඟ සම්බන්ධීකරණය ඉහළ නැංවීම			
ප්‍රධාන පියවර	ඉලක්කය	තත්‍ය	ලඟාකර නොගත්තේ නම්, හේතුව
(1) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය හා කෘෂිකර්ම අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය සමග රැස්වීම් සංවිධානය කිරීම	100%	100%	
(2) පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.	100%	100%	
(3) පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ ක්‍රියාකාරකම්හි නියුතු වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ මෙහෙයුම් සංවිධානය කිරීම.	100%	100%	

(4) ජනමාධ්‍ය හරහා පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම .	100%	100%	
(5) WCO, WIPO, INTERPOL, EUROPOL, USPTO,UNODC හා UNEP වැනි අන්තර්ජාතික සංවිධාන සමග සහයෝගිතාවය පවත්වා ගැනීම	100%	100%	

ප්‍රධාන කාර්යය –10 ධාරිතා සංවර්ධන වැඩසටහන			
ප්‍රධාන පියවර	ඉලක්කය	තත්‍ය	ලඟාකර නොගත්තේ නම්, හේතුව
(1) වැඩමුළු, පුහුණු හා සම්මන්ත්‍රණ (විදේශීය/දේශීය) සඳහා නිලධාරීන් නම් කිරීම	100%	100%	
(2) රේගු කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම	100%	100%	
(3) පාරිභෝගික ආරක්ෂාව සහ පරිසර ආරක්ෂණ කටයුතු වලදී ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා නිලධාරීන් දිරිමත් කිරීම	100%	100%	
(4) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ අනෙකුත් අදාළ නියෝජ්‍යායතනවලට විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කිරීම	100%	100%	

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට(SLSI) අදාළ සිද්ධි

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනට අදාලව ලියාපදිංචි වූ මුළු සිද්ධි සංඛ්‍යාව	31
ප්‍රමිති ආයතනයට අදාල සිද්ධීන් වෙනුවෙන් පැනවූ මුළු දඩ ප්‍රමාණය (.රු)	Rs.33,797,000
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ මුළු සිද්ධි සංඛ්‍යාව	(Annex I & II)

බුද්ධිමය දේපළ නිමිකම් (IPR)වලට අදාල සිද්ධි

බුද්ධිමය දේපළ නිමිකම් වලට අදාල ලියාපදිංචිවූ මුළු සිද්ධි සංඛ්‍යාව	10
ලියාපදිංචිවූ බුද්ධිමය දේපළ නිමිකම් සිද්ධි මගින් අය කරගත් මුළු දඩ මුදල් (රු)	Rs.20,510,000.00

පාරිසරික ආරක්ෂණයට අදාල සිද්ධි

ලියාපදිංචිවූ මුළු සිද්ධි සංඛ්‍යාව	0
සිද්ධි සඳහා පනවන ලද මුළු දඩ මුදල් (රු)	-
ප්‍රති අපනයනය කරන ලද මුළු ප්‍රමාණය	-



ඇමුණුම **I**

වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රතික්ෂේපිත භාණ්ඩ 2021

අනු අංකය.	විස්තරය	ප්‍රමාණය
1	13A සොකට්	කැලි 7528
2	AC කට්ටල	කැලි 2
3	ඇඩප්ටර්	කැලි 12000
4	බැටරි	කැලි 223020
5	බයිසිකල් ටයර්	කැලි 600
6	බයිසිකල් ටියුබ්	කැලි 600
7	ටින් වාළු	කාටූන15712
8	සෙරමික් භාණ්ඩ	කැලි 20492
9	කම්බි දැල්	පැකේජ 300
10	ක්ලෝඩම් බීම	කාටූන 96
11	කොන්ඩියුට් බට	කැලි 6500
12	කෝඩියල්	කාටූන 50
13	කෘඩ් පොල් තෙල්	මේ.ටෝ. 249.14
14	සේදුම්කාරක කුඩු	කාටූන 40
15	එල් බෝ සවිකිරීම්	කාටූන 8
16	විදුලි කේතල	කැලි 4156
17	ශක්තිජනක බීම	කාටූන 2730
18	විදුලි පංකා	69825
19	ජීන්ජර් ඒල්	කාටූන 138
20	එල්පී ගෑස් බට	රෝල් 847
21	විදුලි උඳුන්	කාටූන 13121
22	අයිස් ක්‍රීම්	පැකේජ 130
23	එල් පී ගෑස් රෙගියුලේටර	කැලි 13008
24	එල්ඊඩී බල්බ්	කැලි 1000
25	මයිල්ඩ් ස්ටීල් ඇන්ගල් අයන්	කැලි 853
26	පැස්ටා	කාටූන 750
27	පවර් වයර්	ඒකක15040
28	විදුලි පේනු සහ සොකට්	කැලි 27640
29	පීවීසී පයිප්ප	රෝල් 775
30	පෝසිලේන් භාණ්ඩ	කාටූන 2096
31	ආර්සීසීබී	කැලි 620
32	රතු පරිප්පු	බෑග් 1000
33	රිඩ්යුසින් ටී	කැලි 840
34	ස්පාර්ක්ලින් ජූස්	කාටූන 1300
35	සෝයා සෝස්	කාටූන 290
36	සෝයා සෝස්	බෝතල් 1170
37	සීනි	බෑග් 4320
38	ටොනික් ජලය	කාටූන 116
39	තක්කාලි සෝස්	කාටූන 100
40	දත් බෙහෙත්	අයිතම 360
41	කහ අල	කි.ග්‍රෑ.13464
42	යුනිවර්සල් ඇඩැප්ටර්	කැලි 250
43	බිත්ති ස්විච	කැලි 11700
44	යුනිවර්සල් ස්විච් සොකට්	කැලි 230
45	U-PVC සවිකිරීම	කැලි 20004
46	U-PVC සවිකිරීම්	කාටූන 93
47	උණුවතුර බෝතල්	කැලි 13380
48	උණුවතුර බෝතල්	කාටූන 100

ඇමුණුම **II**

වසරේදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රතික්ෂේප කරන ලද භාණ්ඩ 2022

අනු අංකය.	විස්තරය	ප්‍රමාණය
1	සපත්තු	ජෝඩු 680
2	පර්ස්	කැලි 800
3	බේබි වෝකර්	කැලි 42
4	R/C සෙල්ලම් බඩු	කැලි 4500
5	සෙල්ලම් බඩු	කැලි 2696
6	එයාර් පොඩ්ස්	කැලි 119
7	හිස් පෙට්ටි	කැලි 100
8	හෑන්ඩ්ස් ෆ්‍රී	කැලි 10790
9	දුරකථන බැටරි	කැලි 3725
10	දුරකථන කේබල්	කැලි 486
11	දුරකථන චාර්ජර්	කැලි 3150
12	දුරකථන කවර	කැලි 2750
13	දුරකථන ආවරණ	කැලි 765
14	වතුර බෝතල්	කැලි 576
15	කොණ්ඩය කපන උපකරණ	කැලි 3600
16	LED බල්බ්	10000
17	පර්ස්	කැලි 232
18	ලිහිසි තෙල්	කෑන්401
19	ඔයිල් ෆිල්ටර්	කැලි 100
20	එයාර් ෆිල්ටර්	කැලි 936

8.1.2.4 වරාය පාලන ඒකකය

හැඳින්වීම

දේශ සීමා හරහා සිදුවන අපරාධ මැඩපැවැත්වීමේ අදහසින් මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධාන කාර්යාලයේ (UNODC) /ලෝක රේගු සංවිධානයේ (WCO) බහාළුම් පාලන වැඩසටහන (CCP) යටතේ ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකය (PCU) පිහිටුවා ඇත.වර්තමානයේ මෙම ඒකකය සමාජ ආරක්ෂණ අංශයේ විෂය පථය යටතේ පවතී. එමෙන්ම මෙම ඒකකය මගින් මෙහෙයුම්කරුවන්/නැව් තොග වාර්තාකරුවන්ගෙන් භාණ්ඩ පිළිබඳ වැදගත් තොරතුරු ලබාගන්නා අතර ගුවන් යානා මෙහෙයුම්කරුවන්ගෙන් මගීන් පිළිබඳ තොරතුරු ලබාගෙන අවදානම් විශ්ලේෂණය පාදක විමර්ශනයන් සිදුකර ඒ අනුව සුදුසු පියවර ගැනීමට අපේක්ෂා කෙරේ. වරාය පාලන ඒකකය මගින් ගුවන් සමාගම් මෙහෙයුම්කරුවන්ගෙන් ගුවන් භාණ්ඩ පිළිබඳ වැදගත් තොරතුරු ද ලබාගනු ලැබේ.

මෙම අංශයේ කාර්යයන්;

අ. සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා සැක සහිත භාණ්ඩ තොග අධීක්ෂනය කිරීම පිණිස ගුවන් හා මුහුදු මාර්ගයෙන් ප්‍රවාහනය කරන භාණ්ඩ සඳහා උසස් විද්‍යුත් ලේඛණ ලබා ගැනීම හා ක්‍රමවත් කිරීම.

ආ. විද්‍යුත් ලේඛණ භාවිතයෙන් බහාළුම්ගත භාණ්ඩ හා වෙනත් භාණ්ඩ තොග හඳුනා ගැනීම හා වරාය පාලන ඒකකයේ ඇති මෙවලම් මගින් ඒවා විශ්ලේෂණය කිරීම හා සැක සහිත භාණ්ඩ තොග සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

ඇ. ලෝක රේගු සංවිධානය (WCO) විසින් ලබා දී ඇති භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය (CTS) අධීක්ෂණය කිරීම හා නඩත්තු කිරීම.

ඈ. වෙනත් ජාත්‍යන්තර හා දේශීය නියෝජිතායතන සමග සහයෝගීතාව ගොඩනගා ගැනීම

ඒකකයේ ඇති මෙවලම්

භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය

World Customs Organization
Cargo Targeting System (CTS)

ආසිකුඩා පද්ධතිය



CEN සහ nCEN

CEN
WCO-OMD

Containercomm



ඒකකයේ වෙනත් කාර්යයන්

- නාවික නියෝජිතයින් විසින් අතිකාල ගෙවීම් එකතු කිරීම අධීක්ෂණය කිරීම.
- නාවික නියෝජිතයින් විසින් නාවික ලේඛන ඉදිරිපත් කිරීම අධීක්ෂණය කිරීම, භාණ්ඩ එහා මෙහා ගෙන යාමඅධීක්ෂණය කිරීම සඳහා නියෝජිතයින් සහ ගුවන් සමාගම් නියෝජිතයින් ඉදිරිපත් කිරීම
- ශ්‍රී ලංකාව තුළට හා පිටතට ගෙන එන සහ ගෙන යන මුහුදෙන් ප්‍රවාහනය කරන භාණ්ඩ, ගුවන් භාණ්ඩ සහ මගී ගමන් මළු අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම, රඳවා ගැනීම සහ විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධාන කාර්යාලය (UNODC) සහ ලෝක රේගු සංවිධානය (WCO) මගින් ආරම්භ කරන ලද බහාලුම් පාලන වැඩසටහන සක්‍රීය කිරීම සහ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධාන කාර්යාලය (UNODC) සහ ලෝක රේගු සංවිධානය (WCO) සමඟ සම්බන්ධීකරණය කිරීම.
- භාණ්ඩ ඉලක්ක කිරීමේ පද්ධතිය (CTS) සහ ආසිකුඩා (ASYCUDA) වැඩසටහන් භාවිතා කිරීම සහ දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කිරීම සඳහා සහ අනෙකුත් ඒකක විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථා වලදී ද Hazmat , fiber scope කැමරා, සහ රසායනික පර්යේෂණ කට්ටල සහ TruNarc වැනි ස්කෑන් උපකරණ ක්‍රියාත්මක කිරීම.

Hazmat



TruNarc





- ලොව පුරා බහාලුම් ගමනාගමනය නියාමනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ නිරතව සිටින අදාළ ජාතික සහ ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සහයෝගීතාවයට පහසුකම් සැලසීම.
- රේගු විෂය පථයට අයත්වන නීති විරෝධී භාණ්ඩ, සොර බඩු, මත්ද්‍රව්‍ය, අන්තර්ජාතික අපරාධ ලුහුබැඳීම, රඳවා ගැනීම සහ තහනම් කිරීම සහ රේගු ආඥා පනත සහ අනෙකුත් අදාළ නීති අනුව එකී ආනයනයන්, අපනයනයන්, මගී භාණ්ඩ, පාර්සල් හෝ

ප්‍රතිනැවිගත කිරීමේ භාණ්ඩ නැවැත්වීම, රඳවාගැනීම, පරීක්ෂණ කිරීම සහ විමර්ශනය කිරීම සඳහා මත්ද්‍රව්‍ය ඒකකය, සමාජ ආරක්ෂණ ඒකකය, අවදානම් කළමනාකරණ ඒකකය සහ නිවාරණ ඒකක සමග පරීක්ෂණ කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

1. කාර්යසාධනය පිළිබඳ සාරාංශය

අ. වාර්ෂික සාරාංශය

අනු අංකය	විස්තරය	අයකරගත් ප්‍රමාණය (රු)
1	**2022** වර්ෂය සඳහා ලිහිල් කරන ලද මුළු රාජසන්තක කිරීම්	199,386,140.00
4	2022 යාත්‍රා අතිකාල අයකර ගැනීම්	68,155,877.00
එකතුව		**267,542,017.00**

ආ.සිද්ධිවල තත්වය හා අයකර ගැනීම්

මාසය	ආරම්භ කරනලද සිද්ධි සංඛ්‍යාව	නිම කරනලද සිද්ධි සංඛ්‍යාව	අයකරගත් මුළු ප්‍රමාණය (රු.)
ජනවාරි	3	5	26,516,000.00
පෙබරවාරි	1	3	150,000.00
මාර්තු	8	7	17,150,000.00
අප්‍රේල්	6	3	7,820,000.00
මැයි	2	5	12,800,000.00
ජූනි	3	3	40,000,000.00
ජූලි	2	3	14,000,000.00
අගෝස්තු	1	1	100,140.00
සැප්තැම්බර්	1	1	4,100,000.00
ඔක්තෝබර්	6	1	56,250,000.00
නොවැම්බර්	2	1	5,500,000.00
දෙසැම්බර්	1	0	15,000,000.00
මුළු එකතුව	**36**	**33**	**199,386,140.00**

ඇ. යාත්‍රා අතිකාල අයකර ගැනීම්

මාසය	අයකරගත් මුදල (රු.)	යාත්‍රා සංඛ්‍යාව
ජනවාරි	8,589,950.00	272
පෙබරවාරි	5,372,575.00	272
මාර්තු	5,514,865.00	322
අප්‍රේල්	6,966,057.00	292
මැයි	2,999,736.00	273
ජූනි	8,187,637.00	284
ජූලි	8,978,710.00	274
අගෝස්තු	8,434,062.00	290
සැප්තැම්බර්	5,645,220.00	283
ඔක්තෝබර්	3,807,483.00	312
නොවැම්බර්	2,575,990.00	323
දෙසැම්බර්	10,897,234.00	321
මුළු එකතුව	77,969,519.00	3518

ඇ. **2022** වසර තුළ සිදුකළ වැදගත් අත්අඩංගුවට ගැනීම්

භාණ්ඩ වර්ගය	අත්අඩංගුවට ගත් මුළු ප්‍රමාණය	ඒකක
කොකේන්	355.881	කි.ග්‍රෑ

ෆෙරස් කැබලි Ferrous Scrap	74,881	කි.ග්‍රෑ

2022 සඳහා එකඟවූ සැලසුමට සාපේක්ෂව අත්කරගත් ජයග්‍රහණයන් සංසන්දනය

<u>අ. ආදායම් අරමුණු යටතේ මූලික ක්‍රියාකාරකම්</u>

මූලික ක්‍රියාකාරකම් අංක **01:** සැක කටයුතු නැව් භාණ්ඩ පිළිබඳව නීතිය ක්‍රියාත්මක කිරීම හා අදාල පාර්ශව සඳහා දණ්ඩන නියම කිරීම.



මූලික ක්‍රියාකාරකම් අංක **02:** ඒකාබද්ධ ගාස්තු අයකර ගැනීම්

වරාය පාලන ඒකකය මගින් සාමාන්‍ය නැව් බඩු ප්‍රවාහන යාත්‍රා හා බහාලුම් ප්‍රවාහන යාත්‍රා සඳහා අතිකාල ගාස්තු අයකර ගැනීමේ ක්‍රියාවලිය වඩාත් පහසුකිරීම සඳහා ස්වයංක්‍රීයකරණය කිරීම සමගින් නව ක්‍රමවේදයන් හා ක්‍රියාවලීන් හඳුන්වාදෙනු ලැබීය.



<u>ආ. පාලන අරමුණු යටතේ මූලික ක්‍රියාකාරකම්</u>

i. මත්ද්‍රව්‍ය හා දේශසීමා අතර වෙනත් අපරාධ පාලනය කිරීම සඳහා බහාලුම් පාලන වැඩසටහන (CCP) ක්‍රියාත්මක කිරීම.

මෙම අංශය විසින් පාලන අරමුණු යටතේ පහත දැක්වෙන මූලික කාර්යයන් සිදුකරනු ලැබීය .

- "CENCOMM" යන ගෝලීයව ක්‍රියාත්මක සන්නිවේදන ආරක්ෂක පද්ධතිය පවත්වාගෙන යනු ලැබේ .
- මත්ද්‍රව්‍ය හා දේශ සීමා අතර අපරාධ පිළිබඳව නවතම දැනුම ලබා ගැනීම සඳහා Aircargocomm හා Conatinercomm ක්ෂණික දැනුම්දීම් ලබාගනු ලැබීය.
- UNSCR ක්ෂණික දැනුම්දීම් ලැබුණු අතර CTS හරහා විශ්ලේෂණය කරනු ලැබීය.

ii. අවදානම විශ්ලේෂණය හා දේශසීමා අතර මත්ද්‍රව්‍ය හා වෙනත් අපරාධ තක්සේරු කිරීම.

අවදානම් විශ්ලේෂණය වරාය පාලන ඒකකය විසින් අබණ්ඩව සිදුකරන ක්‍රියාවලියකි. අවදානම් සාධකයන්හි සඵලතාව විශ්ලේෂණය කිරීම හා නිර්ණය කිරීම, රේගුවට අයත් ප්‍රදේශ තුළ ආවේක්ෂණ චාරිකා හා සැකසහිත ක්‍රියාකාරකම් පිළිබඳ සාධක හඳුනා ගැනීම, ජාතීන් අතර අපරාධ හා සම්බන්ධ අවදානම් විශ්ලේෂණය මෙම ක්‍රියාවලියට ඇතුලත්වේ.

iii. අනනුකූල නාවුක සමාගම්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම.

විද්‍යුත් මාර්ගයෙන් ලේඛන ඉදිරිපත් කිරීමේදී (e - manifest) නෛතික විධිවිධාන නියාමනය කරන ලෙස නාවුක සමාගම් නියෝජිතයින්ට දැනුම්දෙනු ලැබිය.

ඇ. වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ අරමුණු යටතේ ප්‍රධාන ක්‍රියාකාරකම්

නීතිවිරෝධී වෙළඳාම හඳුනාගැනීම සඳහා අවදානම් සාධක විශ්ලේෂණය කරන ලද අතර ඔවුන් නව ප්‍රකාශයන් කරනවිට ස්වයංක්‍රීයව දැනුම්දීම් උත්පාදනය කිරීම සඳහා ලේඛණ පිළියෙල කරනු ලැබේ.

ඇ. විද්‍යුත් නෞභාර ලේඛනය (CTS / ASYCUDA) ප්‍රවර්ධනය කිරීම

නෞභාර ලේඛන ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කරන ලෙස නාවුක සමාගම් නියෝජිතයන්ට දැනුම්දෙනු ලැබූ අතර ඉදිරිපත් කරනු ලැබූ ලේඛන දැන් ලෝක රේගු සංවිධානය (WCO) හා මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධාන කාර්යාලයේ (UNODC) සහය ඇතිව නැව් භාණ්ඩ ඉලක්කගත කිරීමේ පද්ධතියේ)CTS යෙදවුම් මගින් ග්‍රහණය කරගනු ලැබේ (.

ඉ. නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය

1. වරාය පාලන ඒකකයට අනුයුක්ත නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම සඳහා UNODC - WCO බහාළුම් පාලන වැඩසටහන යටතේ වන දකුණු ආසියාවේ සහ ගිනිකොණදිග ආසියාවේ ධීවර අංශයේ අපරාධ පිළිබඳ වැඩසටහන පවත්වන ලදී. ධීවර අපරාධ යනු නීති විරෝධී මසුන් මැරීම, කූට ලේඛන, මත්ද්‍රව්‍ය ජාවාරම සහ මුදල් විශුද්ධිකරණය ඇතුළු ධීවර අංශයේ නීති විරෝධී ක්‍රියාකාරකම් රැසක් පිළිබඳව සඳහන් වන වැරදි සහගත ලෙස අර්ථ නිරූපණය කර ඇති සංකල්පයකි. ඒ මගින් මත්ස්‍ය ගහණය අඩු කරන අතර කලාපයේ මානව සහ ආර්ථික ආරක්ෂාව හීන කරවයි. ධීවර අපරාධ මැඩලීම සඳහා මාලදිවයිනේ සහ ශ්‍රී ලංකාවේ නාවුක නීති බලාත්මක කිරීමේ ප්‍රයත්නයන්ට සහාය දැක්වීම උපදේශන වැඩමුළුව මගින් අපේක්ෂා කෙරේ. උපදේශන වැඩමුළුවේ අරමුණ වනුයේ නාවුක නීති බලාත්මක කිරීමේ අංශයේ/අංශය සඳහා සේවය කරන ශ්‍රී ලංකාවේ නිලධාරීන්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීමයි. මෙම වැඩමුළුව,අතිරේක ධාරිතා වර්ධන පියවරයන් සහිතව අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණය දිරිමත් කිරීමට සහ දැනටමත් ශ්‍රී ලංකාවේ කොළඹ ක්‍රියාත්මක වන UNODC-WCO බහාලුම් පාලන වැඩසටහන (CCP) වරාය පාලන ඒකක වෙත සහාය වීමට යොමු වී ඇත.



2 අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ වලට එරෙහිව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වරාය සහ ගුවන් තොටුපළයන්හි තිරසර බලාත්මක ව්‍යුහයක් ලෙස UNODC - WCO බහාලුම් පාලන වැඩසටහන. මෙම ඒකකය මගින් ජාතික තර්ජනයන් තක්සේරු කිරීම සහ එවාට එරෙහිව පියවර ගැනීම පමණක් සිදු නොකරන අතර ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධයන්හි ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස පැනනැගෙන කලාපීය සහ ගෝලීය තර්ජන මැඩපැවැත්වීමට ද වැදගත් වේ. මෙම බලාත්මක කිරීමේ ක්‍රියාවන්හි කාර්යක්ෂමතාවය සම සඵලදායීබව වැඩිකරන අතරම පවත්නා සම්පත් වල ප්‍රශස්ත භාවිතය සහතික කරනු ලබන ආකාර වනුයේ අවදානම් පැහැකඩ සහ ඉලක්ක කිරීම බව අවිවාදිත කරුණකි.

3. අනෙකුත් ජාත්‍යන්තර සහ දේශීය නියෝජිතායතන සමග සහයෝගීතාවය ගොඩනංවා ගැනීම





4 . තායිලන්තයේ බැංකොක් හි පැවති ‘‘කාන්තා නායකත්වය ශක්තිමත් කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රධාන ප්‍රවාහ ගතකිරීම’’ ස්ත්‍රී පුරුෂ භාවය සහ නායකත්වය සවිබල ගැන්වීමේ වැඩසටහන. මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධාන කාර්යාලය (UNODC)- ලෝක රේගු සංවිධානය (WCO) වරාය පාලන වැඩසටහන (CCP) මගින් මාලදිවයිනේ සහ ශ්‍රී ලංකාවේ කාන්තා නිලධාරිනියන් සඳහා ස්ත්‍රී පුරුෂ/ නායකත්ව වැඩමුළුවක් පවත්වන ලදී. මෙම රැස්වීම, ධීවර අපරාධ මැඩලීමේ නාවුක නීති බලාත්මක කිරීමේ ප්‍රයත්නයන්ට සහාය වීම සඳහාවන නෝර්වීජියානු ආධාර ලබන ‘Blue Enforcement ’ ව්‍යාපෘතියේ වැදගත් කොටසකි.





5 . UNODC-WCO බහාලුම් පාලන වැඩසටහන (CCP); TruNarc මත්ද්‍රව්‍ය විශ්ලේෂකය භාවිතය පිළිබඳ සහ ‘පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE)’ පිළිබඳ පුහුණුව. UNODC- ලෝක රේගු සංවිධානය (WCO) බහාලුම් පාලන වැඩසටහන (CCP) පිළිබඳව මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධාන කාර්යාලය (UNODC) ප්‍රශංසා කරන ලදී. රැකියා ස්ථානයේදී බරපතල තුවාල සහ රෝගී තත්ත්වයන් ඇතිකරන උවදුරුවලට නිරාවරණය වීම අවම කිරීමට මත්ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා TruNarc මත්ද්‍රව්‍ය විශ්ලේෂකය/ Raman වර්ණාවලිමානය සහ පුද්ගලික ආරක්ෂක උපකරණ භාවිතය පිළිබඳව දින හතරක ඒකාබද්ධ ප්‍රායෝගික පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී. අමෙරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව මගින් මේ සඳහා කාරුණික සහාය ලබාදෙන ලදී.ඔස්ට්‍රියාවේ වියනා (වියානා ජාත්‍යන්තර මධ්‍යස්ථානය- VIC) හි මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධාන කාර්යාලයේ (UNODC) විද්‍යාගාර සහ විද්‍යාත්මක අංශයේ පරිශ්‍රෙය්දී පුහුණු වැඩමුළුව පිළිවෙලින් ක්‍රියාත්මක කරන ලදී.





කැපී පෙනෙන ජයග්‍රහණ

අ. කොකේන් කි.ග්‍රෑ. 355.81 ක් අත්අඩංගුවට ගන්නා ලදී.





ආ. දැව අතර සඟවන ලද මත්ද්‍රව්‍ය– අසත්‍ය අනතුරු ඇඟවීම





ඇ. දොඩම් ගෙඩි තුළ සඟවන ලද මත්ද්‍රව්‍ය- අසත්‍ය අනතුරු ඇඟවීම





8.1.3 මධ්‍යම බුද්ධි අංශය

හැඳින්වීම

මධ්‍යම බුද්ධි අංශයේ වගකීම වනුයේ ආදායම් අහිමිකර ගැනීමකින් හෝ සමාජ ආරක්ෂණ අරමුණු වලට හානියක් නොවන අයුරින් අවශ්‍ය වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සඳහා වන දෙපාර්තමේන්තුවේ අරමුණු ළඟාකර ගැනීම පිණිස මෙහෙයුම් ඒකක සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සඳහා වඩාත් ඵලදායි ,කාලානුරූපී හා නිවරදි ලෙස අදාල බුද්ධි තොරතුරු සැපයීමවේ .

මෙම අංශයේ මූලික පරමාර්ථ වන්නේ:

- ✓ අවශ්‍ය බුද්ධිමය තොරතුරු සැපයීම මගින් ඉහලම මට්ටමේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහයවීම.
- ✓ භාණ්ඩ හා මගී නිෂ්කාශණයේදී බුද්ධිමය තොරතුරු මත පදනම් පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අවධාරණය කිරීම.
- ✓ දේශසීමා අතර භාණ්ඩ හුවමාරුවේදී ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.
- ✓ ජාතික සම්බන්ධතා මධ්‍යස්ථානය (NCP) ලෙස හා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධි තොරතුරු හුවමාරු කරගැනීමේ කේන්ද්‍රීය ලක්ෂ්‍යය ලෙස කටයුතු කිරීම සහ නීතිය බලාත්මක කිරීම සඳහා සහාය ලබාදීම.

අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ:

- i. තොරතුරු එක්රැස් කිරීම.
- ii. පැය ***24*** පුරා ක්‍රියාත්මක මහජන තොරතුරු ලබාගැනීමේ ඒකකය (PIRD) පවත්වා ගෙන යාම සහ කළමනාකරණය කිරීම
- iii. බුද්ධි තොරතුරු විශ්ලේෂණය කිරීම හා වැඩිදියුණු කිරීම
- iv. දේශීය වශයෙන් අංශ අතරත් ජාත්‍යන්තර වශයෙන් අනුමත නම් කරන ලද ආයතන සමගත් බුද්ධි තොරතුරු බෙදා හැරීම
- v. ජාත්‍යන්තර රේගු තොරතුරු පද්ධති සමග සම්බන්ධීකරණය කිරීම.
- vi. ආසියා ශාන්තිකර කලාපයේ බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ කාර්යාලයේ (RILO A/P) කලාපීය ජාතික සම්බන්ධීකරන මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීම හා ජාත්‍යන්තර බලාත්මක කිරීමේ සම්බන්ධීකරණයේ "කේන්ද්‍රස්ථානය" ලෙස කටයුතු කිරීම.
- vii. කොළඹ වරායේ බහාලුම් ආරක්ෂක ආරම්භක ව්‍යාපෘතිය (CSI) , CSI කාර්යාලය, පරිලෝකන ඒකකය හා අදාළ පර්යන්ත මෙහෙයුම්කරුවන් සමග සම්බන්ධීකරණය කිරීම.
- viii. බුද්ධි තොරතුරු පාදක කරලෙන නැව් බඩු ලේඛන සමාලෝචනය මගින් අධි අවදානම් භාණ්ඩ තොග හසුකර ගැනීම හා විමර්ශන සිදු කිරීම.
- ix. රේගු පරීක්ෂණ සිදුකිරීම හා වැරදිකරුවන්ට එරෙහිව නඩු පැවරීම
- x. පෙර වැරදිකරුවන්ගේ දත්ත පද්ධතිය (POD)පවත්වාගෙන යාම
- xi. ජාතික රේගු බලාත්මක කිරීමේ ජාලයේ (nCEN) දත්ත පද්ධතිය පවත්වාගෙන යාම
- xii. ශ්‍රී ලංකා රේගුව, තවත් බුද්ධිමය අධිකාරයන් 09 කින් සමන්විතව අලුතින් පිහිටුවන ලද දේශ සීමා අවදානම් තක්සේරු මධ්‍යස්ථානයේ (BRAC) පාර්ශවයකි.

2022 වසරේ කාර්යසාධනය

වගුව 1: ලබාගත් හා බෙදාහරිනු ලැබූ තොරතුරු

	2019	2020	2021	2022
PIRD හරහා ලබාගත් තොරතුරු සංඛ්‍යාව	73	50	43	36
වෙනත් මූලාශ්‍ර මගින් (ෆැක්ස්, විද්‍යුත් තැපැල්, ලිපි, ප්‍රවෘත්ති)	21	11	42	21
එකතුව	**94**	**61**	**85**	**57**
අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා වෙනත් අංශ වෙත හුවමාරු කරනලද බුද්ධි තොරතුරු සංඛ්‍යාව	84	53	84	57

වගුව 2: බෙදාහරින ලද බුද්ධි අනතුරු ඇඟවීම් සංඛ්‍යාව:

	2019	2020	2021	2022
RILO/ WCO CEN අනතුරු ඇඟවීම්	01	-	14	04

වගුව 3: වෙනත් අංශ වෙත හුවමාරු කරන ලද පෙර වැරදි විස්තර සංඛ්‍යාව:

	2019	2020	2021	2022
පෙර වැරදි විස්තර වාර්තා සංඛ්‍යාව	108	166	106	104

වගුව 4: රේගු අනු නියෝජිතයින් හා වැටිබඳු ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව

	2019	2020	2021	2022
රේගු මූලස්ථාන අනු නියෝජිත බලපත්‍ර අලුත්කිරීම	6626	6866	6386	6367

ශ්‍රීලංවඅ වාප්පු බලපත්‍ර **(A Pass)**	2356	1418	1508	1545

වගුව **5:** බහාළුම් ආරක්ෂක ආරම්භක **(CSI)** වැඩසටහන යටතේ පරිලෝකනය කරන ලද බහාළුම් සංඛ්‍යාව

		2019	**2020**	**2021**	**2022**
මුළු බහාළුම් සංඛ්‍යාව		385	215	373	418

වගුව **6:** දේශීය හා විදේශීය විමර්ශන හා බුද්ධි නියෝජිතායතන සමග සම්බන්ධීකරණය කිරීම**:**

නියෝජිතායතනය		යවන ලද ඉල්ලීම් සංඛ්‍යාව			ලැබූ පිළිතුරු සංඛ්‍යාව			
	2019	**2020**	**2021**	**2022**	**2019**	**2020**	**2021**	**2022**
DRI- ඉන්දියා	29	08	10	26	08	-	01	10
RILO සහ වෙනත් නියෝජිතායතන	15	14	16	13	01	03	09	-

වගුව **7: nCEN** දත්ත සමුදාය

		2019	**2020**	**2021**	**2022**
තහවුරු කරනලද සිද්ධි සංඛ්‍යාව		1,704	1,301	1,225	850

වගුව **8:** නීතිය බලාත්මක කිරීමේ කාර්යසාධනය

		2019	**2020**	**2021**	**2022**
වසර තුළ ආරම්භ කරනලද/ අනාවරණය කරගනු ලැබූ සිද්ධි සංඛ්‍යාව		05	20	12	27
වසර තුළ නිමකරන ලද සිද්ධි සංඛ්‍යාව		11	22	10	11
අයකරගනු ලැබූ මුළු එකතුව (රු.)		16,569,279	6,884,723	15,655,090	62,812,600

2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධනය

<u>ජයග්‍රහණයන්</u>

1. හොරබඩු ජාවාරම් මැඩලීම සහ නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සඳහා දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්වය සහ සියලු මෙහෙයුම් මට්ටම් සඳහා බුද්ධි තොරතුරු සැපයීම

- අ. ක්‍රමානුකූල බුද්ධි තොරතුරු විශ්ලේෂණය පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීම
- ආ. එක්රැස් කරන ලද තොරතුරු මඟින් බුද්ධි තොරතුරු විශ්ලේෂණය
- ඇ. බුද්ධි තොරතුරු වාර්තා සහ අනතුරු ඇඟවීම් සකස් කිරීම
- ඈ. සියලු අදාළ මට්ටමේ නිලධාරීන් සඳහා බුද්ධි තොරතුරු ලබාදීම
- ඉ. ඉල්ලීම් කරන ලද පරිදි පෙර වැරදි වාර්තා ලබාදීම

2. දේශසීමා අතර ආරක්ෂාව තහවුරු කිරීම සහ භාණ්ඩ හා මගී සංචලනයට අදාල වෙනත් අනුකූල ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ජාතික සහ ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධීකරණය සිදුකිරීම

- අ. ජාතික සම්බන්ධතා මධ්‍යස්ථානය **(NCP)** ලෙස ලෝක රේගු සංවිධානය, කලාපීය බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ කාරයාලය**(RILO),** ඉන්දීය ආදායම් බුද්ධි තොරතුරු අංශය **(DRI India)** සහ වෙනත් ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගීතාව ඇතිකර ගැනීම.
- ආ. ලෝක රේගු සංවිධානයේ, කලාපීය බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ කාර්යාලයේ**(RILO),** මෙහෙයුම සඳහා ඵලදායී ලෙස සහභාගී වීම
- ඇ. තොරතුරු බෙදාගැනීම සඳහා දේශීය ආයතන සමග සන්නිවේදනය සිදු කිරීම (ශ්‍රී ලංකා මහ බැංකුව, **PNB ,** ආගමන හා විගමන දෙපාර්තමේන්තුව ආදිය.
- ඈ. බහාලුම් ආරක්ෂක ආරම්භක ව්‍යාපෘති කාර්යාලය **(CSi Office),** බහාලුම් පරිලොකන ඒකකය හා අදාල පර්යන්ත මෙහෙයුම්කරුවන් සමග බහාලුම් ආරක්ෂක ආරම්භක ව්‍යාපෘතියට අදාළ පරීක්ෂා කිරීම් සිදුකිරීම.

3. බුද්ධි තොරතුරු වල නිරවද්‍යභාවය සහ තොරතුරු රැස්කිරීමේ කාර්යක්ෂමතාවට වැඩිකිරීම හා ඒවා ආරක්ෂා කිරීම.

- අ. පැය **24** පුරා ක්‍රියාත්මක මහජන තොරතුරු ලබාගැනීමේ ඒකකය **(PIRD)** හා එම වාර්තා ඵලදායී ලෙස පවත්වාගෙන යාම
- ආ. පෙර වැරදි දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම
- ඇ. ඵලදායී ලෙස **nCEN** සහ එහි පරිශීලකයන් පවත්වගෙන යාම
- ඈ. **nCEN** ට ඇතුළත් වූ හසුකරගැනීම් සිද්ධි කාලීනව හා ඵලදායෘ ලෙස තහවුරු කිරීම
- ඉ. නිලධාරීන් සඳහා **nCEN** පුහුණු වැඩසටහන් පැවැත්වීම

8.1.4 මධ්‍යම විමර්ශන අංශය

හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුවේ පරමාර්ථයන් ප්‍රකාරව අනෙකුත් මෙහෙයුම් අංශ මගින් හසුකරගනු ලබන රේගු නීති සහ වෙනත් අදාල නීති උල්ලංඝනය කිරීම පිළිබඳ විමර්ශන කටයුතු සිදුකිරීම මධ්‍යම විමර්ශන අංශයේ වගකීම වේ . මධ්‍යම සිද්ධි ලේඛනය **(CCR)** පවත්වාගෙන යාම ද එහි වගකීමකි.

මූලික පරමාර්ථ

- සියළුම රේගු විමර්ශන මධ්‍යගත කිරීම සහ වෘත්තීය මට්ටමින් ඒවා විමර්ශනය කිරීම
- මධ්‍ය සිද්ධි ලේඛනය වඩාත් කාර්යක්ෂම සහ ඵලදායි ලෙස පවත්වාගෙන යාම
- ත්‍යාග බෙදා දීම මධ්‍යගත කිරීම සහ ඒ පිළිබඳ විනිවිදභාවයෙන් කටයුතු කිරීම.

ප්‍රධාන කාර්යයන්

- අනෙකුත් අංශ (විශේෂ කාර්යසාධන බලකාය හා සුපරික්ෂා සහ නිවාරණ අංශ හැර) මගින් හසුකරගන්නා සිද්ධින් විමර්ශනය කිරීම.
- රේගු උල්ලංඝනය කිරීම් පිළිබඳ අනාවරණය සහ විමර්ශනය කිරීම .
- මධ්‍යම සිද්ධි ලේඛනය (CCR) පවත්වාගෙන යාම .
- විශේෂ කාර්ය සාධන බලකාය හා සුපරික්ෂණ හා නිවාරණ අංශ මගින් සිදුකරනු ලබන විමර්ශනවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
- මධ්‍යම සිද්ධි ලේඛනයේ අවසන් කරනු ලැබ ඇති සිද්ධි යාවත්කාලීන කිරීම .
- දෙපාර්තමේන්තුව තුල අවසන් කරන ලද සියළුම සිද්ධිවල ත්‍යාග මුදල් බෙදාහැරීම.

කාර්යසාධනය

2022 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද සමස්ත සිද්ධි සංඛ්‍යාව සහ වර්තමාන තත්වය

මාසය	ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව	අවසන් කරන ලද	පරීක්ෂණ අදියරෙහි	ලැබීමට නියමිත අයකර ගැනීම්	මධ්‍යම අපහරණ අංශය වෙත යොමු කරන ලද	අවසන් නොකළ විමර්ශන
ජනවාරි	6	5	1			0
පෙබරවාරි	13	11	1			1
මාර්තු	12	7	1	2	1	1
අප්‍රේල්	7	7				0
මැයි	2	1	1			0
ජුනි	4	2	1			1
ජුලි	0	0				0
අගෝස්තු	4	0				4
සැප්තැම්බර්	4	4				0
ඔක්තොබර්	2	0		1	1	0
නොවැම්බර්	1	0				1

දෙසැම්බර්	0	0				0
එකතුව	**55**	**37**	**5**	**3**	**2**	**8**



2022 වර්ෂය තුළ ලියාපදංචි කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව

(මාසය අනුව)

මාසය	ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව
ජනවාරි	6
පෙබරවාරි	13
මාර්තු	12
අප්‍රේල්	7
මැයි	2
ජූනි	4
ජූලි	0
අගෝස්තු	4
සැප්තැම්බර්	4
ඔක්තොබර්	2
නොවැම්බර්	1
දෙසැම්බර්	0
එකතුව	**55**



2015-2022 කාලසීමාව තුළ ලියාපදිංචි කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව සහ වර්තමාන තත්ත්වය

වර්ෂය	2015	2016	2017	2018	2019	2020	2021	2022	Total
ලියාපදිංචි කළ මුළු සිද්ධි	577	329	420	290	383	342	86	55	2,482
දණ්ඩන සහිතව අවසන් කළ	50	140	205	106	215	120	47	32	915
NFA ලෙස අවසන් කරන ලද	252	117	150	121	109	62	8	5	824
ලියාපදිංචි කරන ලද (විමර්ශන, පරීක්ෂණ, අපහරණ, නඩු ආදී)	272	71	64	61	57	157	30	18	730



2015-2022 කාල සීමාව තුළ මධ්‍යම සිද්ධි ලේඛනයේ ලියාපදිංචි කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව

වර්ෂය	සිද්ධි සංඛ්‍යාව
2015	5,916
2016	4,682
2017	5,464
2018	3,055
2019	3,505
2020	3,303
2021	2,627

2022	2,199



2022 වර්ෂයේ මුළු අයකරගැනීම්

මාසය	මුළු අයකර ගැනීම් (රු.)
ජනවාරි	80,334,526
පෙබරවාරි	65,670,000
මාර්තු	59,724,532
අප්‍රේල්	57,535,000
මැයි	18,200,000
ජුනි	7,850,000
ජුලි	5,900,000
අගෝස්තු	38,550,000
සැප්තැම්බර්	29,301,511
ඔක්තොබර්	181,200,000
නොවැම්බර්	20,500,000
දෙසැම්බර්	213,010,614
එකතුව	**777,776,183**



2018-2022 කාල සීමාව තුළ මුළු අයකර ගැනීම්

වර්ෂය	මුළු අයකර ගැනීම් (රු.)
2018	225,522,861
2019	374,818,935
2020	207,607,101
2021	370,750,707
2022	777,776,183



2022.12.31 දිනට මධ්‍යම බුද්ධි අංශයට ලබාදුන් බැංකු ඇපකර සංඛ්‍යාව

මුළු බැංකු ඇපකර සංඛ්‍යාව	44

බැංකු ඇපකරවල මුළු වටිනාකම	469,141,220

බැංකු ඇපකර **44** කින් පහත බැංකු ඇපකර සඳහා අධිකරණයේ නඩු පවතී.

අධිකරණයේ නඩු පවතින බැංකු ඇපකර සංඛ්‍යාව	4
අධිකරණයේ නඩු පවතින බැංකු ඇපකර වල වටිනාකම	285,021,414

8.1.5 නීති කටයුතු අංශය

නීති කටයුතු අංශය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නීති උපදේශකවරයා ලෙස කටයුතු කරන අතර අධිකරණ නඩු හා සම්බන්ධ පරිපාලනය හා අධීක්ෂණය සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ ඒ සම්බන්ධයෙන් ලිපි ගනුදෙනු පවත්වා ගැනීම අංශයේ වගකීම වේ.මෙම අංශයේ ප්‍රධාන අරමුණු වනුයේ රේගු දෙපාර්තමේන්තුවට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා දීම, සියලු නඩු කටයුතුවලට සහභාගී වීම, දෙපාර්තමේන්තුව නීතියේ රාමුව තුළ ඵලදායී හා කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බවට සහතික වීමයි.

මෙම අංශය අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන අතර සහාය කාර්ය මණ්ඩලය එක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, රේගු අධිකාරීවරුන් දෙදෙනෙකු, සහකාර රේගු අධිකාරීවරුන් හය (6) දෙනෙකු ,එක් රේගු පරීක්ෂක වරයෙකු සහ එක් රේගු නියාමකවරයෙකුගෙන් සමන්විතය.

ප්‍රධාන කාර්යයන්

- සහාය අවශ්‍ය නීතිමය ගැටළු සම්බන්ධයෙන් නිලධාරීන්ට උපදෙස් දීම.
- දෙපාර්තමේන්තු මට්ටමින් විසඳිය නොහැකි ඇතැම් කරුණු පිළිබඳව නීතිපතිගෙන් උපදෙස් ලබා ගැනීම.
- දෙපාර්තමේන්තුවේ අනෙකුත් නිලධාරීන් වෙත නෛතික උපදෙස් ලබාදීමේදී නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

2022 ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ අයදුම්පත්

2022වසරේ ලියාපදිංචිවූ නඩු සංඛ්‍යාව	**42**
ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත්	4
අභියාචනාධිකරණ අයදුම්පත්	23
දිසා අධිකරණ අයදුම්පත්	11
මහාධිකරණ අයදුම්පත්	4

2022 වසරේ සිට ක්‍රියාකරන නඩු	**47**

2022 වසරේදී නිමකරන ලද අයදුම්පත්	**03**

ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත්	2
අභියාචනාධිකරණ අයදුම්පත්	1

වෙනත් නෛතික කරුණු

ලබාදෙන ලද අභ්‍යන්තර නෛතික උපදෙස්	71
සහය ලබාදෙන ලද ජාත්‍යන්තර ගිවිසුම් සංඛ්‍යාව	2
සහය ලබාදෙන ලද දේශීය ගිවිසුම් සංඛ්‍යාව	6
නීතිපති දෙපාර්තමේන්තුව මගින් ඉල්ලාසිටි නෛතික උපදෙස් සංඛ්‍යාව	15
නීතිපති දෙපාර්තමේන්තුව මගින් ලබාගත් නෛතික උපදෙස් සංඛ්‍යාව	10
සහය ලබාදෙන ලද මහාධිකරණ/දිස්ත්‍රික් අධිකරණ /මහේස්ත්‍රාත් අධිකරණ අයදුම්පත් සංඛ්‍යාව	8
නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සහභාගිවූ සාකච්ඡා සංඛ්‍යාව	87

8.1.6 අවදානම් කළමනාකරණ අංශය

ලෝක රේගු සංවිධානයේ SAFE රාමුවට අනුගත වීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා රේගුව මගින් අවදානම් කළමනාකරණ ඒකකය පිහිටුවන ලදී. ඒකකයේ හැකියාවන් අවසානයේදී පුළුල් කිරීමේ සහ ඵලදායී අවදානම් කළමනාකරණ ඉලක්ක සඵල කිරීමේ අරමුණ ඇතිව පසුව **2021** වර්ෂයේදී ඒකකය, අවදානම් කළමනාකරණ අංශය ලෙස අංශයක් බවට පත් කරන ලදී.

ශ්‍රී ලංකා රේගුවේ බලාත්මක කිරීමේ සහ පහසුකම් සැලසීමේ සංකල්ප තුලනය කිරීම සඳහා අවදානම් කළමනාකරණ මූලධර්ම මත පදනම්වූ ක්‍රියාමාර්ග යෝජනා කිරීම, හඳුන්වා දීම සහ අදාළ කිරීම අවදානම් කළමනාකරණ අංශය මගින් සහතික කරයි. නවීන රේගු මෙවලමක් ලෙස අවදානම් කළමනාකරණය භාවිතා කිරීමේ අනාගත වාසි සාක්ෂාත් කර ගැනීම සඳහා අවදානම් කළමනාකරණ මූලධර්මයන් සම්බන්ධ පුහුණු නිලධාරින්ගෙන් සමන්විත වන අතර ජාත්‍යන්තර රේගු ආයතන වල භාවිත වන හොඳම භාවිතාවන් අදාළ කර ගනී.

පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි වැඩි දියුණු කිරීම මගින් දෙපාර්තමේන්තුමය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දැන් අවදානම් කළමනාකරණ අංශය අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යයේනිරත වී සිටී. මෙම ඉලක්කය වඩා හොඳින් සපුරා ගැනීම සඳහා ඒකකයේ මෙහෙයුම් කටයුතු ක්ෂේත්‍ර හතරකට වර්ග කර ඇත;

1. භාණ්ඩ වරණීයතාව
2. ක්‍රියාවලි ප්‍රතිව්‍යුහගත කිරීම
3.බලයලත් ආර්ථික මෙහෙයුම්කරුවන්
4. විමර්ශන

අවදානම් කළමනාකරණ අංශයේ මෙහෙයුම් හා පරිපාලන කටයුතු පහත සංවිධාන ව්‍යුහයට අනුව සිදු කරනු ලැබේ.



1. භාණ්ඩ වරණීයතාව

අවදානම් පාදක භාණ්ඩ නිෂ්කාශණ ක්‍රියාවලිය ප්‍රමුඛතාගත කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදීම පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව (IBRD), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (IBRD සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) යන ජාත්‍යන්තර දායක නියෝජිතයන හතර ශ්‍රී ලංකාවට පැමිණ තිබුණි.

දෙපාර්තමේන්තුව තුළ දැනට පවතින අවදානම් කළමනාකරණ පද්ධතිය පිළිබඳ ඇගයීම් කළ මෙම දායක නියෝජිතායතන මගින් නිර්දේශ කරන ලද පරිදි **2019** ජනවාරි මස තේරීම් කණ්ඩායම නිර්මාණය කරන ලදී. අවදානම් ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම සඳහා තේරීම් කණ්ඩායමේ විශ්ලේෂකයින් කණ්ඩායමක් විසින් ආනයන දත්ත අඛණ්ඩව විශ්ලේෂණය කරයි.

ඉන්පසුව මෙම වර්ධනයන් අවදානම් කළමනාකරණ කමිටුව (RMC) වෙත වාර්තා කරනු ලබන අතර පසුව එහි අනුමැතිය සහිතව ASYCUDA පද්ධතියේ තේරීම් මොඩියුල හරහා ඉහළ අවදානම් සහිත භාණ්ඩ ඉලක්ක කරනු ලබන තේරීම් නිර්ණායක වලට අවදානම් පැතිකඩ ඇතුළු කරනු ලැබේ.

2022 වර්ෂයේ භාණ්ඩ වරණීයතාව සාක්ෂාත් කරගැනීම

අ. භාණ්ඩ ආනයනයන් ඉලක්කකර අවදානම් විශ්ලේෂණයක් සිදුකරන ලදී.

ආ. ආර්ථිකයේ සහ වෙළඳ රටාවන්හි වෙනස්කම් සමග පැන නැගෙන ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා වරණීය රීති සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී.

ඇ. ආනයන පරිමාව සහ පරීක්ෂණ අංගන හා ස්කෑනර් යන්ත්‍රයන්හි ධාරිතාව පිළිබඳ සළකා බලන ලද අතර රේගු පාලනයන් හා වෙළඳාම සඳහා පහසුකම් සැලසීම පිණිස භෞතික හා මානව සම්පත් උපරිම අයුරින් භාවිතා කිරීම සඳහා රීති වෙනස් කරන ලදී.

ඈ. DBRA **1** ආනයන ඉලක්ක කර ගනිමින් අවදානම් විශ්ලේෂණයක් සිදුකරන ලදී.

ඉ. DBRA **1** ආනයන සඳහා ස්වයංක්‍රීය වරණීය රීති ක්‍රියාත්මක කරන ලදී.

ඊ. ස්කෑනර් යන්ත්‍රය වෙත යොමු කර DBRA1 බහාළුම් සංඛ්‍යාව අඩු කිරීමේ අවශ්‍යතාවය හඳුනාගන්නා ලද අතර බහුවිධ බහාළුම් සහිත භාණ්ඩ තොග සඳහා බහාළුම් විභේදනය හඳුන්වා දී එක් කොටසක් පමණක් පරීක්ෂා කිරීමේ අංගනයට යොමුකර පරීක්ෂා කරන ලද බහාළුම්වල ප්‍රතිඵල අනුව ඉතිරි බහාළුම් කෙළින්ම වරායෙන් නිදහස් කිරීම කරන ලදී. අවශ්‍ය වන්නේනම් සියලුම බහාළුම් පරීක්ෂණ අංගන වෙත නැවත යොමු කිරීමට ඉඩ දෙමින් සෑම විටම රේගු පාලනය සහතික කෙරේ.

2. ක්‍රියාවලි ප්‍රතිව්‍යුහගත කිරීම

සිදුකරන ලද අවදානම් තක්සේරු කිරීම්වල සහාය ඇතිව,ක්‍රියාවලියේ යම් යම් අඩුපාඩු හඳුනා ගැනීමට ක්‍රියාවලි ප්‍රතිව්‍යුහගත කිරීමේ කණ්ඩායම විසින් පවතින ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම සිතියම් ගත කිරීම සිදුකරනු ලැබේ. පවත්නා පද්ධතියේ හඳුනාගත් ගැටළු සහ එම ගැටළු නිරාකරණය කිරීම සඳහා වන නිර්දේශ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු ඉහළ කළමනාකාරිත්වයට වාර්තා කරනු ලැබේ. ඉහළ කළමනාකාරිත්වයේ අනුමැතිය සහිතව අවදානම් කළමනාකරණ අංශයේ සමීප අධීක්ෂණය යටතේ නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබේ. ඉදිරි වැඩිදියුණු කිරීම් සඳහා ප්‍රයෝජනවත් විය හැකි යම් බාධක හා ඒ ආශ්‍රිත ගැටළු හඳුනාගැනීමට ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව අධ්‍යයනය කරනු ලැබේ.

2022 වර්ෂයේ ක්‍රියාවලි ප්‍රතිව්‍යුහගත කිරීම සාක්ෂාත් කර ගැනීම

අ. කුරියර් පාර්සල් මෙහෙයවන්නන්ගේ සහභාගිත්වයෙන් මූලික සාකච්ඡා පවත්වන ලදී.

ආ. ගේට්ටු මෙහෙයුම් පිළිබඳ **DOPL** ක්‍රියාත්මක කිරීම සඳහා **NCT** ගේට්ටුවලදී සපුරාලිය යුතු අවශ්‍යතා පිළියෙලකර ක්‍රියාවලි විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියට යවනු ලැබීය .

ඇ. කාර්යක්ෂමව BOI භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා CVT හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රේගුවේ BOI හා අනෙකුත් අංශ සමගසම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීම.

3. විමර්ශන

පළපුරුදු විමර්ශන නිලධාරීන් කණ්ඩායමකින් සමන්විත මෙම කණ්ඩායම, පවත්නා රේගු ක්‍රියාවලියේ අවදානම් ක්ෂේත්‍ර සහ පසුබෑම් හඳුනාගැනීමේ අරමුණින් යුතුව විවිධ වංචා අනාවරණය කර ගැනිම සහ විමර්ශනය කිරීම සිදු කරනු ලැබේ. එවැනි විමර්ශනයන්හි ප්‍රධාන අරමුණ වනුයේ විවිධ අවදානම් ක්ෂේත්‍ර හඳුනාගැනිම සහ වරණීය සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ කණ්ඩායම් වලට ඔවුනගේ ඉලක්ක සපුරා ගැනීම සඳහා සහායවීමට ඒවා භාවිතා කිරීමයි.**2022** වර්ෂයේදි සිදුකරනලද විමර්ශනයන්හි සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

වගුව **01. 2022** වර්ෂයේ විමර්ශනයන් සාක්ෂාත් කර ගැනීම

1	ආරම්භ කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව	**125**
2	අවසන් කරන ලද මුළු සිද්ධි සංඛ්‍යාව **(e-CCR** යාවත්කාලින කරන දී**)**	**86**
3	නියෝග ලබාදුන් මුළු සිද්ධි සංඛ්‍යාව **(**නිමකරන ලද+ අපහරණය කරනලද භාණ්ඩ සමග+ අපේක්ෂිත ගෙවීම්+ බැංකු ඇපකර සමග නිදහස් කරන ලද**)**	**109**
4	සාර්ථක වූ මුළු සිද්ධි සංඛ්‍යාව **(**අයකිරීමක් සහිත**)**	**99**
5	මුළු **NFA** සිද්ධි සංඛ්‍යාව	**10**
6	විමර්ශන සිදු කෙරෙමින් පවතින මුළු සිද්ධි සංඛ්‍යාව	**16**
7	සාර්ථකත්ව අනුපාතය	**90.83%**
8	මුළු අයකර ගැනීම් **(**රුපියල්**)**	**903,387,651.46**
9	සාර්ථක සිද්ධියකට සාමාන්‍ය අයකරගැනිම **(**රුපියල්**)**	**9,125,127.79**
10	මෙතෙක් ගෙවා ඇති මුළු අයකරගැනීම් **(**රුපියල්**)**	**709,731,430.26**

4. බලයලත් ආර්ථික මෙහෙයුම්කරු වැඩසටහන

ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකම් සැලසීමේ ගිවිසුම (TFA) **2017** පෙබරවාරි **22** වන දින බලාත්මක වූ විට දේශසීමා අතර වෙළඳාම පිළිබඳ විනිවිදභාවය සහ අනාවැකි පැවසීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා TFA මගින් නියම කරනු ලබන ප්‍රමිතීන් සපුරාලීම ශ්‍රී ලංකාවට බොහෝ වගකීම් තිබිණි. මෙම වගකීම් සපුරාලීමේ මූලික අවශ්‍යතාවයක් වන්නේ බලයලත් ආර්ථික මෙහෙයුම්කරු වැඩසටහනක් (AEO) එළිදැක්වීම වන අතර AEO ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායමක් මෙම අරමුණ සඳහා පිහිටුවන ලදී. AEO සංකල්පය ඉලක්ක කරනුයේ ඉහළ මට්ටමේ සැපයුම් දාම ආරක්ෂාවක්, මූල්‍ය ස්ථායීතාවය සහ රේගු නීති සමග අඛණ්ඩව අනුකූල වීම සිදුකරනු ලබන නියම නීතිගරුක

ආනයනකරුවන් සහ අපනයනකරුවන්ට පහසුකම් සැලසීම වේ. පරීක්ෂා කිරීම් අඩුකිරීම,නිෂ්කාශනය සඳහා ප්‍රමුඛතාව ලබාදීම, සාමාන්‍ය මිල පිරික්සුම් සඳහා යොමු කිරීම් වලින් නිදහස් කිරීම වැනි පහසුකම් ලැබීම මගින් පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබාගත හැකිය.

2022 වර්ෂයේ බලයලත් ආර්ථික මෙහෙයුම්කරු වැඩසටහනේ සාක්ෂාත් කරගැනීම්

අ. අයදුම්පත් වලංගු කිරීම අඛණ්ඩව සිදුකරන ලද අතර තෝරාගත් වෙළඳුන් තිදෙනෙකු **2022** ජනවාරි මාසයේ අනුකූල ආර්ථික මෙහෙයුම්කරු **(CEO)** ලෙස පිළිගැනීමට නියමිතය.

ආ. **2022** ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා රේගුවේ බලයලත් ආර්ථික මෙහෙයුම්කරු වැඩසටහන එළිදක්වන ලදී.

ඇ. බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) අන්තර්ජාල ද්වාරය (web portal) සකස්කර ප්‍රකාශයට පත්කරන ලදී.

ඈ. බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) සඳහාවන මෙහෙයුම් මාර්ගෝපදේශ අවසන්කර AEO අන්තර්ජාල ද්වාරයේ ප්‍රකාශයට පත්කරන ලදී.

ක්‍රියාකාරී සැලැස්මට අනුව 2022 වර්ෂයේ අවදානම් කළමනාකරණ අංශයේ කාර්යසාධනය

පාලන අරමුණු යටතේ ප්‍රධාන ක්‍රියාකාරකම්

අ/අංකය	අරමුණු	උපාය මාර්ගය	ක්‍රියාකාරකම්	ප්‍රධාන කාර්යසාධන දර්ශක	තත්ත්වය
1	වංචනික භාණ්ඩ තොග පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කිරීම අවම කිරීම.	1. තේරීම් නිර්නායක අධ්‍යයනය කිරීම හා ප්‍රතිශෝදනය කිරීම	**1.** ආනයන ප්‍රවණතා විශ්ලේෂණය කිරීම	1. පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කළ භාණ්ඩ මගින් මාසයක් සඳහා අනාවරණය කරගත් වංචා සංඛ්‍යාව (0)	පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කළ භාණ්ඩ ප්‍රතිශතය **0%** ති. පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කිරීමට තෝරාගැනීම **100%** කින් නිවැරදි වේ.
			2. පෙර වාර්තා/වංචා විශ්ලේෂණය කිරීම	2. පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කළ භාණ්ඩ මගින් මාසයක් සඳහා අනාවරණය කරගත් මුළු වංචා ප්‍රමාණය (0)	
			3. ලියාපදිංචි කිරීමේ විස්තර විශ්ලේෂණය කිරීම	3. පරීක්ෂා කිරීමකින් තොරව නිදහස් කළ භාණ්ඩ මගින් වංචා අනාවරණය කරගැනීමේ ප්‍රතිශතය (0%)	
			4.අනාවරණය කිරීම් සිදුකරන විට භාණ්ඩවල CCR දත්ත විශ්ලේෂණය කිරීම		
		2. විමර්ශන	1. පරීක්ෂා කිරීම් වලින් නිදහස් කළ සැකසහිත භාණ්ඩ අනාවරණයකර ගැනීම හා විමර්ශන සිදුකිරීම		කරුණාකර **01** වගුව බලන්න.
2	පරිලෝකනය කිරීම් හරහා වංචා අනාවරණය කර ගැනීම වැඩිදියුණු කිරීම	පරිලෝකනය කිරීම සඳහා බහාළුම් තෝරාගැනීමේ නිර්ණායක අධ්‍යයනය කිරීම හා ප්‍රතිශෝදනය කිරීම	1. පරිලෝකන ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම	**1.**මාසයක් සඳහා පරිලෝකනය කරන ලද බහා **2.**ළඟ සංඛ්‍යාව **3.**මාසයක් සඳහා පරිලෝකනය මගින් අනාවරණය කරගත් වංචා සංඛ්‍යාව **4.**මාසයක් සඳහා පරිලෝකනය මගින් අනාවරණය කරගත් වංචාවල වටිනාකම **4.**පරිලෝකනය මගින් අනාවරණය කරගත් වංචා ප්‍රතිශතය	මාසයකට පරිලෝකනගත කරන ලද බහාළුම් සංඛ්‍යාව **9240** කි.
			2. පරිලෝකන ප්‍රතිඵල හා විමර්ශන කාර්යයන් සඳහා රඳවාගනු ලැබූ භාණ්ඩවල විස්තර විශ්ලේෂණය කිරීම		
3	වරාය මෙහෙයුම් පිළිබඳ රේගුවේ පාලනය ශක්තිමත් කිරීම	LCL ගුදම්ගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම	**1.** අවදානම මත පදනම්ව LCL ගුදම් තේරීම පාලනය කිරීම **2.** ගුදම්වලට LCL ගොඩබෑම අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම	මාසයක් සඳහා එක් එක් ගුදමේදී හිස්කරන ලද බහාළුම් සංඛ්‍යාව මාසයක් සඳහා ගේට්ටුවේදී අනාවරණය කරගත් හිස් බහාළුම් ලෙස භාණ්ඩ ජාවාරමේ යෙදුනු බහාළුම් සංඛ්‍යාව	**JCT,** පිට කොටුව හා **NNR** ගුදම්වලදී ස්වයංක්‍රීය LCL භාණ්ඩ නිෂ්කාෂණය ක්‍රියාත්මක කිරීම
		භිස් බහාළුම් ඉවත් කිරීම ක්‍රමවත් කිරීම	**1.** හිස් බහාළුම් සඳහා පද්ධතිය මගින් උත්පාදන වන ගේට්ටු අවසරපතක් ක්‍රියාත්මක කිරීම **2.** හිස් බහාළුම් නිදහස් කිරීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම	සතියක් සඳහා අනාවරණය කරගත් අත්හැර දමන ලද භාණ්ඩ සංඛ්‍යාව මාසයක් සඳහා එක් එක් ගුදමේදී හිස්කරන ලද බහාළුම් සංඛ්‍යාව	යෝජිත වාප්පු පරිපාලන අංශය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කර ඇත. යෝජිත වාප්පු පරිපාලන අංශයේ මෙහෙයුම් ආරම්භවීමත් සමග

					යෝජිත ක්‍රියාවලිය ආරම්භ වීමවට නියමිතය.
		අත්හැර දමන ලද භාණ්ඩ අනාවරණය කර ගැනීම් ක්‍රමවත් කිරීම	අත්හැර දමන ලද භාණ්ඩ අනාවරණය කර ගැනීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම හා මධ්‍යම අපහරණ අංශයට වාර්තා කිරීම .	මාසයක් සඳහා ගේට්ටුවේදී අනාවරණය කරගත් හිස් බහාළුම් ලෙස භාණ්ඩ ජාවාරමේ යෙදුනු බහාළුම් සංඛ්‍යාව	
4	කුර්යර් භාණ්ඩ ක්‍රමවත් කිරීම	කුරියර් භාණ්ඩ සඳහා අවදානම් පාදක වරණීයතාව අදාලකර ගැනීමේ යාන්ත්‍රණය හඳුන්වාදීම	1. කුරියර් භාණ්ඩ සඳහා විස්තරාත්මක නෞභාර ලේඛන ඉලෙක්ට්‍රොනික ඉදිරිපත් කිරීම ක්‍රියාත්මක කිරීම 2. කුරියර් භාණ්ඩ සඳහා අවදානම් පාදක වරණීයතාව අදාලකර ගැනීම	1. නිදහස් කළ කුරියර් භාණ්ඩ ප්‍රතිශතය 3. පරීක්ෂා කිරීම් වලින් නිදහස් කළ කුරියර් භාණ්ඩ මගින් අනාවරණය කරගත් වංචා සංඛ්‍යාව 4. පරීක්ෂා කිරීම් වලින් නිදහස් කළ කුරියර් භාණ්ඩ මගින් අනාවරණය කරගත් වංචාවල වටිනාකම 5. නිදහස් කළ කුරියර් භාණ්ඩ ප්‍රතිශතය	කුරියර් පාර්සල මෙහෙයවන්නන්ගේ සහභාගිත්වයෙන් යුතුව මූලික සාකච්ඡා සිදුකරන ලදී.

වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ අරමුණු යටතේ
මූලික ක්‍රියාකාරකම්

අ/අංකය	අරමුණු	උපාය මාර්ගය	ක්‍රියාකාරකම්	ප්‍රධාන කාර්යසාධන දර්ශක	තත්ත්වය
1	අනුකූල ආර්ථික මෙහෙයුම්කරු (CEO) වැඩසටහන වැඩිදියුණු කිරීම .	අනුකූල ආර්ථික මෙහෙයුම්කරු (CEO) වැඩසටහන වැඩිදියුණු කිරීම .	1. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම 2. අයදුම්පත් පරීක්ෂා කිරීම 3. සමාගම් වලංගු කිරීම මෙහෙයවීම	1. මාසයක් සඳහා ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 2. මාසයක් සඳහා සිදුකළ වලංගු කිරීම් සංඛ්‍යාව 3. CEO තත්වය පිරිනමන ලද සමාගම් සංඛ්‍යාව 4. CEO සමාගම් මගින් ලද ආදායම් ප්‍රතිශතය	ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ සහ සේවා සැපයුම් හා ප්‍රවාහන වරලත් ආයතනයේ සහය ඇතිව වෙළඳ ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ ප්‍රචාරක වැඩසටහන් පවත්වන ලදී . AEO අන්තර්ජාල ද්වාරය සංවර්ධනය කර එහි සබැඳිය මහජනතාව වෙත ලබාදෙන ලදී.
2	බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) වැඩසටහන ආරම්භ කිරීම	CEO සමාගම් අතරින් සුදුසු අපේක්ෂකයින් උත්ශ්‍රේණිගත කිරීම මගින් AEO වැඩසටහන නිල වශයෙන් ආරම්භ කිරීම	1. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම 2 අයදුම්පත් පරීක්ෂා කිරීම 3. සමාගම් වලංගු කිරීම්	1. මාසයක් සඳහා අයදුම්කරුවන් සංඛ්‍යාව 2.මාසයක් සඳහා සිදුකරන ලද වලංගු කිරීම් සංඛ්‍යාව 3.AEO තත්වය පිරිනමන ලද සමාගම් සංඛ්‍යාව 4. AEO සමාගම් මගින් ලද ආදායම් ප්‍රතිශතය	AEO/CEO වැඩසටහන ආරම්භකරන ලද අතර 2022.01.20 දින සිට ක්‍රියාත්මක වෙමින් පවතී.සමාගම් තුනකට CEO තත්වය පිරිනමා ඇත.

3	බලයලත් AEO/CEO සංචිතය ශක්තිමත් කිරීම	AEO/CEO ලෙස නිලධාරීන් බඳවා ගැනීම	1. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	1. මාසයක් සඳහා අයදුම්කරනලද නිලධාරීන් සංඛ්‍යාව 2. පවත්වන ලද පුහුණුවීම් සංඛ්‍යාව 3 කාර්තුවකදී පුහුණුකරන ලද නිලධාරීන් සංඛ්‍යාව	
		සප්‍රමාණකරු පුහුණුව	1. සප්‍රමාණකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම 2. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම		
4	අඩු අවදානම් භාණ්ඩ පරීක්ෂා කිරීම් වලින් නිදහස් කිරීම වැඩිකිරීම	තේරීම් නිර්ණායක අධ්‍යයනය කිරීම හා සංශෝදනය කිරීම	ආනයන දත්ත විශ්ලේෂණය කිරීමප්‍රවණතා /	1.මාසයක් සඳහා නිදහස් කිරීම සංඛ්‍යාව	තවදුරටත් ආයෝජන මණ්ඩල ආනයන හා ඩී ශාඛාව සඳහා බහාළුම් ගනණාවක් සහිත භාණ්ඩ තොග බහාළුම් කොටස් වලට වෙන්කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීමෙන ලදී තවද .
			පෙර වාර්තාවංවා විශ්ලේෂණය කිරීම /	2.මුළු අපනයනයෙන් නිදහස් කිරීම් ප්‍රතිශතය	
		අවදානම් මට්ටම පාදක කරගෙන වෙළඳුන් කාණ්ඩ කිරීම	ලියාපදිංචි කිරීමේ විස්තර විශ්ලේෂණය කිරීම	3.පරීක්ෂා කිරීම සඳහා තෝරාගත් බහාළුම් සංඛ්‍යාව	පවතින දත්ත විශ්ලේෂණය කර භාණ්ඩ වරණීයතාවයේදී භාවිතා කරනු ලබන අවදානම් සහිත වෙළඳුන් ලැයිස්තු සමාලෝචනය කර සංශෝධනය කරන ලදී.
		අවදානම් මට්ටම පාදක කරගෙන රේගු මූලස්ථාන අනු නියෝජිතයින් කාණ්ඩ කිරීම	ලියාපදිංචි කිරීමේ විස්තර විශ්ලේෂණය කිරීම		
5	භාණ්ඩ ප්‍රතිනැවිගත කිරීම් ඉලෙක්ට්‍රොනික වාර්තාකිරීම ක්‍රියාත්මක කිරීම	රට තුලට හා රටින් පිටතට ප්‍රතිනැවිගත කිරීම් සඳහා අවශ්‍ය ලේඛන ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කිරීම	ලේඛන ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කිරීම සඳහා යාන්ත්‍රණයක් සැලසුම්කර හඳුන්වාදීම	අදාල නොවේ	
		කිරීම් සඳහා ස්වයංක්‍රීය කපා හැරීම් ක්‍රියාත්මක කිරීම්	අපනයන මත ප්‍රතිනැවිගත කිරීම තීරු බදු අත්හැරීමේ යාන්ත්‍රණයක් සැලසුම්කර හඳුන්වාදීම .		යෝජිත වාප්පු කළමනාකරණ අංශය සමග ක්‍රියාත්මක කළ යුතුය
6	රට තුළට භාණ්ඩ ගෙන්වීම සඳහා ඉලෙක්ට්‍රොනික අවසරයක් හඳුන්වාදීම	ඉලෙක්ට්‍රොනික අවසරයක් සැලසුම්කර හඳුන්වාදීම	**ASyCuDa** පද්ධතිය හරහා අවසරය ඉදිරිපත් කිරීම හා ඒ සඳහා බලය දීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම	අදාල නොවේ	යෝජිත වාප්පු කළමනාකරණ අංශය සමග ක්‍රියාත්මක කළ යුතුය

7	ආයෝජන මණ්ඩල භාණ්ඩ නිශ්කාෂණය ක්‍රමවත් කිරීම	ආයෝජන මණ්ඩල භාණ්ඩ සඳහා අවදානම් පාදක වරණීයතාව හඳුන්වාදීම	නිර්ණායක තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම	1. පරීක්ෂා කිරීම සඳහා තෝරාගත් ආයෝජන මණ්ඩල බහාළුම් සංඛ්‍යාව 2. පරීක්ෂා කිරීම සඳහා තෝරාගත් ආයෝජන මණ්ඩල භාණ්ඩ තොග ප්‍රතිශතය	ආයෝජන මණ්ඩලයේ යෝජනා අනුව ආයෝජන මණ්ඩල ලැයිස්තු සංශෝධනය කර යාවත්කාලීන කරන ලදී. ආයෝජන මණ්ඩල භාණ්ඩ සඳහා බහාළුම් කොටස්වලට වෙන් කිරීමේ යාන්ත්‍රණය හඳුන්වා දෙන ලදී.
		ආයෝජන මණ්ඩල පරීක්ෂා කිරීම් අංගනවල පහසුකම් වැඩිදියුණු කිරීම	ආයෝජන මණ්ඩල පරීක්ෂා කිරීම් අංගනවල පහසුකම් වැඩිදියුණු කිරීම		
8	ශ්‍රී ලංකා රේගුව සඳහා අවදානම් කළමනාකරණ පද්ධතියක් (RSM) ලබාගැනීම	සුදුසු අවදානම් කළමනාකරණ පද්ධතියක් තෝරා ගැනීම හා ලබාගැනීම	සුදුසු අවදානම් කළමනාකරණ පද්ධතියක් තෝරා ගැනීම	අදාල නොවේ	• ඉහළ කළමනාකාරිත්වය විසින් අනුමත කළ යුතුව ඇත
			සුදුසු අවදානම් කළමනාකරණ පද්ධතියක් ලබා ගැනීම		
			අවදානම ස්වයංක්‍රීයව ඇගයීම සඳහා ASyCuDa පද්ධතිය සමග සම්බන්ධවීම		

8.1.7 මධ්‍යම අපහරණ අංශය

රාජ සන්තක කරන ලද/ අත්හැර දමන ලද භාණ්ඩ සම්බන්ධ අබහර්නයන් අදාළ අභ්‍යන්තර බලධාරීන් සහ බාහිර බලධාරී ආයතන සමග සම්බන්ධීකරණය කිරීම මගින් අපහරණ කටයුතු මධ්‍යගත කිරීම සඳහා බලාත්මක කිරීමේ පර්ෂදය තුළ ක්‍රියාත්මක වන නව අංශයක් ලෙස මධ්‍යම අපහරණ අංශය (CDD) 2019 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී.

අංශයේ දැක්ම

ශ්‍රී ලංකා රේගුව තුළ රාජ සන්තක කළ /අතහැර දමන ලද භාණ්ඩ අපහරණ ක්‍රියාවලියට පහසුකම් සපයන අතර ආදායම් රැස් කිරීම සහ රජයේ සමාජ ආරක්ෂණ නීතිය බලාත්මක කිරීම මගින් විශිෂ්ටතම, ගතික හා ඵලදායී සේවා සැපයුම්කරු වීම.

මෙහෙවර

මධ්‍යම අපහරණ අංශය පහත සඳහන් අරමුණු කෙරෙහි කැපවීමෙන් ක්‍රියා කරයි.

- ශ්‍රී ලංකා රේගුවෙහි සමස්ත භාණ්ඩ අපහරණ ක්‍රියාවලිය මධ්‍යගත කොට ඒ සඳහා පහසුකම් සැපයීම.
- ටෙන්ඩර් අලෙවිය තුළින් ආදායම් රැස් කිරීම.
- භාණ්ඩ අපහරණ කරන අතරම සමාජයීය ආර්ථික වටිනාකමින් යුත් දෑ සංරක්ෂණය කිරීම.
- පාර්ශවකරුවන්ට විශිෂ්ට සේවාවක් ලබා ගැනීමට හැකි වන පරිදි භාණ්ඩ අපහරණ නීති බලාත්මක කිරීම.

මධ්‍යම අපහරණ අංශයේ ප්‍රධාන කාර්යයන්

- ටෙන්ඩර් අලෙවිය පැවැත්වීම.
- විකිණිය නොහැකි භාණ්ඩ විනාශ කිරීම.
- මෝටර් වාහන මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ DMT-RMV හි ලියාපදිංචි කිරීම සඳහා සම්බන්ධ කිරීම.
- ශ්‍රී ලංකා වරාය අධිකාරී පනත යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් පවත්වනු ලබන ටෙන්ඩර/වෙන්දේසි සඳහා පහසුකම් සැලසීම.

නීති හා රෙගුලාසි

1. රේගු ආඥාපනතේ 16 වන වගන්තිය -ආනයනය සහ අපනයනය සම්බන්ධව වේලාව අර්ථ දැක්වීම.
2. රේගු ආඥාපනතේ 105 (2) වගන්තිය -භාණ්ඩ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු බලතල
3. රේගු ආඥාපනතේ පනතේ 109 වන වගන්තිය -දින තිහක් තුළ ඉවත් කර නොගත් භාණ්ඩ විකිණීමට ඇති බලය
4. රේගු ආඥාපනතේ පනතේ 154 වන වගන්තිය -තහනමට ගත් භාණ්ඩ පිලිබඳව මාසයක් තුළ දී හිමිකම් පෑමක් නොකළහොත්, නුසුදුසු බවට ප්‍රකාශකොට ඒවා සම්බන්ධයෙන් අනුව ක්‍රියා කළ යුතු බව
5. රේගු ආඥාපනතේ පනතේ 162 වන වගන්තිය -අල්වා ගැනීමෙන් පසු නීති විරෝධියැයි ප්‍රකාශ කල බඩු හා නැව් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා නියමකරන ආකාරයට සුදුස්සක් කළ හැකිය.
6. අංක 2016/06දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ
7. 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත
8. 1969අංක 1දරන ආනයන හා අපනයන පාලන පනත
9. 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරී පනත)39/39 (6) / 84 / (84 (2) / 84 (3) වගන්ති)
10. 1979 අංක 31 දරන මෝටර් රථ ප්‍රවාහන පනත
11. 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත
12. 1980 අංක 26 දරන ආහාර පනත
13. 2002අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත
14. 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත
15. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත
16. 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත
17. 1942අංක 13 දරන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත
18. 1947අංක 08 දරන වන කැලෑ පනත
19. 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත
20. 2015 අංක 05 දරන ශ්‍රී ලංකා ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත

2022 වර්ෂය තුළ මධ්‍යම අපහරණ අංශයේ කාර්යසාධනය

1. ටෙන්ඩර් අලෙවිය

1.1. 2022 වර්ෂයේ සිදු කරන ලද ටෙන්ඩර් අලෙවි

වගුව 1.1: **2021** හා **2022** වසර තුළ සිදුකරන ලද ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව

ටෙන්ඩර් කාණ්ඩය	*සිදුකරන ලද ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව*	
	2021	2022
සාමාන්‍ය	10	**8**
වාහන	10	**8**
විශේෂ	5	**2**
Total	**25**	**18**

බලපෑමට යටත් අංශවල දුර්වලතා මත අපහරණ ක්‍රියා පටිපාටියට බලපෑ අහිතකර තත්ත්වය හේතුවෙන් මධ්‍යම අපහරණ අංශය විසින් සාමාන්‍ය ටෙන්ඩර **8** ක්, වාහන ටෙන්ඩර **8** ක් සහ විශේෂ ටෙන්ඩර **2** ක් අන්තර්ගත වන පරිදි සමස්ත වශයෙන් ටෙන්ඩර අලෙවි **18** ක් සිදු කර තිබේ.



රූපය **1.1.1: 2021** හා **2022** වසර තුළ සිදුකරන ලද ටෙන්ඩර් අලෙවි සංඛ්‍යාව

2021 හා **2022** වසර තුළ සිදුකරන ලද ටෙන්ඩර අලෙවි සංඛ්‍යාව අතර සන්සන්දනය ඉහත රූපයේ දැක්වේ.

1.2: වගුව **2022** වර්ෂය තුළ ටෙන්ඩර් අලෙවිය මඟින් අය කරගැනීම්

කාණ්ඩය	**2022** වසරේදී ඉපයූ අයකර ගැනීම් රු.	ප්‍රතිශතය
සාමාන්‍ය	1,073,033,159	82.64
විශේෂ	6,453,279	0.50
වාහන	218,895,679	16.86
එකතුව	**1,298,382,117**	**100**



රූපය **1.1.2: 2022** වසරේ මුළු අයකර ගැනීම්

2022 වර්ෂය තුළ සිදු කරන ලද ටෙන්ඩර් අලෙවියෙන් එකතු කරන ලද මුළු අයකර ගැනීම් රුපියල් මිලියන **1,298.38** කි .මේ අතර, සාමාන්‍ය ටෙන්ඩර් අලෙවියෙන් අයකර ගත් මුදල රුපියල් මිලියන **1,073.03** ක් වන අතර එය **2022** වර්ෂයේ දී රැස් කරන ලද මුළු අයකර ගැනීම්වලින් **82.64 %** ක්වේ.

විශේෂ ටෙන්ඩර සහ වාහන ටෙන්ඩර වලින් අයකර ගැනීම් අනුපිළිවෙලින් **0.5 %** ක් සහ **16.86 %** ක් වන අතර රාජසන්තක කර රේගු අංගනවල ඇති වාහන රජයේ ආයතනවලට ලබා දීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් අනෙකුත් කාණ්ඩයන් හා සසඳන විට වාහන අපහරණය සම්බන්ධයෙන් අයකර ගැනීමෙහි සැලකිය යුතු වෙනසක් දැකිය හැකිය.

1.2 ටෙන්ඩර මගින් සාමාන්‍ය භාණ්ඩ විකිණුම් අය කරගැනීම

සාමාන්‍ය භාණ්ඩ ,විශේෂ සහ සාමාන්‍ය යන දෙආකාරය යටතේම ටෙන්ඩර කැඳවා ඇත .රේගු ටෙන්ඩර අලෙවි අයකර ගැනීමේදී දායකවූ ප්‍රධාන භාණ්ඩ පහත පරිදි කාණ්ඩ කර දැක්වේ.



රූපය **1.2: 2022** දී සාමාන්‍ය භාණ්ඩ අයකර ගැනීම් ව්‍යාප්තිය

සාමාන්‍ය ටෙන්ඩර් අලෙවියේ වඩාත්ම සැලකිය යුතු අංගය වන්නේ සාමාන්‍ය භාණ්ඩවල ශුද්ධ අයකර ගැනීම්වලින් **61%** ක දායකත්වයක් දරන ඉහළ වටිනාකමින් යුත් භාණ්ඩ .වේ (රත්‍රන් තහඩු සහ අයිතම)ජෙවමය හා සංස්කෘතිකමය වටිනාකමින් යුත් භාණ්ඩ සාමාන්‍ය අලෙවි අයකර ගැනීම් වලින් **1%** ක් වන අතර අනෙකුත් භාණ්ඩ මුළු මූල්‍ය වටිනාකමින් **38%**ක් වේ.

1.3 2021 හා 2022 වසර අතර කාර්යසාධනය සැසඳීම

1.3.1 සාමාන්‍ය භාණ්ඩ



රූප සටහන **1.3.1: 2021** සහ **2022** වර්ෂවල සාමාන්‍ය භාණ්ඩ අලෙවිය මගින් අයකර ගැනීම්

රූපසටහන **1.3.1**ට අනුව, රේගු ටෙන්ඩර් අලෙවිය මගින් අපහරණය කරන ලද සාමාන්‍ය භාණ්ඩවලින් අයකර ගත් මුදල **2021** වසරට සාපේක්ෂව **2022** වර්ෂයේ ඉහලයාමක් පෙන්නුම් කරයි .**2021** දී සාමාන්‍ය භාණ්ඩවල දායකත්වය රුපියල් මිලියන **1,486** ක් පමණ වූ අතර **2022**දී එය රුපියල් මිලියන **1,073** කට ආසන්න ප්‍රමාණයකි.

1.3.2 වාහන



රූප සටහන **1.3. 2: 2021**හා **2022**වසර වලදී විකුණන ලද වාහන වලින් අයකර ගැනීම්

රූප සටහන **2021**දී රේගු ටෙන්ඩර විකුණුම් මගින් අයකරගත් මුළු මුදල හා සැසඳීමේදී **2020** අනුව **1.3.2183%** ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.**2021** වසරේදී ටෙන්ඩර් හරහා අළෙවි කරන ලද වාහන **30** මගින් රුපියල් මිලියන **77**ක පමණ මුදලක් ලබාගත් අතර **2022** වසරේදී රේගු ටෙන්ඩර් හරහා වාහන **18**ක් විකිණීම මගින් රුපියල් මිලියන **218**ක පමණ මුදලක් ලබාගෙන ඇත.

2021 සහ 2022 වර්ෂ සඳහා මුළු අයකර ගැනීම් සන්සන්දනය



රූපසටහන **1.3.3: 2021** හා **2022** අතර ටෙන්ඩර විකුණුම් සන්සන්දනය



රූපසටහන **1.3.4: 2021** හා **2022** වසරේ මුළු අයකර ගැනීම්

1.3.3 රූපසටහන අනුව **2021** වසර හා සැසඳීමේදී **2022** වසරේදී ටෙන්ඩර් සංඛ්‍යාවේ වැඩිවීමක් දක්නට හැකිය **.1.3.4** රූපසටහන මගින් **2021** හා **2022** වසරේ ටෙන්ඩර් අලෙවිය මගින් අයකරගත් මුළු මුදල දැක්වේ

2. ආපසු නොගෙවන තැන්පතු අයකර ගැනීම .

අදාල ලංසුකරු විසින් ලංසු ලබාගැනීමට අපේක්ෂිත සෑම අයිතමයක් සඳහාම ලංසු අයදුම්පත් නිකුත් කිරීම සඳහා ආපසු නොගෙවන තැන්පතු අයකරගනී.රාජ්‍ය මුදල් වක්‍රලේඛ **06/2016** අනුකූලව මධ්‍යඔ අපහරණ අංශය මගින් නිකුත් කරන ලද දෙපාර්තමේන්තු නියෝග **1450 (DOPL 1450) CDD** මගින් සිදුකරන ලද ටෙන්ඩර් අලෙවි සඳහා ආපසු නොගෙවන තැන්පතු සංශෝධනය කර ඇත.

වගුව **2:** ආපසු නොගෙවන තැන්පතු අයකර ගැනීම්

ආපසු නොගෙවන තැන්පතු	අයකර ගැනීම්	ලංසු ලේඛණ සංඛ්‍යාව	ටෙන්ඩර සංඛ්‍යාව
2021	3,378,900	1,642	25
2022	1,645,800	1,098	18

DOPL 1450 නිකුත් කිරීමට පෙර ලංසු අගය නොසළකා සෑම ලංසුවක් සඳහාම රු. **300/-** ක ආපසු නොගෙවන ලංසු අගයක් අයකරනු ලැබීය. **DOPL 1450** නිකුත්කළ පසුව ලංසු අගය අනුව ලංසු ලේඛණ පිරිවැය වෙනස් විය.

ඉහත වගුව විශ්ලේෂණයේදී නිගමනය කළ හැක්කේ නව **DOPL** මගින් වැඩිකළ ආපසු නොගෙවන හා ආපසු ගෙවන තැන්පතු මුදල මගින් ලංසුකරුවන්ට බලපෑමක් ඇති නොවූ අතර එමගින් රාජ්‍ය ආදායමේ සැළකිය යුතු වැඩිවීමක් ඇතිවිය.

3. විනාශ කිරීම

අළෙවිකළ නොහැකි භාණ්ඩ (කල් ඉකුත් වූ භාණ්ඩ, අදාළ බලපත්‍ර නිකුත්කිරීමේ බලධාරීන්ගේ ප්‍රමිතීන්ට අනුකූල නොවන භාණ්ඩ) විනාශ කළ හැකිය. අදාළ ශාඛාව / බලධාරීන්ගේ ඉල්ලීම පරිදි මධ්‍යම අපහරණ අංශය විසින් එම භාණ්ඩ විනාශ කිරීමට පහසුකම් සපයනු ඇත.

වගුව **3:** විනාශ කිරීමේ තොරතුරු

විනාශ කිරීම සඳහා ඉල්ලීම්	ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව	සිදු කරන ලද	අපේක්ෂිත
විවිධ ඉල්ලීම්	113	**64 (56.64%)**	49
වරාය අධිකාරියේ ඉල්ලීම්	25	**19 (71.43%)**	06
එකතුව	138	**83**	55

මධ්‍යම අපහරණ අංශයෙහි 2022 ක්‍රියාකාරී සැලැස්ම මගින් විනාශ කිරීම් 30ක් සිදු කිරීමට අපේක්ෂා කරන ලද අතර මධ්‍යම අපහරණ අංශය විසින් 2022 වර්ෂය තුළ එවැනි යෝග්‍යතාවයෙන් තොර භාණ්ඩ විනාශ කිරීමේ ක්‍රියාකාරකම් 83ක් සාර්ථක ලෙස සිදු කර ඇත. අතර එය මධ්‍යම අපහරණ අංශය ලද විශිෂ්ඨ ජයග්‍රහණයකි .

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉල්ලීම් 71.43% ක් සපුරා ඇති අතර ඉල්ලුම්කර ඇති අනෙකුත් විවිධ පාර්ශ්වයන්ගේ ඉල්ලීම්වලින් 56.84% ක් පමණක් සම්පූර්ණ කර ඇත .විනාශ කිරීමේ කටයුතු සඳහා සුදුසු පාර්ශ්වයන් පත්කිරීම ප්‍රමාද වීම සහ තෝරාගත් පාර්ශ්වයන් සහයෝගයෙන් කටයුතු කිරීමට අකමැති වීම එකී කාර්යය ඉටුකිරීමේ ප්‍රධාන බාධක වේ.

සේවා සැපයීම් අංශය විසින් පවත්වනු ලබන ටෙන්ඩරය මගින් අභ්‍යන්තර ශාඛා වලින් ලැබෙන විනාශ කිරීමේ ඉල්ලීම් සඳහා විනාශ කිරීමේ පාර්ශවයන් පත්කරනු ලැබේ .කෙසේ වුවද, උනන්දුවක් දක්වන විනාශකිරීමේ පාර්ශවයන් විසින් ඒ සඳහා ඔවුන්ට දැරීමට සිදුවන තත්‍ය පිරිවැය පිළිබඳ අදහසක් නොමැතිව ටෙන්ඩර සඳහා අඩු ලංසු ඉදිරිපත් කරන බැවින් ටෙන්ඩර් හරහා විනාශකිරීමේ පාර්ශවයක් පත්කිරීමේ ක්‍රමවේදයේ අවභිරතා ඇතිබව පෙනේ .

භාණ්ඩ විනාශ කිරීමේ කාර්යය සඳහා පාර්ශවයන් තෝරාගත් පසු, ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද අයවැය තුළ මධ්‍යම අපහරණ අංශයට විනාශකිරීමේ කාර්යය සඳහා අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාව සපුරාලිය නොහැක .එවැනි ගැටළු හේතුවෙන් එකී පාර්ශවයන් විසින් ටෙන්ඩරයේ ලංසු තබා ඇති වටිනාකමට එම කාර්යය සිදු කිරීමට අකමැති වේ.

යම් භාණ්ඩ වලට නිශ්චිත කාලයක් සඳහා ගිවිසුම් පදනමක් මත විනාශ කිරීමේ පාර්ශවයන් පත්කිරීම සඳහා කිසියම් ක්‍රියාපටිපාටියක් සකස් කළහොත් එවැනි ගැටළු අවමකර ගත හැකිය .විනාශ කිරීමේ නියෝජිතයා සහ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා අතර ඇතිකර ගත් ගිවිසුමක් මත පදනම්ව බිඩ් කොළ විනාශ කිරීම සඳහා මේ හා සමාන සුමට ක්‍රියාවලියක් දැනටමත් ක්‍රියාත්මක වේ.

4. කහ හා වාහන අපහරණය

a. කහ අපහරණය

රාජසන්තක කරන ලද කහ මෙට්‍රික් ටොන් 16ක් කුළුබඩු හා ඒ හා සමාන ද්‍රව්‍ය අළෙවි මණ්ඩලය වෙත භාරදෙනු ලැබූ අතර එමගින් රජයට රු.මිලි.2.38ක් අයකර ගැනීමට හැකිවිය .

b. රජයේ ආයතන වෙත වාහන මුදාහැරීම

රජයේ ආයතන කිහිපයක් විසින් මුදල් අමාත්‍යාංශ වෙත කරන ලද ඉල්ලීම පරිදි අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව විවිධ රාජ්‍ය ආයතන වෙත වාහන මුදා හැර ඇත .

c. තේ අපහරණය

රාජසන්තක කරන ලද තේ බහාලුම් දෙකක් කාබනික පොහොර නිපදවීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත භාර දෙන ලදී.

d. ඇපල් අපහරණය

කල් ඉකුත් වූ ඇපල් කි.ග්‍රෑ. 24, 906 ක් සහිත අත්හැර දමන ලද බහාලුමක් දෙහිවල, ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදී.

5. 2022 වසරේ යෝජිත ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යසාධනය

ප්‍රධාන ක්‍රියාකාරකම්	ගනු ලැබූ ක්‍රියාමාර්ග	විශේෂ කරුණු
සාමාන්‍ය හා වාහන ටෙන්ඩර අළෙවි 30ක් සිදුකිරීම	ටෙන්ඩර් අළෙවි 18ක් සිදුකරනු ලැබීය.	කොවිඩ් -19 තත්වය හේතුවෙන්
විශේෂ ටෙන්ඩර අළෙවි 10 ක් සිදුකිරීම	ටෙන්ඩර් අළෙවි 02ක් සිදුකරනු ලැබීය.	කොවිඩ් -19 තත්වය හේතුවෙන්
ආඝන්න වශයෙන් විනාශකිරීම් 70 සිදුකිරීම	විනාශ කිරීම් 83ක් සිදුකරනු ලැබීය.	ඉටුකර ඇත.
වරාය අධිකාරිය මගින් ටෙන්ඩර්/වෙන්දේසි වලදී අළෙවිකළ භාණ්ඩ පරීක්ෂා කිරීම හා තක්සේරු කිරීම සහ රජයට අයවිය යුතු ආදායම අයකර ගැනීම	තක්සේරුකර අයවිය යුතු ආදායම අයකරගනු ලැබීය.	ඉටුකර ඇත.
අත්හැර දමන ලද භාණ්ඩ පරීක්ෂා කිරීම හා ඒවා අපහරණය කිරීම	සිදුකරමින් සිටී.	ඉටුකර ඇත.

8.2 ආදායම් හා සේවා පර්ෂදය

8.2.1 ප්‍රකාශන අංශය

8.2.1.1 දිගු කාමරය

8.2.1.2 මෝටර් රථ ඒකකය

8.2.1.3 "ඩී" ශාඛාව

8.2.2 කර්මාන්ත හා සේවා අංශය

8.2.3 ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය

8.2.4 මධ්‍යම භාණ්ඩ පරීක්ෂා කිරීමේ අංශය

8.2.5 අපනයන අංශය

8.2.1 ප්‍රකාශන අංශය

හැදින්වීම

ප්‍රකාශන අංශය යනු මුහුදෙන් ප්‍රවාහනය කරන සියළුම භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ අපනයනකරුවන් විසින් රේගු ප්‍රකාශන (Cusdecs) ඉදිරිපත් කළ විට ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන ස්ථානයයි. මෙම අංශය පහත ඒකකයන්ගෙන් සමන්විත වන අතර ආදායම් හා සේවා පර්ශදය යටතේ ක්‍රියාත්මක වේ.

- "D" අංශය
- දිගු කාමරය
- මෝටර් රථ අංශය

අංශයේ විෂය ක්ෂේත්‍රය

මෙම අජශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රය වන්නේ ආනයනික භාණ්ඩ සඳහා ප්‍රකාශන පහසුකම් සැපයීමයි. මෙය සපුරා ගැනීම සඳහා මෙම අංශය මගින් පහත පරිදි පහසුකම් සපයා ඇත.

- ඉලේක්ට්‍රොනික මාර්ගයෙන් භාණ්ඩ ලේඛණ ලබාගැනීම.
- ඍජු ව්‍යාපාරික ආදාන පහසුකම (DTI) හරහා රේගු සටහන්කර ලබාගැනීම.
- රේගු සටහන්කර වලට අදාල තීරුබදු හා අනෙකුත් ගාස්තු මාර්ගගතව මෙන්ම බැංකු හරහා ගෙවීම.
- තෝරාගත් ආනයනකරුවන් සඳහා කඩිනම් නිෂ්කාශන පහසුකම සපයාදීම .
- කැපවූ නිලධාරීන් විසින් රේගු සටහන්කර පිළිබඳව කටයුතු කිරීම.
- SLPA, SAGT සහ CICT අංගන වලින් FCL බහාලුම් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසරපත් නිකුත් කිරීම .

සම්පූර්ණයෙන් ක්‍රියාත්මක "ASYCUDA World" ස්වයංක්‍රීය පරිගණක පද්ධතිය හරහා ආනයනකරුවන්ට අප්‍රමාදව රේගු සටහන්කර පිළිබඳව කටයුතු කිරීමේ පහසුකම් සළසා ඇත දැන් දෙවන මහලේ දිගු කාමරයේ ඇති . "ASYCUDA" පද්ධතිය මගින් රේගු සටහන්කරවල සියලු විස්තර ලබා ගැනීමේ කටයුතු ඉටු කරන අතර එමගින් පරිශීලකයින්ට DTI පහසුකම යොදාගෙන සිය කාර්යාලවල සිට රේගු සටහන්කර ඍජුවම ඇතුළත් කිරීමට ඉඩ සැලසේ.

අංශයේ අරමුණු

- ආනයනය භාණ්ඩ නිෂ්කාශනය පහසුකිරීම.
- භාණ්ඩ වර්ගීකරණ කටයුතු හරහා හා වෙනත් ආකාරයෙන් ආදායම් අඩුවීම් /විදේශ විනිමය අහිමි වීම අවම කිරීම.
- "D" අංශය හරහා රේගු ආඥා පනත හා අදාළ නීති වලට අනුකූලව බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම .
- ආනයන භාණ්ඩ මත පනවන බදු මගින් රජයට ලැබිය යුතු ආදායම නියමිත පරිදි ගණනය කිරීම හා එකතු කිරීම .
- මුදල් අමාත්‍යාංශය අනුමැතිය ඇති භාණ්ඩ නිෂ්කාශන ව්‍යාපෘති වලට බදු සහන ලබාදීමෙන් පහසුකම සැලසීම.
- බලපත්‍ර හිමියන්ට තම වාහන /භාණ්ඩ ඉතා ඉක්මනින් නිශ්කාශනය කිරීම සඳහා පහසුකම් සැලසීම.
- විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු/අනෙකුත් සංවිධාන/සාමාන්‍ය මහජනයාට තාවකාලික රේගු සටහන්කර හරහා භාණ්ඩ නිදහස් කර ගැනීමට පහසුකම් සැලසීම.
- රජයේ ප්‍රතිපත්ති මත තීරු බදු අඩු කිරීම/ බදු වලින් නිදහස් කිරීම හා ප්‍රමාද කිරීම ක්‍රියාත්මක කිරීම
- තහනම් කිරීම සහ සීමා කිරීම් පිළිබඳ බලාත්මක කිරීම ක්‍රියාත්මක කිරීම.

ප්‍රකාශන අංශයේ නිලධාරීන්ගේ වගකීම්.

රජයට නියමිත බදු ආදායම එකතු කරන අතරම ආනයනික භාණ්ඩ සඳහා රේගු සටහන්කර ක්‍රියා පටිපාටිය අනවශ්‍ය පමාවකින් තොරව ඉක්මනින් සිදු කිරීමට දිගු කාමරයේ නිලධාරීහු සහතික වෙතිආනයන හා අපනයන . පාලන දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර හා ඖෂධ වර්ග සඳහා වූ අධිකාරිය, ජාතික ඖෂධ නියාමන අධිකාරියශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ,, පරමාණුක බලශක්ති අධිකාරිය, විදුලි සංදේශ නියාමන කොමිසම වැනි ආයතනවල අධිකාරියට යටත්ව ගෙන්වන භාණ්ඩ සඳහා එම බලපත්‍ර ලබාගෙන තිබේද යන්න සහ ශාක නිරෝධායන සහතිකය, ධූමායන සහතිකය, කුළුබඩු මණ්ඩල සහතික සහ පූර්ණ නැවිගත කිරීමේ වාර්තාව යනාදි සහතික අපනයන කරන ලද රටවලින් නිකුත් කරන්නේ දැයි මෙම නිලධාරීන් අවධානයෙන් සිටී .
රේගු සටහන්කර සම්බන්ධයෙන් ඉක්මනින් කටයුතු කිරීම සඳහා අපනයනකරුවන්ට පහත කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටී;

- භාණ්ඩ නිදහස් කරගැනීම සඳහා භාණ්ඩ ප්‍රවාහකයාගේ අවසරය (නෞකාවෙන්) ලැබී ඇති බව;
- භාණ්ඩවල සම්පූර්ණ විස්තරය;
- සංයෝජිත භාණ්ඩ වර්ගීකරණ නාමාවලිය පදනම් කරගෙන සකස් කරන ලද ආනයන තීරුබදු නාමාවලියට අදාළව නිවැරදිව භාණ්ඩ වර්ගීකරණය කර ඇති බව;
- නියමිත විදේශ විනිමය අනුපාතය හා අදාළ මුදල් වර්ගය යොදා ගනිමින් භාණ්ඩවල වටිනාකම් ප්‍රකාශ කර ඇති බව;

- භාණ්ඩ සඳහා අදාළ ගෙවීම් පිළිගත් අවසර ලත් /බැංකුවකින් විදේශ විනිමය සම්ප්‍රේෂණය වී ඇති බව;
- අවශ්‍ය බලය පැවරීමේ ලියකියවිලි, බලපත්‍ර, අවසර පත්‍ර, සහතික යනාදිය අදාල පරිදි අමුණා ඇති බව;
- ඉහත සියලු කරුණු නියමිත පරිදි සම්පූර්ණ වී තිබේ නම් අදාල නිලධාරීන්ට භාණ්ඩ නිෂ්කාශනය සඳහා ,රේගු ප්‍රකාශනය **(Cusdecs)** සම්බන්ධයෙන් කටයුතු කළ හැකිවේ.

ඉහත සඳහන් පරිදි මෙම අංශය ප්‍රධාන අංශ/ ඒකක **03** කින් සමන්විත වේ.

8.2.1.1 දිගු කාමරය

ඓතිහාසික වශයෙන් ගත්කළ රේගු පරිපාලනයේදී දිගු කාමරය සැබැවින්ම දිගු කාමරයක් වූ අතර, අදටත් එය දැකිය හැක්කේ දිගු කාමරයක් ලෙසය. මෙය බ්‍රිතාන්‍යයේ යටත් විජිත ලෙස පැවති බොහෝ ආසියානික රටවල හා යුරෝපයේ ඉතා පැරණි රේගු සංවිධාන පැවති සමහර රටවල (උදා: ඩෙන්මාර්කය හා නෙදර්ලන්තය) දැකිය හැකි පොදු ලක්ෂණයකි. රේගුව ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආදායම එකතු කරන රාජ්‍ය ආයතනයක් බැවින් මෙම දිගු කාමරයේ වැදගත්කම සුළුකොට තැකිය නොහැක. එවකට පැවති විශාල ප්‍රමාණයේ ඉලක්කයන් කාලය ගත වීමත් සමග ක්‍රමයෙන් සමාජ ආරක්ෂණ බැඳීම් බවට පරිණාමය වී ඇති නමුත් ආදායම එකතු කිරීමේ ප්‍රමුඛතාවයේ වෙනසක් සිදුව නොමැත.
රේගු ආඥා පනතේ **10** වනවගන්තිය මගින් රේගු බදු හා වෙනත් ගාස්තු අය කිරීමට රේගුවට බලය පවරන අතර එහි **47** වන වගන්තිය අනුව භාණ්ඩ ආනයනය කරනු ලබන තැනැත්තා විසින් ඒ පිළිබඳ සැබෑ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර එකී භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළු බදු (තීරු බදු ඇතුළුව) ගෙවිය යුතුය.

රේගුව විසින් රේගු බදුවලට අමතරව පහත දැක්වෙන බදු වර්ගද අයකිරීම සඳහා පහසුකම් සලසනු ලැබේ;

එකතු කළ අගය මත බද්ද	(VAT)
වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්ද	(PAL)
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	(SCL)
නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)	(XID)
අනෙකුත් රජයේ ආයතන වෙනුවෙන් සෙස් බදු	(CESS)

රේගු සටහන්කර සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් අංශ **05**කට බෙදා ඇත. (එක් ඒකකයක් රේගු අධිකාරිවරුන් දෙදෙනෙක් සහ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරු හතර දෙනෙකුගෙන් (තක්සේරු නිලධාරි) සමන්විත වේ.අධීක්ෂණය හා පරිසරණය කිරීමේ පහසුව සඳහා රේගු සටහන් පහත පරිදි එක් එක් ඒකකය වෙත වෙන්කර ඇත.

A අංශය	-	රේගු සටහන්කරයන්හි අවසන් අංක	**0-9**
B අංශය	-	රේගු සටහන්කරයන්හි අවසන් අංක	**1-8**
C අංශය	-	රේගු සටහන්කරයන්හි අවසන් අංක	**2-7**
D අංශය	-	රේගු සටහන්කරයන්හි අවසන් අංක	**3-6**
E අංශය	-	රේගු සටහන්කරයන්හි අවසන් අංක	**4-5**

රේගු සටහන්කර ඉදිරිපත් කිරීම.

CusDec යනු රේගු ප්‍රකාශනය /රේගු සටහන්කරය හෙවත් **Customs Declaration** යන ඉංග්‍රීසි යෙදුමේ කෙටි යෙදුමයි .ආනයනකරු විසින් ඉලෙක්ට්‍රොනිකව **CusDec** ඉදිරිපත් කළ යුතුය .**CusDec** සමග පහත සඳහන් ලේඛන ද ඉදිරිපත් කල යුතුය . (**PDF** හෝ පරිලෝකනය කරන ලද පිටපත්)

- නෞවි භාර පත්‍රය
- භාර දීමේ නියෝගය
- ඉන්වොයිස් පත්‍රය (විදේශ විනිමය අදාළ නොවන පදනම්න් භාණ්ඩ ආනයනයකදී හැර බැංකුව විසින් අත්සන් කර සහතික කරන ලද)
- ඇසුරුම් ලේඛනය
- සංයෝජිත වර්ගීකරණය **(HS)** හඳුනා ගැනීමට අදාළ යම් තාක්ෂණික තොරතුරක්
- නිෂ්පාදිත රට තහවුරු කිරීමට අදාළ ලියවිලි
- ආනයන භාණ්ඩ සීමා කල භාණ්ඩ නම් ඊට අදාළ ආනයන බලපත්‍ර/ **ICL**, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය , ජාතික ඖෂධ නියාමන අධිකාරියේ **(NMRA)** ආදී බලපත්‍ර
- ණයවර ලිපි, විදුලි සංදේශ හුවමාරු වැනි විනිමය සංසරණ ක්‍රමය ගැන තහවුරු කිරීමක්
- වෙනත් විශේෂ ලේඛන (රාජ්‍ය තාන්ත්‍රික, තීරු බදු සහන,ශාක සනීපාරක්ෂක සහතිකය, ධූමායන සහතිකය, කුළුබඩු මණ්ඩල සහතිකය, නැවේ භාණ්ඩ පැටවීම සඳහා මිණුම් වාර්තාව ආදිය)
  රේගු ආඥාපනතේ **12** හා **343** වගන්ති සහ ආ උපලේඛනයට අනුව රේගුව වෙත බලය පවරා ඇති පරිදි භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේදී රේගුව විසින් වෙන්ත ඕනෑම නීතියකින් පනවා ඇති සීමාවන් හා තහනම් කිරීම් බලාත්මක කිරීම කළ යුතුය. මෙම ඉතා පුළුල් විධිවිධානයන්හි ප්‍රතිඵලයක් ලෙස දැනට ක්‍රියාත්මකව පවතින පනත්, ආඥාපනත් හා රෙගුලාසි විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීමට රේගුවට සිදු වේ. **1969** අංක **01** දරණ ආනයන හා අපනයනපාලන පනත මේ අතරින් ප්‍රධාන වේ.

8.2.1.2 මෝටර් රථ ඒකකය

ACCESS ජාලයේ නියුතු **"AsyCuda World'** මෘදුකාංගය මගින් දැන් ශ්‍රී ලංකා රේගුවට භාණ්ඩ ආනයනයේදී සම්ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය පරීක්ෂා කිරීම සඳහා බැංකු සමඟ සම්බන්ධවීමට හැකිවේ**ආනයනය .** කරනු ලබන වාහන ලියාපදිංචිය සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සබැඳිය හරහාවාහන ආනයන තොරතුරු ලබා දෙන අතර එමගින් තීරු බදු හා රේගුව මගින් අයකරනු ලබන අනෙකුත් ගාස්තු නොගෙවන ලද වාහන ලියාපදිංචිය වැළැක්වීම සිදු වේරේගු ස .ථහන් හා සම්බන්ධව කටයුතු කිරීමේදී නිලධාරීන් පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

- ත්‍යාග වාහන හා පරණ වාහන සඳහා ආනයන පාලන බලපත්‍ර **(ICL)**
- රාජ්‍ය සේවකයන්ටපාර්ලිමේන්තු නියෝජිතයන්ට හා ආයෝජන මණ්ඩලය සඳහා සහනදායී හා , තාවකාලික ආනයන බලපත්‍ර
- රාජ්‍ය තාන්ත්‍රිකයන්ට හා රාජ්‍ය නොවන සංවිධානවලට විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද තීරුබදු රහිත බලපත්‍ර
- ව්‍යාපෘති සඳහා ආනයනය කරන ලද වාහන සඳහා තාවකාලික රේගු සටහන්කර පිළියෙල කිරීම.

වාහන සඳහා රේගු සටහන්කර පිළියෙල කිරීමේදී ඒකකයේ නිලධාරීන් පහත සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කළ යුතුය .භාණ්ඩ විස්තර පහත ලේඛණ පරිදි නිසියාකාරව දක්වා ඇතිදැයි පරීක්ෂා කර බැලීම .

- ලියාපදිංචි කිරීමේ සහතිකය
- පරීක්ෂා කිරීමේ සහතිකය
- ඉන්වොයිසිය
- අංගනයේදී වාහන පරීක්ෂාකරන තක්සේරුකරු විසින් ලබාදුන් වාහනය පරීක්ෂා කිරීමේ වාර්තාව.
- ඉන්වොයිසිය අනුව වාහනයේ වයස නිවැරදිව ගණනය කිරීම.
- නිෂ්පාදිත රට නිවැරදිව ප්‍රකාශ කිරීම.
- නැව් ගාස්තු නිවැරදිව ප්‍රකාශ කර ඇත්ද යන වග
- සඳහන් කරන ලද උපාංග පරීක්ෂා කිරීමේ සහතිකය සමඟ ගැලපීම.
- සහනදායී ආනයන සමඟ අදාල බලපත්‍රය ලබාදේ.
- ආනයන හා අපනයන පාලකවරයා විසින් විවිධ ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත්තරන ලද කාවකාලිකව තහනම් කරන ලද කාණ්ඩ යටතට ගැනේද යන්න

නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ .විසින් වාහන නිෂ්කාෂණය සඳහා අවසර ලබාදේ (රථ වාහන)

8.2.1.3 "D" ශාඛාව

"D" ශාඛාව අංශයේ ලේකම් කාර්යාලය ලෙස සැළකිය හැකි අතර ඓතිහාසික වශයෙන් වසර **200**කට පමණ පෙර රේගු පාලක ජෙනරාල්වරයා පත්කිරීමේදී**'A'** විෂයය, **'B'** විෂයය **'C'** විෂයය, **'D'** විෂයය යනාදී ලෙස විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඔහු යටතේ ලිපිකරුවන් හතර **(4)**දෙනෙකු සේවයේ නියුතුව සිට ඇත. **'A'** විෂයයට අදාල ලිපිකරු **"**වරාය ගාස්තු**"** සම්බන්ධ රාජකාරි ඉටුකළ අතර පසුව එය වරාය අධිකාරිය නමින් විකාශයවී වෙනම ආයතනයක් ලෙස ස්ථාපනය වියනැවි ,තීරුබදු සහන හා බදු නිදහස් කිරීම් ලබාදීම . භාණ්ඩ ලේඛණ භාරගැනීම සඳහා ඓතිහාසික වශයෙන් භාණ්ඩාගාරය හා රේගුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකළ පැරණි **"D"** ශාඛාව තවමත් අඩු හෝ වැඩි වශයෙන් එම කාර්යයන් ඉටු කරන අතර දිගටම මුල් නමින්ම හැඳින්වේ.
ආනයනකරුවන්සාමාන්‍ය මහජනයා සඳහා පහසුකම් සැළසීමට/**"D"** ශාඛාව සතුව අංශ කීපයක් පවතී. ඒවා නම්

- **DRA** අංශය
- බැංකු ඇපකර අංශය
- තීරුබදු සහන අංශය
- තොග භාණ්ඩ අධීක්ෂණ අංශය
- **Carnet** අංශය
- නැව් බඩු ලේඛන අංශය
- විමර්ශන අංශය
- නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) යටතේ ඇති මෝටර් රථ බලපත්‍ර පරීක්ෂා කිරීමේ හා අවලංගු කිරීමේ අංශය

"D" ශාඛාව විසින් පාලනය කරනු ලබන වැදගත් මෙන්ම ප්‍රමුඛ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

- මුදල් අමාත්‍යාංශය මගින් ලබාදෙන තීරුබදු සහන ලියාපදිංචි කිරීම සහ තීරුබදු රහිත පදනම මත එම භාණ්ඩ නිෂ්කාශනයට පහසුකම් ලබාදීම .

- පාර්ලිමේන්තුව අනුමත කරන ලද ආදායම් සංරක්ෂණ ආඥාව අනුව තීරුබදු සහන හා නිදහස් කිරීම් ලබාදීම.
- විදේශ කටයුතු අමාත්‍යාංශය ලබාදුන් අනුමැතිය ප්‍රකාරව තානාපති කාර්යාල සේවකයන්ගේ පුද්ගලික භාණ්ඩ හා රාජතාන්ත්‍රික භාණ්ඩ නිෂ්කාශනයට අවසර දීම .
- විවිධ වෙළඳ ගිවිසුම් යටතේ ආනයනය කරන භාණ්ඩ සඳහා නිදහස් තීරුබදු හෝ වරණීය තීරුබදු අනුපාත ලබාදීම.
- මුදල් අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ රාජ්‍ය ආයතන සඳහා වූ භාණ්ඩ නිෂ්කාශනයේදී පසුව ගෙවීම් කොන්දේසි ලබාදී පහසුකම් සැලසීම .
- භාණ්ඩ නිෂ්කාශනය සඳහා විවිධ හේතු මත රේගු සටහන්කර ඉක්මණින් ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවල හා තාවකාලික ප්‍රකාශපත්‍ර **(Provisional Basis)** ක්‍රමය යටතේ යම් කාර්යයක් සඳහා ආනයනය කර ප්‍රතිඅපනයනය සිදුකරන අවස්ථාවල ඒ සඳහා පහසුකම් සැලසීම.
- මුදල් අමාත්‍යාංශයේ තීරණය මත ප්‍රතිආනයනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති භාණ්ඩ ලියාපදිංචිය හා අධීක්ෂණය කිරීම.
- නාවික නියෝජිතයන් විසින් ඉදිරිපත් කරනු ලබන නැව් බඩු ලේඛන භාර ගැනීම හා ඒවා සංශෝධන කිරීම .
- රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) ගේ තීරණ පරිදි තාවකාලික රේගු සටහන්කර හා අනෙකුත් කාරණා සම්බන්ධයෙන් බැංකු ඇපකරආයතනික ඇපකර ලබාගැනීම /.
- **CPD Carnet** හෝ **ATA Carnet** මත තාවකාලිකව ආනයනය කරන ලද වාහන සහ උපකරණ අධීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම.
මිල පිරික්සුම් දත්ත ගබඩාවේ වෙළඳ භාණ්ඩවල මිල අඩංගු වේ. ආනයන රේගු ප්‍රකාශන තක්සේරු කිරීමේදී රේගු නිලධාරීන්ට එහි ප්‍රකාශ කර ඇති වෙළඳ භාණ්ඩ අගයන් තහවුරු කිරීමට අවශ්‍යදැයි තීරණය කිරිකමට මෙම දත්ත ගබඩාවට යොමුවිය හැකිවේ. එබැවින් එය අවදානම ඇගයීමේ මෙවලමක් වේ.

මිල නියම කිරීමේ දත්ත ගබඩාව ආනයනය කරන ලද වෙළඳ භාණ්ඩ සඳහා වටිනාකම් හා වටිනාකම් පරාසයක් නිශ්චිතව දක්වා නොමැත. එය අඩුවෙන් හෝ වැඩියෙන් තක්සේරු කිරීමේ හැකියාව සඳහා රේගු නිලධාරීට මෙවලමක් වේ. එබැවින්, ශ්‍රී ලංකා රේගුව සම්පූර්ණයෙන්ම මෙම අගයන් මත පදනම්ව වටිනාකම් පිළිගැනිම හා ප්‍රතික්ෂේප කිරීම සිදු නොවේ. දත්ත ගබඩාව ප්‍රකාශිත අගයන්ගේ අවදානම් මට්ටම ඇගයීම සඳහා යොදා ගැනේ.

<u>කුමන ආකාරයේ අගයන් මිල නියම කිරීමේ දත්ත ගබඩාවේ ඇතුලත්ව තිබේද?</u>

දෙයාකාරයක අගයන් සුදුසු ලෙස සැළකේ

ගනු දෙනු අගයන්

පෙර ප්‍රකාශයට පත්කරන ලද ඒවායේ සත්‍යතාව තහවුරුකර ගැනීම සඳහා තක්සේරු කර ඇති මෙම අගයන් **NIVDU** නිලධාරීන් විසින් තෝරාගනු ලැබේ . අසිරු කාර්යයන් වන මෙය ව්‍යාපෘතිය සකස් කිරීමේ දෙවන අදියරේදී මෘදුකාංග විසඳුමක් මගින් සහයවීමට සැලසුම්කර ඇත.

ගනු දෙනු නොවන අගයන්

විවිධ තහවුරු වූ ප්‍රභවයන්ගෙන් මෙම ආකාරයේ දත්ත එක්රැස් කරගනු ලැබේ . විශේෂ ගනුදෙනුවක් පදනම් නොවූ වෙළඳ භාණ්ඩවල අගය ගනු දෙනු නොවන අගයන්වේ . උදා ලෙස යම් දිනක **OPEC** බොර තෙල් මිල එවැනි අගයක්වේ.

අප්‍රේල් මාසයේදී **2021 , NIVDU** විසින් **Tridge** වෙළඳපල ප්‍රවේශය මිළදී ගනු ලැබීය . මෙමගින් විවිධ ගෝලීය වෙළඳපලවල් වලින් අපගේ දත්ත ගබඩාව සඳහා කෘෂිකාර්මික හා ආහාර භාණ්ඩවල යාවත්කාලීන අගයන් ලබාගැනීමේ හැකියාව ලැබේ . තවද, ශ්‍රී ලංකා රේගුවට වටිනාකම් ප්‍රවණතා, පුරෝකථන හා හදිසි දැනුම්දීම් පිළිබඳ වටිනා දත්ත ලබාදේ.

NIVDU මේ වනවිට තහවුරු වූ දත්ත ප්‍රභව හතරක් මගින් ගනු දෙනු නොවන දත්ත ලබාගනී. තවද නව ප්‍රභයන් මිල පිරික්සුම් දත්ත ගබඩාව සඳහා ක්‍රියාකාරීව උපකාරීවීමට හා එහි ඵලදායිතාවය ඉහල නැංවීමට අපේක්ෂා කෙරේ.

පශ්චාත් නිෂ්කාශන විගණන අංශයේ කාර්යසාධනය -2022

විස්තරය	**2022**
වසර තුළ ලියාපදිංචිවූ පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව	87
අවසන් කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව (පෙර ලියාපදිංචි සිද්ධි ඇතුළුව)	61
සිදුකරන ලද පද්ධති පාදක විගණන සංඛ්‍යාව	5
පශ්චාත් විගණන සිද්ධි මගින් වැරදි බවට අනාවරණය වූ සිද්ධි සංඛ්‍යාව සහ නියම කළ රාජසන්තක කිරීම් දඩ/ (රු)	53
රාජසන්තක කිරීම්(රු) දඩ මුදල් වල මුළු එකතුව /	1,241,730,804
භාණ්ඩ විකිණීමෙන් එකතු කරගත් මුළු මුදල (රු)	-
අතිරේක සටහන් කර ලෙස එකතු කරගත් මුළු මුදල (.රු)	10,107,147
අයකරගත් මුළු මුදල (රු)	1,156,461,867

2018 සිට 2022 දක්වා කාර්යසාධනය සංසන්දනය

	2018	**2019**	**2020**	**2021**	**2022**
වසර තුල ලියාපදිංචිවූ පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව	102	179	91	119	87
අවසන් කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව (පෙර ලියාපදිංචි සිද්ධි ඇතුළුව(	61	52	39	35	61
දඩුවම් නියම කරන ලද විගණන සංඛ්‍යාව රාජසන්තක කිරීම්දඩ /	61	52	8	27	53
රාජසන්තක කිරීම්දඩ මගින් අයකර / (.රු) ගත් මුළු ප්‍රමාණය	604,850,139	458,422,599	72,295,530	811,681,718.68	1 ,146,354,720
රාජසන්තක කරන ලද භාණ්ඩ වල මුළු වටිනාකම (.රු)	නැත	නැත	නැත	25,496,969.00	9,468,662
අතිරේක සටහන් කර ලෙස එකතු කරගත් මුළු මුදල (.රු)	56,653,753	4992	නැත	16,304,877.00	10,107,147
අය කරගත් මුළු මුදල (.රු)	**661,503,892**	**458,327,591**	**72,295,530**	**853,483,564.68**	**1 ,156,461,867**

2018 සිට 2022 දක්වා කාර්යසාධනය සංසන්දනය

වසර	වසර තුල ලියාපදිංචිවූ පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව	අවසන් කරන ලද පශ්චාත් විගණන සිද්ධි සංඛ්‍යාව (පෙර ලියාපදිංචි සිද්ධි ඇතුළුව(	දඩුවම් නියම කරන ලද විගණන සංඛ්‍යාව රාජසන්තක කිරීමදඩ /
2018	102	61	61
2019	95	52	52
2020	91	39	8
2021	119	35	27
2022	87	61	53



ආදායම් එකතුව

වසර	එකතුකළ ආදායම් (රු.)
2018	661,503,892
2019	458,327,591
2020	72,295,530
2021	853,483,564.68
2022	1,156,461,867



2018, 2019, 2020, 2021 සහ 2022 වසරවල ලියාපදිංචි කරන ලද හා නිමකරන ලද සිද්ධි සංඛ්‍යාව

වසර	ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව	අවසන් කරන ලද සිද්ධි සංඛ්‍යාව
2018	102	61
2019	95	51
2020	91	8
2021	119	35
2022	87	53



8.3.2.3 ආපසු ගෙවීමේ ශාඛාව

ආපසු ගෙවීමේ අංශය ආයතනික අංශය යටතේ ඇති අනුකූලතා හා පහසුකම් සැළසීමේ අංශයේ එක් කොටසක් වේ. ආපසු ගෙවීමේ අංශය මගින් මූලිකවම රේගු ආඥා පනතේ (235 වන අධිකාරිය) 18 හා 22 වන වගන්ති යටතේ යම් විදේශීය වරායකට ප්‍රති-අපනයනය කිරීම මත ආනයන හා අපනයන තීරුබදු වැඩිපුර ගෙවීම් ප්‍රතිපූරණය කිරීම හා යම් විදේශීය වරායකින් ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රතිපූරණය කිරීම සිදුකරනු ලැබේ.

ගෙවීම් සිදුකරන ලද දිනයේ සිට මාස 24 ක කාලසීමාවක් තුළ හිමිකම් ඉල්ලා සිටින්නේ නම්, රේගු ආඥා පනතේ 18 වන වගන්ති යටතේ අනයනය හෝ අපනයනය කරන ලද භාණ්ඩ සඳහා වැඩිපුර ගෙවන ලද තීරු බදු හා ගාස්තු ආපසු ගෙවීම

සඳහා ආනයනකරුවකුට හිමිකම් ඇත. යම් විදේශීය වරායකට ප්‍රතිඅපනයනය කිරීම මත එම තීරු බදු වලින් දහයෙන් පංගු නවයකට වැඩි නොවන මුදලක් ආපසු ලබාගැනීමට රේගු ආඥා පනතේ **18** වන වගන්ති යටතේ අපනයනකරුට හිමිකම් ඇත්තේය.

අයකර ගැනීමේ හිමිකම් තත්වය – 2022

	2022
ලියාපදංචිවූ අයදුම්පත් හිමිකම් සංඛ්‍යාව /	93
සම්පූර්ණ කරන ලද ආපසු ගෙවීම් (පෙර ලියාපදිංචි කිරීම් ඇතුළුව (	79
ප්‍රතික්ෂේපවූ අයදුම්පත්හිමිකම් /	15

අයකර ගැනීමේ හිමිකම් තත්වය පෙර වර්ෂයන්හි - (2018 සිට 2022)

වර්ෂය	**2018**	**2019**	**2020**	**2021**	**2022**
ලියාපදංචිවූ අයදුම්පත් හිමිකම් සංඛ්‍යාව /	219	155	53	75	93
සම්පූර්ණ කරන ලද ආපසු ගෙවීම් (පෙර ලියාපදිංචි කිරීම් ඇතුළුව (	49	36	45	96	79
ප්‍රතික්ෂේපවූ අයදුම්පත්හිමිකම් /	3	15	7	32	15



නිගමනය

මුදල් අමාත්‍යාංශය මගින් දක්වා ඇති ආදායම් ඉලක්ක ලභාකර ගැනීමේදී **2022** වසර ශ්‍රී ලංකා රේගුවට අභියෝගාත්මක වසරක් විය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය සුරක්ෂිත කිරීම සඳහා කලින් කලට ගන්නා ලද රාජ්‍ය ප්‍රතිපත්ති තීරණයන්ට සහාය වීම පිණිස භාණ්ඩ ආනයනය මෙන්ම ගෙවීම් නියමයන් පිළිබඳව විවිධ පාලන ක්‍රම, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව හරහා හඳුන්වා දී ඇතිබව නිරීක්ෂණය කළ හැක.

එකී සන්දර්භය තුළ ලබා දී ඇති ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහ එහි අරමුණු සපුරාගැනීම සඳහා එදිනෙදා මෙහෙයුම් කරගෙන යාමද අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශයට අභියෝගාත්මක විය. කෙසේවුවද, ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරමින් පවරා ඇති වගකීම් ඉටුකිරීමට සහ ලබා දී ඇති ඉලක්ක සපුරාලීමට මෙම අංශයට හැකිවිය.

2022 වසරේදී පශ්චාද් නිෂ්කාශන විගණන ශාඛාවේ නලධාරීන් විසින් පශ්චාද් විගණන සිද්ධි **87**ක් ලියාපදිංචි කර ඇති අතර ඔවුනට සිද්ධි **61**ක් අවසන් කිරීමට හැකි වී ඇත. රේගු වැරදි බවට තහවුරු වූ පශ්චාද් විගණන සිද්ධි සංඛ්‍යාව **53** කි. අතිරේක අයකර ගැනීම් ලෙස එකතු කරගත් මුළු මුදල රු. **10,107,147/-** කි. රාජසන්තක කිරීම්/ දඩ ලෙස අයකර ගත් මුළු මුදල රු. **1,146,354,720/-** ක් වේ.

කාර්යසාධනයට අදාළ දත්ත විශ්ලේෂණය කිරීමේදී නිරීක්ෂණය වන්නේ පසුගිය වසර **4** හා සැසඳීමේදී වැඩිම අයකර ගැනීම් ප්‍රමාණයක් සිදුකර ඇත්තේ **2022** වර්ෂයේදි බවයි. ලියාපදිංචි කරන ලද සිද්ධි සංඛ්‍යාව හා සැසඳීමේදී අවසන් කරන ලද සිද්ධි ප්‍රතිශතය **70%** කි. අවසන් කරන ලද සිද්ධි වලින් **87%** ක්ම වැරදදි බවට තහවුරු කරගෙන දඩ හා රාජසන්තක කිරීම් නියම කර ඇති බව ද ඉතා වැදගත් වේ. වෙළඳුන්ගේ අනුකූලතා මට්ටම තවමත් සතුටුදායක මට්ටමකට පැමිණ නොමැති බවටත් එය තවමත් **13%** ක අගයකට සීමා වී ඇති බවටත් මෙයින් ඇඟවීමක් ලබා දේ.

මෙම අංශයට අනුයුක්ත ආපසු ගෙවීමේ ශාඛාවට ආපසු ගෙවීම සඳහා වන අයදුම්පත් **93** ක් ලැබී ඇති අතර **85%**ක ඍර්ථකත්වයක් පෙන්නුම් කරමින් ආපසු ගෙවීම් නිමිකම් **79** ක් අවසන් කිරීමට ශාඛාවට හැකි වී ඇත.

සේවක සංඛ්‍යාව වැඩි කිරීමට සහ කලින් කලට පුහුණුව ලබා දීමට පරිපාලනය සුදුසු පියවර ගන්නේ නම් අනුකූලතා සහ පහසුකම් සැලසීමේ අංශයේ කාර්යසාධනය වඩාත් ඵලදායී අයුරින් ඉහළ නැංවිය හැකි වන බව අවසාන වශයෙන් සඳහන් කර සිටීම වැදගත් වේ.

8.3.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය (ICT)

හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අරමුණු වන්නේ පැය 24 පුරාම නිරන්තරයෙන් රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කිරීමේ කටයුතු හා අන්තර්ජාල සේවාවන් ලබාදීමේදී දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය තාක්ෂණ, සේවා සහ පහසුකම් ලබාදීම වේ. රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කිරීම පූර්ණ වශයෙන් ස්වයංක්‍රියකරණය කිරීමෙන් ඵලදායි හා ප්‍රතිඵලදායි පරිපාලනයක් උදෙසා වේගවත්, ගුණාත්මක සහ විශ්වාසනීය තොරතුරු පද්ධතියක් සහතික කරයි. මෙම අංශය මේ වනවිට වඩාත් ඵලදායි හා බිඳ වැටීම් වලින් තොර තොරතුරු තාක්ෂණ පදනම් කරගත් පද්ධති ස්ථාපිත කිරීමටත්, රේගු ප්‍රකාශන ඊට අදාළ ලේඛන, ඉලෙක්ට්‍රොනිකව ගබඩා කර තබාගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

ප්‍රධාන කාර්යයන්:

- ස්වයංක්‍රීයකරණය තුලින් ආයතනික අරමුණු ඉටුකර ගැනීමට සහාය වීම.
- පද්ධති ජාලය, පරිගණක හා දත්ත සමුදාය සාර්ථක ලෙස නඩත්තු කිරීම.
- රේගු පාලනයට, අනෙකුත් රේගු අංශයන්ට, අනෙකුත් රජයේ ආයතනවලට හා පාර්ශවකරුවන්ට නිසි කලට නිවැරදි තොරතුරු වාර්තා ලබාදීම.
- ගෝලීය වැඩි දියුණු කිරීම් වලට සමගාමීව ඵලදායී අයුරින් පවත්නා පද්ධති (“අසිකුඩා” භාණ්ඩ පාලන පද්ධතිය, මෝටර්වාහන තොරතුරු පාලන පද්ධතිය හා “තිනෙත්” පද්ධතිය) පිළිබඳ ඇගයීම් සිදුකිරීම සහ යාවත්කාලීන කිරීම
- අධීක්ෂණ මෙහෙයුම් අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම අංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම සමග වෘත්තීය ගුණාත්මකභාවය වර්ධනය කිරීම
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ පරිගණක සාක්ෂරතාව / තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම හා තොරතුරු තාක්ෂණ මොඩියුල ක්‍රියාකාරිත්වය පිළිබඳ පුහුණු වැඩසටහන් පුළුල් කිරීම.

1. පද්ධති වැඩිදියුණු කිරීම	
කාර්යය	තත්වය
ආනයන ප්‍රේශණ ක්‍රියාවලීන් ASYCUDA ගෝලීය පද්ධතියට එක්කිරීම	සම්පූර්ණ කර ඇත
ගුවන් භාණ්ඩ සඳහා වන භාණ්ඩ ලේඛන ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය කිරීම	සම්පූර්ණ කර ඇත
වරාය අධිකාරිය අතර නිසි සහ සුරක්ෂිත දත්ත සන්නිවේදනයක් පවත්වා ගැනීම	සම්පූර්ණ කර ඇත
රේගු සටහන්කරයේ යාවත්කාලීන කිරීම් සහ තත්ත්වය වෙනස්වීම් පිළිබඳව කෙටි පණිවුඩ සේවාවක් මගින් වෙළඳුන් දැනුවත් කිරීම සඳහා වන පද්ධතියක්	සම්පූර්ණ කර ඇත
UPB ගබඩාවන්හි ASYCUDA පද්ධතියට රේගු සටහන්කර හඳුන්වාදීම මගින් බදු එකතු කිරීම ස්වයංක්‍රියකරණය කිරීම	සම්පූර්ණ කර ඇත
රේගු මූලස්ථානයේ පැරණි/ පවත්නා ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම	සම්පූර්ණ කර ඇත
දූර්වලතාවන් අඩුකිරීම සඳහා අවසන් අන්ත උපකරණයන්හි ආරක්ෂාව ඉහළ නැංවිය යුතුය.	සම්පූර්ණ කර ඇත
ශ්‍රී ලංකා රේගුවේ භාවිතය සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් යෝජනා කරන ලද අභ්‍යන්තර තැපැල් සහ ලේඛන ගැලීම් කළමනාකරණ පද්ධතිය.	සම්පූර්ණ කර ඇත
ගුවන් තොටුපළෙහි තීරු බදු රහිත දීමනා ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභා නියෝග මත පදනම්ව වැඩිදියුණු කෙරෙමින් පවතින පරිගණක පද්ධතියක්	සම්පූර්ණ කර ඇත
ශ්‍රී ලංකා රේගුවේ පවත්නා වෙබ් අඩවිය අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	සම්පූර්ණ කර ඇත
ශ්‍රී ලංකා රේගුවේ පද්ධතීන් පිළිබඳව ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය මගින් ලබා දෙන ලද ආරක්ෂාව ආශ්‍රිත ප්‍රතිපෝෂණය	ක්‍රියාත්මකව ඇත.
අනෙකුත් රාජ්‍ය සංවිධානයන්හි අනුමත කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රියකරණය කිරීම සඳහා එම සංවිධාන ASYCUDA පද්ධතිය සමග ඒකාබද්ධ කිරීම	ක්‍රියාත්මකව ඇත.
රේගු මූලස්ථාන අනු නියෝජිතයින් විසින් ඔවුනගේ අදාළ කාවකාලික හඳුනාගැනීමේ අංක සමග ඉදිරිපත් කරනු ලබන රේගු සටහන්කර සඳහා වෙළඳුන්ගෙන් අනුමැතිය ලබාගැනීමට පද්ධතියක් .	ක්‍රියාත්මකව ඇත.
කඩදාසි රහිත රේගු සටහන්කර සකස්කිරීම සඳහා ඩිජිටල් අත්සන	ක්‍රියාත්මකව ඇත.

රේගු ASYCUDA ගෝලීය පද්ධතිය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල නැවිගත කිරීමේ දත්ත සපයන්නන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධති අතර ASYHUB ස්ථාපනය කිරීම මගින් ගෝලීය සමුද්‍රීය වෙළඳාම ඩිජිටල්කරණය කිරීම	ක්‍රියාත්මකව ඇත.
අපනයන අංශය ස්වයංක්‍රීයකරණය කිරීම - අපනයන අංශය තුළ කඩදාසි රහිත සැකසුම් ස්ථාපිත කළ යුතුය.	ක්‍රියාත්මකව ඇත.
බැඳුම්කර අංශය ස්වයංක්‍රීයකරණය කිරීම - බැඳුම්කර අංශය තුළ කඩදාසි රහිත සැකසුම් ස්ථාපිත කළ යුතුය.	ක්‍රියාත්මකව ඇත.

2. පද්ධති නඩත්තු කිරීම	
කාර්යය	යාවත්කාලීන කිරීම් සංඛ්‍යාව
බදුකරණ රීති යාවත්කාලීන කිරීම සහ තීරු බදු යාවත්කාලීන කිරීම	216
පරිගණක පද්ධතියට හානිකර මෘදුකාංග වැඩසටහන් **(systems bugs)** ඉවත් කිරීම	523
පාලන වගු යාවත්කාලීන කිරීම	405
දත්ත පද්ධති කාර්ය සාධනය සුසර කිරීම	257

3. සංඛ්‍යාලේඛණ හා වාර්තා කිරීම				
ආකාරය	ඉල්ලීම් කරන ලද	නිමකරන ලද	කටයුතු කළ යුතුව ඇති	එකතුවූ මුදල් (රු)
වාර්තා සංඛ්‍යාව රේගුවෙන් පිටත -	3548	3548	0	1,624,550
වාර්තා සංඛ්‍යාව රේගුව ඇතුලත -	984	984	0	

4. විගණනය			
අයිතමය	ආරම්භ කරන ලද	නිමකරන ලද	කටයුතු කළ යුතු
සිද්ධි සංඛ්‍යාව	47	35	12
	රඳවාගනු ලැබූ	නිදහස් කරන ලද	
බහාළුම් සංඛ්‍යාව	44	35	
	ලිහිල් කරන ලද රාජසන්තක කිරීම් (රු.)	දණ්ඩන (රු)	අතිරේක සටහන්කර
අයකර ගනු ලැබූ ප්‍රමාණය (රු.)	27,229,050	275,000	999,372

5. සහයක මධ්‍යස්ථානය **(HELP DESK)**		
වාර්තාවූ ගැටළු ආකාරය	ලැබූ හා නිම කරන ලද	කටයුතු කළ යුතු
WH,CDN, බිලෙන්ඩ් ෂීට්, ප්‍රේෂණ හා රේගු සටහන්කර පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම	1452	නැත
ඉලෙක්ට්‍රොනික ගෙවීම් පිළිබඳ ගැටළු	1052	නැත
THINETH පද්ධතියේ ගැටළු විසඳීම	213	නැත
ක්ෂණික ඇමතුම් ජංගම දුරකතන අංකය හරහා පාරිභෝගික සහය	දෛනික ඇමතුම්200-250	නැත
රේගුවේ යෙදවුම් නඩත්තු කිරීම	158	නැත
ඉලෙක්ට්‍රොනික ලේඛන ලියාපදිංචි කිරීම සහ ගැටළු විසඳීම	643	නැත
6. ජාල පරිපාලනය		
කාර්යය	ලැබූ හා නිම කරන ලද	කටයුතු කළ යුතු
Fortinet Internal Firewall පරිපාලන කාර්යයන්	291	නැත

CheckPoint External Firewall පරිපාලන කාර්යයන්	580	නැත
APN රවුටරය නිකුත් කිරීම හා දුරස්ථ ස්ථානයන්හි වින්‍යාසය සකස් කිරීම	201	නැත
ජාල නඩත්තු කිරීමේ කාර්යයන්	842	නැත
ගැටළු විසඳීම හා මූලික ජාල ගැටළු විසඳීම	483	නැත
7. ජාල පරිපාලනය		
කාර්යය	ලැබූ හා නිම කරන ලද	කටයුතු කළ යුතු
Zimbra විද්‍යුත් තැපැල් සර්වරය පරිපාලනය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ කාර්යය	≈550 (දිනපතා අධීක්ෂණය සහිතව)	නැත
Zimbra පරිශීලක ලියාපදිංචිය හා වින්‍යාසය සැකසීමේ කාර්යයන්	≈203 (ඉල්ලිම් පදනම්ව)	නැත
IBM AIX සර්වර් අධීක්ෂණ හා පරිපාලන කාර්යයන්	≈454 (දිනපතා අධීක්ෂණය සහිතව)	නැත
Oracle VMware පරිපාලන කාර්යයන්	≈453 (දිනපතා අධීක්ෂණය සහිතව)	නැත
සර්වර් අධීක්ෂණය කිරීම හා වින්‍යාසය සැකසීම	≈456 (දිනපතා අධීක්ෂණය සහිතව)	නැත
සර්වර් සඳහා අවශ්‍ය මෘදුකාංග ස්ථාපනය කිරීම	75	නැත
එදිනෙදා සර්වර් පරිපාලන කාර්යයන්)**Cert** අළුත් කිරීම, ධාරිතාව පුළුල් කිරීම ආදී)	≈151	නැත
ක්‍රියාකාරී නාමාවලි පරිශීලක ලියාපදංචිය හා වින්‍යාසය සැකසීම	230	නැත
Oracle EXAData පරිපාලන කාර්යයන්	≈149	නැත
EXSI Dell Node VM වින්‍යාසය වෙනස් කිරීම	26	නැත
VM මතකය වින්‍යාසය වෙනස් කිරීම	24	නැත
නව **VM** සර්වරය ප්‍රතිපාදනය හා වින්‍යාසය සැකසීම	8	නැත
8. වෙබ් අඩවිය		
කාර්යය	ලැබූ හා නිම කරන ලද	කටයුතු කළ යුතු
තීරු බදු වෙනස්වීම් වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීම	27	නැත
විනිමය අනුපාතිකය වෙබ් අඩවියේ පළකිරීම	54	නැත
ටෙන්ඩර අලෙවිය පිළිබඳව වෙබ් අඩවියේ පළකිරීම	25	නැත
මානව සම්පත් සංවර්ධන අංශයේ මුල් පිටුව (Home page) යාවත්කාලීන කිරීම	1	නැත
BCNP වෙබ් පිටුව යාවත්කාලීන කිරීම	1	නැත
RMU දැන්වීම් මුල් පිටුවේ බැනරයේ පළ කිරීම	1	නැත
BOI සම්බන්ධීකරණ අංශයේ මුල් පිටුව යාවත්කාලීන කිරීම	1	නැත
තීරු බදු සංශෝදන ගැසට් පළකිරීම	1	නැත
ආනයන මාර්ගගතව ලියාපදංචි කිරීම සම්බන්ධ නිවේදන පළකිරීම	1	නැත
BCNP වෙබ් පිටුවේ ජාත්‍යන්තර සංවිධාන ලයිස්තුව යාවත්කාලීන කිරීම	1	නැත
මුල් පිටුවේ අභ්‍යන්තර දෙපාර්තමේන්තුවල රේගුව හා සම්බන්ධවීමේ විස්තර යාවත්කාලීන කිරීම	1	නැත
මුල් පිටුවේ ඇති බැනර් ලේඛන යාවත්කාලීන කිරීම	1	නැත
වෙබ් පිටුවේ ඇති **Asycuda** විකල්ප සබැඳිය යාවත්කාලීන කිරීම	1	නැත
දිගු කාමරයේ අනුමත කොවිඩ් **19**-නව නිෂ්කාශන ක්‍රියාවලිය පළ කිරීම	1	නැත

8.3.4 මධ්‍යම මිල පිරික්සුම් අංශය

හැඳින්වීම

වටිනාකම අනුව රේගු බදු අදාලවන අවස්ථාවන්හිදී ආනයනික භාණ්ඩවල මිල තක්සේරු කිරීම සඳහා මධ්‍යම මිල පිරික්සුම් අංශය වගකියනු ලැබේ. අත්හැර දමන ලද හෝ අත්අඩංගුවට ගනු ලැබූ භාණ්ඩ පිළිබඳව තක්සේරුකර තෙන්ඩර මගින් විකිණීමද මෙම අංශය යටතට පැවරේ. රේගු ආඥා පනතේ **51** හා **52** වන වගන්ති හා ඉ උපලේඛනය ඇතුලත්ව ඇති ලෝක රේගු සංවිධානයේ මිල නියම කිරීමේ ගිවිසුමෙහි ඇතුලත් මිල නියම කිරීමේ මූලධර්ම යොදාගනු ලැබේ. පෞද්ගලික භවුලකාරිත්වය සඳහා පහසුකම් සැලසීම හා දිරිමත් කිරීම සිදුකරන අතරම මෙම අංශය මගින් ක්‍රියාකාරී ඒකක අතර බෙදාහැරීම සඳහා දත්ත එකතුකිරීම හා සකස් කිරීම සඳහා නවින මෙවලම් හා පර්යේෂණ පහසුකම් යොදාගනු ලැබේ.

මධ්‍යම මිල පිරික්සුම් අංශයේ ප්‍රධාන කාර්යාලය ඔරුගොඩවත්ත බහාළුම් පර්යන්තයේ පිහිටා ඇත. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික) යටතේ පාලනය වන මෙම අංශයේ සමස්ත අධික්ෂණය රේගු අධ්‍යක්ෂ (මිල පිරික්සුම්) වෙත පැවරී ඇති අතර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානීන් ලෙස කටයුතු කරනු ලැබේ.

තක්සේරු නිලධාරීන් **7**දෙනෙක් (නියෝජ්‍ය රේගු අධිකාරීවරුන්) සහ සහකාර රේගු අධිකාරීවරුන් **10** දෙනෙකුගේ සහය ඇතිව රේගු අධිකාරීවරුන් **8** දෙනෙකුගේ මෙහෙයුම් අධීක්ෂණය යටතේ විමර්ශණ, පර්යේෂණ, ලියාපදිංචි කිරීම, පශ්චාද් ඉල්ලීම් සංශෝධිත, ගෙවීම් සත්‍යාපන හා ඇප සහතික කළමනාකරණ කාර්යයන් සිදුකරනු ලැබේ.

අංශයේ ප්‍රධාන කාර්යයන්

රේගු මිල තක්සේරු කිරීම හා සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු වලදී මිල නියම කිරීමේ කමිටුවට සහයවීම;

- මිල තක්සේරු කිරීමේ නීතිය ඵලදායී හා ඒකීය ලෙස යෙදවීම සඳහා මිල නියම කිරීමේ මෙවලම් දත්ත ගබඩා) සහ යහපත් ක්‍රියා පිළිවෙත් වැඩිදියුණු කිරීම (හා කාලන දැනුම්දීම් ඇතුළුව;
- වෙළඳ භාණ්ඩවල මිල සත්‍යාපනය කිරීම.
- මිල තක්සේරු කිරීමේ ගැටලු විසඳීමේදී රාජ්‍යපෞද්ගලික භවුල්කා-රිත්වය දිරිමත් කිරීම හා මිල තක්සේරු කිරීමේ පර්යේෂණයන්හිදී රාජ්‍ය භවුල්කාරිත්වයට ඇරයුම් කිරීම;
- සංවේදී භාණ්ඩවල මිල තක්සේරු කිරීමේ ප්‍රවණතාවය අධීක්ෂණය කිරීම හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම;
- මිල තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ හා ක්‍රමවේද ඵලදායී ලෙස යෙදවීම හා අනුගමනය කිරීම තහවුරු කරගැනීම සඳහා මිල තක්සේරු කිරීමේ පරීක්ෂාවන්විමර්ශනයන් සිදුකිරීම/;
- රේගු මිල තක්සේරු කිරීමේ කරුණු වලදී අදාල ජාත්‍යන්තර සංවිධාන හා පිටරටවල වෙනත් මූලාශ්‍ර සමග සම්බන්ධීකරණය කිරීම
- අධ්‍යයනයන් සිදුකිරීම හා මිල හුවමාරු කිරීම සම්බන්ධ ගැටලු සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීම

2022 වර්ෂයේ කාර්ය සාධනය

මධ්‍යම මිල පිරික්සුම් (ප්‍රධාන කාර්යාලය)

මාසය	ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව	වටිනාකම සංශෝධනය කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව	ගැලපුම් ප්‍රතිශතය	අයකරගත් ප්‍රමාණය (රු.)
ජනවාරි	1,035	666	64.35%	161,908,100.00
පෙබරවාරි	1,150	773	67.22%	140,321,155.00
මාර්තු	1,065	582	54.65%	109,684,573.00
අප්‍රේල්	867	405	46.71%	122,498,186.00
මැයි	602	300	49.83%	85,905,778.00
ජූනි	573	256	44.68%	93,209,007.00
ජූලි	358	136	37.99%	68,459,191.00
ආගෝස්තු	316	157	49.68%	126,660,162.00
සැප්තැම්බර්	412	232	56.31%	178,854,932.00
ඔක්තෝබර්	654	374	57.19%	251,229,133.00
නොවැම්බර්	734	415	56.54%	191,754,301.00
දෙසැම්බර්	677	395	58.35%	177,259,607.00
එකතුව	**8,443**	**4,691**	**55.56%**	**1,707,744,125.00**

ගුවන් භාණ්ඩ- මිල පිරික්සුම්

මාසය	ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව	වටිනාකම සංශෝදනය කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව	ගැලපුම් ප්‍රතිශතය	අයකරගත් ප්‍රමාණය (රු.)
ජනවාරි	345	10	3%	247,242.00
පෙබරවාරි	314	7	2%	172,025.00
මාර්තු	414	19	5%	562,485.00
අප්‍රේල්	219	14	6%	616,918.00
මැයි	221	23	10%	1,177,463.00
ජූනි	201	25	12%	746,402.00
ජූලි	274	35	13%	853,384.00
ආගෝස්තු	370	14	4%	555,835.00
සැප්තැම්බර්	286	10	3%	516,769.00
ඔක්තෝබර්	292	10	3%	3,039,120.00
නොවැම්බර්	359	12	3%	1,179,535.00
දෙසැම්බර්	364	13	4%	1,431,270.00
එකතුව	**3659**	**192**	**5%**	**11,098,448.00**

කාර්ය සාධනය පෙර වර්ෂ හා සැසඳීම

වර්ෂය	**2019**	**2020**	**2021**	**2022**
යොමුකරන ලද මුළුරේගු සටහන්කර සංඛ්‍යාව	24,869	18,450	16,591	8,443
වටිනාකම වෙනස්කරන ලද මුළුරේගු සටහන්කර සංඛ්‍යාව	10,473	7,709	9,082	4,691
වටිනාකම පිළිගනු ලැබූ මුළුරේගු සටහන්කර සංඛ්‍යාව	14,396	10,741	7,509	3,752
වටිකාකම ගැලපිමේ ප්‍රතිශතය	42.11%	41.78%	54.74%	55.56%
අතිරේක සටහන්කර මගින් අයකරගත් මුදල රු.	1,913,753,705.00	1,183,973,883.00	1,690,444,675.88	1,707,744,125.00

පෙර වර්ෂය අනුව අයකරගත් අතිරේක සටහන්කර සන්සන්දනය



VIU ප්‍රගතිය

	ප්‍රමාණය
ලියාපදිංචි වූ සිද්ධි සංඛ්‍යාව	49
නිමකරන ලද සිද්ධි සංඛ්‍යාව	33
දඩ නියම කිරීම (රු.)	Rs.117,564,544
දඩ අයකර ගැනීම් (රු.)	Rs.86,322,627

2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධනය මැනීම

ආදායම් අරමුණු යටතේ සැලසුම් කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම/උප ක්‍රියාකාරකම	වෙනත් කරුණු
අයවිය යුතු ආදායම එකතු කිරීම.	
සැකකටයුතු භාණ්ඩ තොග නිරීක්ෂණය කිරීම සහ ඒ අනුව පියවර ගැනීම	සිදුකර ඇත.
අවදානම් කළමනාකරණ ඒකකය සමග සහයෝගයෙන් අවදානම් තක්සේරු කිරීම වැඩි දියුණු කිරීම	සිදුකර ඇත.

පාලන අරමුණු යටතේ සැලසුම් කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම/උප ක්‍රියාකාරකම	වෙනත් කරුණු
වසංගත තත්ත්වයන්හිදී CVD හි උපරිම අනුකූලතාව, බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම සහතික කිරීම සහ අවදානම් පැහැකඩ යාවත්කාලීන කිරීම සඳහා සහාය ලබාදීම	
1. මිල පිරික්සුම් නීති සහ මාර්ගෝපදේශ පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.	සිදුකර ඇත.
2. මානව මැදිහත්වීම් අවම කිරීම මගින් කොවිඩ් 19 වසංගතයට මහුණ දීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් හඳුන්වා දීම.	සිදුකර ඇත.
3. සංවේදී භාණ්ඩ වල HS කේතාංක හඳුනාගැනීම හා එම තොරතුරු RMU වෙත කලින් කලට ලබාදීම	සිදුකර ඇත.

වෙළඳාම සඳහා පහසුකම් සැලදීමේ අරමුණු යටතේ සැලසුම් කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම/උප ක්‍රියාකාරකම	වෙනත් කරුණු
අනු අගයන් ස්ථාවරව සමීපව පිළිපැදීම. මෙහෙයුම් ක්‍රියාවලීන් සංශෝධනය, සමාලෝචනය සහ ප්‍රසිද්ධ කිරීම.	
1. NIVDU දත්ත ගබඩාව ට ස්ථාවරව යොමු කිරීම..	සිදුකර ඇත.
2. CVD තුළ අනු අගයන් ස්ථාවරව පිළිපැදීම.	සිදුකර ඇත.
3. නිර්ණයන්හි ස්ථාවරභාවය.	සිදුකර ඇත.
4. මිල පිරික්සුම් ක්‍රියාවලීන් සංශෝධනය, සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම	සිදුකර ඇත.
5. යාවත්කාලීන කිරීම් පිළිබඳ තොරතුරු කොටස් හිමියන් වෙත කාලීන පදනමින් ලබාදීම	සිදුකර ඇත.
6. ක්‍රියාවලියේ ගැටළු හඳුනාගැනීම සඳහා කාලීනුරූප අධ්‍යයනයන්	සිදුකර ඇත.

8.3.5 විශේෂ සේවා අංශය

හැඳින්වීම

විශේෂ සේවා අංශය මගින් රේගු දෙපාර්තමේන්තුවට සහ රේගු සේවය ලබා ගන්නා අනෙකුත් ආයතන සඳහා විවිධ සේවාවන් සපයනු ලැබේ. ඒ අතර ආනයන/අපනයන භාණ්ඩ සඳහා සුදුසු සංයෝජිත වර්ගීකරණ කේතාංක නිර්මාණය කිරීම, ආනයන/අපනයන රසායන ද්‍රව්‍ය විශ්ලේෂණය, මැණික්, වටිනා ලෝහ වර්ග හා ස්වර්ණාභරණ තක්සේරුකරණය, රේගු මූලස්ථාන අනු නියෝජිතයින්ට බලපත්‍ර නිකුත් කිරීම, ආනයන අපනයන රේගු ප්‍රකාශන ක්‍රියාවලිය පහසු කිරීම සඳහා ආනයන/අපනයනකරුවන් ආසිකුඩා පද්ධතියේ ලියාපදිංචි කිරීම වැනි සේවාවන් සපයනු ලබයි.

ප්‍රධාන කාර්යයන්

- වෙළඳ භාණ්ඩ/භාණ්ඩ වර්ගීකරණය
- රසායනික සහ ඒ හා සමාන නිෂ්පාදන හඳුනා ගැනීම සහ වර්ගීකරණය
- මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරණ හඳුනාගැනීම, වර්ගීකරණය හා වටිනාකම තක්සේරු කිරීම .
- රේගු මූලස්ථාන අනුනියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීම සහ ආනයනකරුවන් හා අපනයනකරුවන් ලියාපදිංචි කිරීම.

8.3.5.1 භාණ්ඩ වර්ගීකරණ ඒකකය

ආනයන/අපනයන භාණ්ඩ සඳහා වඩාත් සුදුසු සංයෝජිත වර්ගීකරණ කේතාංක **(HS Codes)** නිර්ණය කිරීම මෙම අංශයේ වගකීම වේ. රේගු ප්‍රකාශන ක්‍රියාකාරී ඒකකය හෝ බඩු පරීක්ෂා කිරීමේ ඒකකය විසින් එක් භාණ්ඩයකට වර්ගීකරණ කේතාංක **(HS Codes)** තීරණය කිරීමේදී ගැටළු මත වුවහෝත එය මෙම ඒකකය වෙත යොමු කරනු ඇත. එවැනි අවස්ථාවකදී**MSDS** හා වෙනත් අදාල ලේඛන පරීක්ෂාකර බලා මත භේදයට තුඩුදුන් අයිතමය සඳහා වඩාත් යෝග්‍ය සංයෝජිත වර්ගීකරණ කේතය යෝජනා කරමින් මෙම ඒකකය මගින් අභ්‍යන්තර උපදේශනයක් නිකුත් කරනු ලැබේ.

ඊට අමතරව, වෙළඳාම පහසු කරන ක්‍රියාමාර්ගයක් ලෙස මෙම අංශය ආනයනය හෝ අපනයනය කළයුතුව ඇති භාණ්ඩවලට තීරුබදු වර්ගීකරණ පූර්ව තීරණ නිකුත් කරනු ඇත. ආනයන අපනයනකරුවන් රේගු වෙබ් අඩවියේ ඇති ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමේදී මෙම තීරණය ලබාගත හැකිවේ. මෙම තීරණය ලබාදුන් පසුව එය නිකුත් කළ දින සිට එකම නිෂ්පාදකයෙකුගෙන් ආනයනය කරන ලද ඊට අදාළ භාණ්ඩ අයිතමයට පමණක් වසරක කාලපරිච්ඡේදයක් වලංගු වන්නේය.

එසේ වුවද, සටහන් ඇතුළත් කරන ස්ථානයකින් රේගු ප්‍රකාශන යොමු කරන නිලධාරීන් හෝ නිකුත් කරන ලද තීරණය පිළිබඳ ආනයනකරුවන්/අපනයනකරුවන් සෑහීමකට පත් නොවන්නේ නම් ඒ පිළිබඳ තවදුරටත් විස්තර ලබාගැනීම සඳහා ඔවුන්ට ස්වකීය අයිතමයන් නාමකරණ කමිටුවට **(NC)** හෝ රේගු දෙපාර්තමේන්තුව හරහා ලෝක රේගු සංවිධානයේ සංයෝජිත වර්ගීකරණ පද්ධති කමිටුවට වුවද යොමු කළ හැකිය.

විස්තරය	වසර			
	පසුගිය ප්‍රගතිය	**2022** 31/12/දිනට ප්‍රගතිය		
අදාලවන වසර	2021	2021*	2022	සමස්ත ප්‍රගතිය
පූර්ව වර්ගීකරණ තීරණ **(AR)**				
ලැබූ අයදුම්පත් සංඛ්‍යාව	725	215	296	511
නිකුත්කරන ලද තීරණ සංඛ්‍යාව	510	169	220	389
කටයුතු කළ යුතු අයදුම් පත්	215	46	76	122
සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය	70.34%	78.60%	74.32%	76.13%
අභ්‍යන්කර වර්ගීකරණ උපදෙස් **(IR)**				
ලැබූ අයදුම්පත් සංඛ්‍යාව	1080	322	446	768
නිකුත්කරන ලද තීරණ සංඛ්‍යාව	758	227	344	571
කටයුතු කළ යුතු අයදුම් පත්	322	95	102	197
සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය	70.19%	70.50%	77.13%	74.35%
* **2021** වර්ෂයේ ලැබුණු අයදුම්පත් සහ **2022** වර්ෂයේ සම්පූර්ණ කරන ලද අයදුම්පත්				

8.3.5.2 රේගු පරීක්ෂණාගාර අංශය

ආනයනය හෝ අපනයනය කරන රසායනික ද්‍රව්‍ය හා ඊට සමාන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා රේගුවට හා පාර්ශවකරුවන්ට සහායවීමට රේගු පර්යේෂණාගාර අංශය පිහිටුවන ලදී .ආනයනික හෝ අපනයනික රසායන ද්‍රව්‍ය හා ඒ සම්බන්ධ භාණ්ඩවල හඳුනාගැනීම පිළිබඳ සැකයක් මතුවූ අවස්ථාවන්හිදී ඒවා විශ්ලේෂණය කිරීම සඳහා ඒවායේ නියැදි රේගු පරීක්ෂණාගාරය වෙත යවනු ලැබේ .එවැනි ද්‍රව්‍යවල වර්ගීකරණය පිළිබඳව මතභේද මතු වූ අවස්ථාවලදී ද අදාළ ද්‍රව්‍ය හා ලිපිලේඛන මෙම අංශයේ තීරණය සඳහා යොමු කරයි.
කාර්මික උපදේශණ ඒකකයක් වශයෙන් මෙම අංශය විවිධ සම්මුතීන් සහ පවත්නා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී අනෙකුත් අදාල පාර්ශව සමඟ සම්බන්ධීකරණය සිදුකරනු ලබයි.

කාර්ය සාධනය
විශ්ලේෂණ ගාස්තු වශයෙන් අයකරගත් ප්‍රමාණය; රු.**30,000/-**

		ලැබුණු	අවසන් කළ	නිම කිරීමේ ප්‍රතිශතය
මුළු රේගු ප්‍රකාශන සංඛ්‍යාව **(CusDecs)**	හඳුනාගැනිම සඳහා පමණක් රේගු ප්‍රකාශන විශ්ලේෂණය කිරීම .	31	30	97%
	විශ්ලේෂණය හා වර්ගීකරණය සඳහා පමණක් රේගු ප්‍රකාශන විශ්ලේෂණය කිරීම .	6	6	100%
	වර්ගීකරණය සඳහා පමණක් රේගු ප්‍රකාශන විශ්ලේෂණය කිරීම	54	54	100%
මුළු පූර්ව තීරණ හා වෙනත් ගොනු සංඛ්‍යාව	හා ශාඛාවෙන් යොමුකරන ලද පූර්ව තීරණ ගොනු .ව.	99	98	99%
	අනෙකුත් ශාඛා මගින් යොමුකරන ලද අනෙකුත් ගොනු	49	49	100%
	එකතුව	**239**	**237**	**99%**

2022 දී රේගු ප්‍රකාශන, පූර්ව තීරණ හා තීරණ ගොනු සංයුතිය



පෙර වර්ෂ හා සන්සන්දනය

වර්ෂය	ලැබූ	නිමකළ	නිම කිරීමේ ප්‍රතිශතය
2016	212	209	98.58%
2017	325	314	96.62%
2018	497	471	94.77%
2019	463	456	98.49%
2020	311	307	98.71%
2021	493	478	96.96%
2022	239	237	99.16%



8.3.5.3 මැණික් ඒකකය

මෙම අංශයේ මැණික් හා ස්වරණාභරණ ක්ෂේත්‍රයේ නිලධාරීන් විසින් මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරණ යනාදිය සමඟ ආනයන/අපනයන ලේඛණ සකස් කිරීම සිදුකරනු ලැබේ. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය වෙමින් මෙම අංශයේ නිලධාරීහු එකී භාණ්ඩ තක්සේරු කිරීම සිදුකරති.

- **2022** වර්ෂය තුළ සිදු කළ සියලුම ආනයන හා අපනයනයන්හි සාරාංශය පහත සඳහන් වේ.
- සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ.

අපනයන	
	වටිනාකම (රු.)
මැණික්	65,500,216,284
දියමන්ති ස්වර්ණාභරණ	539,944,624
වෙනත් ස්වර්ණාභරණ	4,477,764,527
දියමන්ති	70,642,303,589
ගෙවුඩ/ ඛනිජ ද්‍රව්‍ය	23,575,047
ප්‍රදර්ශන/පර්යේෂණ ස්වර්ණාභරණ	35,926,760,078
ප්‍රදර්ශන ස්වර්ණාභරණ	146,366,730
එකතුව	**177,256,930,879**

ආනයන	
	වටිනාකම (රු.)
ඔප නොදැමූ දියමන්ති	2,953,717,072
කැපූ හා ඔපදැමූ දියමන්ති	14,220,215,860
මැණික්	7,202,970,814
රිදී	121,725,581
රත්‍රන්	1,836,258,031
රත්‍රන් ස්වර්ණාභරණ	475,917,556
රිදී ආභරණ	59,567,046
ඔයාගැනීම්	117,975,528
වෙනත් (පරිභෝජන ද්‍රව්‍ය)	21,407,614
එකතුව	**27,009,755,103**

	වටිනාකම (රු.)
ප්‍රති අපනයන	31,424,063,331

තීරු බදු හා අනෙකුත් බදු	
	වටිනාකම (රු.)
රේගු ආනයන බදු (CID)	526,438
ආර්ථික සේවා බදු (ESC)	0
තීරු බදු	0
සෙස්	0
ආනයන සෙස්	41,333,825
අගය එකතුකළ බදු (VAT)	75,791,818
වරාය හා ගුවන්කොටුපළ සංවර්ධන බදු (PAL)	46,818,359
සමාජ ආරක්ෂණ බදු (SSL)	19,337,772
අතිකාල ගාස්තු	808,800
O E	10,510,675
වෙනත්	0
දඩ	0
එකතුව	**195,127,687**

ප්‍රකාශන සංඛ්‍යාව	
	එකතුව
අපනයන	7121
ආනයන	2085
ප්‍රති අපනයන	534

8.3.5.4 තාවකාලික හඳුනාගැනීමේ අංක / එකතු කළ අගය මත බදු (TIN /VAT) සහ රේගු මූලස්ථාන අනු නියෝජිතයින් ලියාපදිංචි කිරීමේ ඒකකය(CHA)

රේගු මූලස්ථාන අනු නියෝජිතයින් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ මෙම ඒකකය මගිනි. රේගු ආඥා පනතේ **115(1)** වගන්තිය ප්‍රකාරව අවශ්‍යතාවන් සම්පූර්ණ කරනු ලබන පුද්ගලයින්ට රේගු මූලස්ථාන අනු නියෝජිතයින් ලෙස කටයුතු කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරේ. ශ්‍රී ලංකාවේ කවර හෝ වරායක හෝ ස්ථානයක කවර හෝ නැවක්, භාණ්ඩ හෝ ගමන්මළු ඇතුළු කිරීම හෝ නිෂ්කාශණය කිරීමට අදාළ ගනුදෙනු ව්‍යාපාර සඳහා නියෝජිතයින් ලෙස කටයුතු කළ යුත්තේ බලපත්‍රලාභී රේගු මූලස්ථාන අනු නියෝජිතයින් පමණි.

<u>තාවකාලික හඳුනාගැනීමේ අංක / එකතු කළ අගය මත බදු (TIN /VAT) ඒකකය</u>

ලියාපදිංචි කරන ලද බලපත්‍ර සංඛ්‍යාව		54
පුද්ගලයින් සංඛ්‍යාව	ආනයන සංඛ්‍යාව	77
	වාහන සංඛ්‍යාව	0
ලියාපදිංචි කරන ලද පෞද්ගලික සීමිත සමාගම් සංඛ්‍යාව		1174
ලියාපදිංචි කරන ලද තනිපුද්ගල ව්‍යාපාර සංඛ්‍යාව		348
ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාර සංඛ්‍යාව		89
ලියාපදිංචි රාජ්‍ය සංවිධාන සංඛ්‍යාව		4
ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව		0
ලියාපදිංචි කරන ලද රජයේ සීමිත සමාගම් සංඛ්‍යාව		0
ලියාපදිංචි කරන ලද විදේශ සමාගම් සංඛ්‍යාව		0
අනෙකුත් ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව		10
ලැබූ ලේඛනයන්හි එකතුව		1756

රේගු මූලස්ථාන අනු නියෝජිතයින් ලියාපදිංචි කිරීමේ ඒකකය

රේගු මූලස්ථාන නව රේගු අනු නියෝජිතයින් ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව	106
නව වාප්පු සහයකයින් ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව	131
රේගු මූලස්ථාන අනු නියෝජිතයින් ලියාපදිංචිය නැවත අලුත් කිරීම් සංඛ්‍යාව	2233
වාප්පු සහයකයින් ලියාපදිංචිය නැවත අලුත් කිරීම් සංඛ්‍යාව	4194
රේගු මූලස්ථාන අනු නියෝජිතයින් ලියාපදිංචිය අවලංගු කිරීම් සංඛ්‍යාව	15
වාප්පු සහයකයින් ලියාපදිංචිය අවලංගු කිරීම් සංඛ්‍යාව	415
නිකුත් කරන ලද තාවකාලික බලපත්‍ර සංඛ්‍යාව	657

8.4 මානව සම්පත් පර්ෂදය

8.4.1 මානව සම්පත් කළමනාකරණ අංශය

8.4.2 මානව සම්පත් සංවර්ධන අංශය

8.4.3 කාර්ය මණ්ඩල සේවා අංශය

8.4.4 සේවා සැපයීම් අංශය

8.4.1 මානව සම්පත් කළමනාකරණ අංශය

හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුවේ පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායිව කටයුතු කරනු පිණිස අවශ්‍යවන මානව සම්පත් කළමණාකරණය කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ.

එහි දී දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර කරා ගමන් කල හැකි නිපුණතාවයෙන් යුක්ත, සුදුසුකම් සහිත පුද්ගලයන් දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගැනීමටත්, ඒ සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම් සකස් කිරීමත් මෙම අංශය විසින් සිදු කරයි. එසේම පවත්නා ශ්‍රම බලකායේ හැකියාවන් හඳුනා ගනිමින් ඔවුන් අභිප්‍රේරණය කිරීමත්, ගැටළු හඳුනා ගනිමින් ඒවා නිරාකරණය කොට ඔවුන්ගේ පූර්ණ දායකත්වය දෙපාර්තමේන්තුව කෙරෙහි ලබා ගැනිමටත් කටයුතු කරනු ලබයි.

එමෙන්ම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ආදී රාජ්‍ය ආයතනවලින් වරින් වර නිකුත් කරනු ලබන නියෝග, මාර්ගෝපදේශ හා නීති රීතින්ට ද අනුගත වෙමින් නිලධාරීන් බඳවා ගැනීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, විශ්‍රාම ගැන්වීම සහ කාර්ය සාධනයන් පවත්වා ගැනීම මානව සම්පත් කළමණාකරණ අංශය මගින් ඉටු වේ.

ප්‍රධාන කාර්යයන්

- බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම්, හා උසස් කිරීම.
- සේවක වාර්තා තබා ගැනීම හා රහස්‍යභාවය සුරැකෙන අයුරින් පවත්වා ගැනීම.
- කාර්ය සාධන කළමණාකරණය.
- විශ්‍රාමික නිලධාරීන්ගේ විශ්‍රාම සැකසීම් කටයුතු.
- අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- සේවක වන්දි ගෙවීම හා සේවක ප්‍රතිලාභ කළමනාකරණය.
- ආයතනික සැලසුම් සකස් කිරීම

2022 වසරට අදාළ කාර්ය සාධනය 6.1 වගන්තියේ සහ 7 පරිච්ඡේදයේ දැක්වේ.

8.4.2 මානව සම්පත් සංවර්ධන අංශය

මානව සම්පත් සංවර්ධන අංශයේ දැක්ම

රේගු දෙපාර්තමේන්තුවේ විශිෂ්ඨතම පුහුණු අංශය බවට පත්වීම

මානව සම්පත් සංවර්ධන අංශයේ මෙහෙවර

ජාත්‍යන්තර රේගු, වෙළඳ සහ ආරක්ෂක සැකසුම් වලට සමගාමීව බාධාවකින් තොරව සේවා ඒකාබද්ධ කිරීම සඳහා ධාරිතා ප්‍රවර්ධනය කිරීම සහ රටේ ජාතික සමාජ- ආර්ථික සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ රේගු චින්තන ගබඩාව ලෙස දායක වීම.

හැඳින්වීම

නවීකරණය, ගෝලීයකරණය, තාක්ෂණික නවෝත්පාදන, ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාදාමයන් සහ සේවක මණ්ඩල ප්‍රශස්තකරණය වැනි නැගී එන ප්‍රවණතාවන් සමඟ ලෝකයේ සෑම රටකම රේගු පරිපාලනයන් විශාල අභියෝග රැසකට මුහුණ දෙමින් සිටී . රේගු පරිපාලනයේදී මානව සංවර්ධනයට ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදීමේ වැදගත්කම දක්වන රේගු වෘත්තීය සංවර්ධනය හා මෙකී සියලු සාධක අතර සෘජු සම්බන්ධතාවක් පවතී.

වසර 200 කට වැඩි අත්දැකීම් සහිත ශ්‍රී ලංකා රේගුව, ජාතියේ දේශසීමා පාලන ආයතනයක් ලෙස කටයුතු කරන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දෙපාර්තමේන්තුවකි. ආදායම් එකතු කිරීම, රේගු නීතිය බලාත්මක කිරීම, නිත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැපයීම සහ සමාජ ආරක්ෂණය යන මූලික අරමුණු පෙදැරිව රටේ සමාජ ආර්ථික යහපැවැත්ම සඳහා ශ්‍රී ලංකා රේගුව මගින් වැදගත් කාර්යභාරයක් ඉටුකෙරේ.

ශ්‍රී ලංකා රේගුවේ වගකීම් ඵලදායී ලෙස හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා, සේවා ආචාර ධර්ම පිළිපදිමින් ධනාත්මක ආකල්පව සහිතව තම වගකීම් ඉටු කළ හැකි මනා දැනුමෙන් යුත් ඉහළ නිපුණතා ඇති පුද්ගලයින් බිහිකිරීම අත්‍යවශ්‍ය වේ. මෙකී පෙළඹවීම තුළ, මානව සම්පත් සංවර්ධන අංශය (HRD) සෑම විටම සිය දෙපාර්තමේන්තු නිලධාරීන්ට පමණක් නොව, රේගු සහ දේශසීමා ආරක්ෂණ කාර්යයෙහි නියැලී සිටින බාහිර පාර්ශවකරුවන්ට පහසුකම් සැලසීම කෙරෙහි ද අවධානය යොමු කරයි .
ඒ අනුව, දෙපාර්තමේන්තුවේ අභිමතාර්ථ හා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සේවකයින්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා රේගුවේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

මානව සම්පත් සංවර්ධන අංශයේ මූලික කාර්යයන්

මානව සම්පත් සංවර්ධන අංශය විසින් ප්‍රධාන වශයෙන්ම දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් මෙහෙයවීම සහ සම්බන්ධීකරණය සිදුකිරීම කරනු ලබයි.
ලෝක වෙළඳ සංවිධානය(WTO), ලෝක රේගු සංවිධානය (WCO), මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) වැනි සංවිධාන වෙතින් ශ්‍රී ලංකා රේගුව වෙත ලැබෙන අවස්ථාවන්/ආරාධනයන් මත පදනම්ව, මානව සම්පත් කමිටුවේ අනුමැතිය සහිතව එවැනි වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ තනි වගකීම මානව සම්පත් සංවර්ධන අංශය සතුවේ.
ජාත්‍යන්තර ස්වභාවයේ රේගු කරුණු සමග බැඳී පවතින සමුළු, වැඩමුළු, පුහුණු පාඨමාලා, රැස්වීම්, පශ්චාත් උපාධි වැඩසටහන් , සම්මන්ත්‍රණ ආදිය එම විදේශ පුහුණු අවස්ථාවන්ට ඇතුළත් වේ.
මේවායින් ඇතැම් පුහුණු අවස්ථාවන් විදේශ රටවල පැවැත්වෙන අතර ඒ සඳහා තෝරාගත් රේගු නිලධාරීන් විදේශ ගතවිය යුතු අතර ඇතැම් වැඩසටහන් ශ්‍රී ලංකාවේ පැවැත්වෙන අතර ඒ සඳහා විදේශීය සම්පත් දායකයින් ශ්‍රී ලංකාව වෙත පැමිණෙනු ඇත.
තවද, රැස්වීම්, සම්මන්ත්‍රණ, webinar වැනි ඇතැම් විදේශීය පුහුණු වැඩසටහන් අතථ්‍ය (virtual) ආකාරයට පවත්වනු ලැබේ.
නිපුණතා සහ සහජ දක්ෂතා හඳුනාගැනීම සමග නිපුණතා සංවර්ධනය සහ අදාළ ක්ෂේත්‍රයන්හි දැනුම සහ අවබෝධය ඉහළ නැංවීම, දේශීය පුහුණුව සමග බැඳී පවතී.
අනුමත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මකට අනුව රේගුවේ සියළුම ස්ථර සඳහා මානව සම්පත් සංවර්ධන අංශය මගින් අභ්‍යන්තර

දේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම සිදුකරනු ලැබේ. දෙපාර්තමේන්තුවේ යාවත්කාලීන කරන ලද පුහුණු අවශ්‍යතා මත එකී ක්‍රියාකාරී සැලසුම සක්ස කරනු ලැබේ.සෑම වර්ෂයකම අවසානයේදී, මානව සම්පත් සංවර්ධන අංශය මගින් දෙපාර්තමේන්තුවේ සෑම අංශයකින්ම අදහස් කැඳවනු ලබන අතර එම ප්‍රතිපෝෂණය මත පදනම්ව එළඹෙන වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ.
දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ධාරිතා ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛ වගකීම හැරුණු කොට පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය සහ පුහුණුකිරීම් ආශ්‍රිත කරුණු වලදී ද මෙම අංශය සහාය වේ.

අංශයෙහි ප්‍රධාන කාර්යයන් වනුයේ .....

- පුහුණු ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සෑම මට්ටමකම සේවකයින්ගේ හැකියාවන් ඉහළ නැංවීම පිළිබඳව වගකීම.
- නවක බඳවා ගැනීම් සහ රැකියා තනතුරු වෙනස් කිරීමේදී පළපුරුදු නිලධාරීන් සඳහා ප්‍රමිතිගත පුහුණු අන්තර්ගතයන් ලබා දීම.
- සේවකයින් සඳහා යාවත්කාලීන පුහුණු අවස්ථා සළසා දීම සඳහා ලෝක බේරු සංවිධානය සහ ලෝක වෙළඳ සංවිධානය ඇතුළු දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- දෙපාර්තමේන්තුවේ අභිලාෂයන් සපුරාලීම සඳහා නිශ්චිත පුහුණු වැඩසටහන් සකස් කිරීම සහ පැවැත්වීම.
- උසස් පුහුණුවක් සැපයීම තුළින් වෘත්තීමය හා විශිෂ්ඨ බේරු නිලධාරීන් බිහි කිරීම.
- නවෝත්පාදන හා ඵලදායී ඉගෙනුම් පරිසරයක් සැළසීම.
- බේරු නිලධාරීන් විසින් සේවා ආචාර ධර්ම පිළිපැදීමේ මට්ටම ඉහළ නැංවීම
- මානව සම්පත් කළමනාකරණයේ ජාත්‍යන්තර අවශ්‍යතා සපුරාලීම.
- පුහුණු අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය දීම මගින් දෙපාර්තමේන්තුවේ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම.
- පුහුණු සැලැස්ම හා විෂය මාලා සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.
- පුහුණු වැඩසටහන් අධීක්ෂණය කිරීම හා ඇගයීම.
- ශ්‍රී ලංකා යුද හමුදාව, නාවික හමුදාව සහ පොලිස් නිලධාරීන් වැනි බාහිර ආයතන ඉල්ලා සිටි විට අවශ්‍ය පුහුණුව ලබා දීම .
- බේරු මූලස්ථාන අනුනියෝජිතයින් සඳහා සහතිකපත් පාඨමාලා පැවැත්වීම .
- පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා අනුව බේරු කටයුතු පිළිබඳ පුහුණු පහසුකම් සැලසීම සඳහා බේරු දෙපාර්තමේන්තුවෙන් සම්පත්දායකයින් සැපයීම.
- බේරු කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල පහසුකම් සැපයීම.

මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ පුහුණු ඉලක්ක ළඟාකර ගැනීම සඳහා කළමනාකරණ බලධාරීන් විසින් පහත සඳහන් කාර්ය මණ්ඩලය අනුමතකර තිබේ.
නමුත් වර්තමානයේදී අප ඉතා අවම කාර්ය මණ්ඩලයක් (වගුව **01)** මත ක්‍රියාත්මක වන නමුත් දෙපාර්තමේන්තුමය පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා සියළුම රාජකාරීන් දැඩි පරිශ්‍රමයකින් යුතුව ඉටු කරනු ලැබේ.

<u>වගුව **01:** වර්තමාන සේවක සංඛ්‍යාවට සාපේක්ෂව අනුමත සේවක සංඛ්‍යාව</u>

ශ්‍රේණිය	අනුමත කාර්ය මණ්ඩලය	වර්තමානයේදී සිටින සංඛ්‍යාව
බේරු අධ්‍යක්ෂ	01	01
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය බේරු අධ්‍යක්ෂ	02	01
නියෝජ්‍ය බේරු අධ්‍යක්ෂ	03	01
නියෝජ්‍ය බේරු අධිකාරි	08	00
සහකාර බේරු අධිකාරි	08	05
බේරු පරීක්ෂක	අදාළ නොවේ.	02
කළමනාකරණ සේවා	03	03

නිලධාරී		
එකතුව	**25**	**13**

2022 වර්ෂයේ දී අංශයේ කාර්යසාධනය:

දේශීය පුහුණු වැඩසටහන් (රේගු කාර්ය මණ්ඩලය සඳහා)

2022 ක්‍රියාකාරී සැලසුම සහ රේගු අධ්‍යක්ෂ ජනරාල්/මානව සම්පත් කමිටුව මගින් මෙහෙයවන ලද අනෙකුත් වැඩසටහන් අනුව, **2022** වර්ෂය තුළ රේගු කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා මානව සම්පත් සංවර්ධන අංශය මගින් දේශීය පුහුණු වැඩසටහන් (ආයතනය තුළ සහ බාහිරව) **58**ක් සාර්ථකව පවත්වා ඇති අතර, එම පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව (ශ්‍රේණි අනුව) පහත වගුව (**02** වගුව) මගින් දැක්වේ.

<u>වගුව **02**: දේශීය පුහුණු වැඩසටහන් (ආයතනය තුළ සහ බාහිරව) සඳහා රේගු කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීවීම - වර්ෂ **2022**</u>

ශ්‍රේණිය	සහභාගීත්වය(ආයතනය තුළ සහ බාහිරව)
අතිරේගු අධ්‍යක්ෂ ජනරාල් .	01
රේගු අධ්‍යක්ෂ	01
නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ	61
රේගු අධිකාරි	127
නියෝජ්‍ය රේගු අධිකාරි	46
සහකාර රේගු අධිකාරි	448
කළමනාකරණ සේවා නිලධාරී	119
රේගු පරීක්ෂක	24
රේගු නියාමක	10
කාර්යාල කාර්ය සහායක	17
වෙනත්	00

අනෙකුත් දේශීය පුහුණු වැඩසටහන්- බාහිර පාර්ශවයන් සඳහා
බාහිර පාර්ශවයන් විසින් කරන ලද ඉල්ලීම් අනුව සහ මානව සම්පත් කමිටුවේ අනුමැතිය සහිතව හමුදාවන්, පොලිසිය, රාජ්‍ය හා පෞද්ගලික සංවිධාන, විශ්ව විද්‍යාල වැනි විවිධ සංවිධාන සඳහා මානව සම්පත් සංවර්ධන අංශය මගින් **2022** වර්ෂයේදී පුහුණු වැඩසටහන් රැසක් සම්බන්ධීකරණය කිරීම සහ මෙහෙයවීම සිදු කරනු ලැබ ඇත.

එම ඉල්ලීම් වල ස්වභාවය අනුව, ඇතැම් වැඩසටහන් ආයතනය තුළ මෙහෙයවන ලද අතර, අනෙකුත් අවස්ථාවන්හිදී පුහුණු වැඩසටහන් මෙහෙයවීම සඳහා සුදුසුකම් සහිත සම්පත් දායකයින් බාහිරින් ලබාගන්නා ලදී.

විදේශ පුහුණු වැඩසටහන්

මානව සම්පත් සංවර්ධන අංශය මගින් **2022** වර්ෂයේදී විදේශ පුහුණු වැඩසටහන් **163** ක් සාර්ථකව සම්බන්ධීකරණය කර ඇත.

විදේශ පුහුණු වැඩසටහන් සඳහා රේගු නිලධාරීන්ගේ (ශ්‍රේණි අනුව) සහභාගිත්වය වගුව **03** මගින් නිරූපණය වන අතර වසර තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් වල ස්වභාවය වගුව **04** මගින් දැක්වේ.

වගුව **03**: විදේශ සම්මන්ත්‍රණ/සමුළු/ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම-**2022** (ශ්‍රේණි අනුව)

ශ්‍රේණිය	සහභාගීත්වය
රේගු අධ්‍යක්ෂ ජනරාල්	07
අතිරේගු අධ්‍යක්ෂ ජනරාල් .	23
රේගු අධ්‍යක්ෂවරුන්	32
නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරුන්	38
රේගු අධිකාරිවරුන්	103
නියෝජ්‍ය රේගු අධිකාරිවරුන්	15
සහකාර රේගු අධිකාරිවරුන්	155
වෙනත්	38

වගුව **04: 2022** වර්ෂයේ පවත්වන ලද විදේශ පුහුණු වැඩසටහන් වර්ග

විදේශ වැඩසටහන්	එකතුව: **163**
වැඩසටහන් – විදේශ	
සමුළු	- 02
වැඩමුළු	- 19
වැඩසටහන්	- 03
පුහුණු පාඨමාලා	- 11
රැස්වීම්	- 29
පශ්චාත් උපාධි වැඩසටහන්	- 01
සම්මන්ත්‍රණ	- 04
වෙනත්	- 94

රේගු මූලස්ථාන අනු නියෝජිත පුහුණු හා පරීක්ෂණ .

මානව සම්පත් සංවර්ධන අංශය මගින් මෙහෙයවනු ලබන වඩාත්ම ප්‍රකට පුහුණු වැඩසටහනක් වනුයේ රේගු මූලස්ථාන අනු නියෝජිතයින්/වාප්පු සහකාරවරුන් සඳහා වන සහතික පත්‍ර පාඨමාලාවයි. රේගු නිෂ්කාශණ ක්‍රියාවලිය, ආනයන/අපනයන ක්‍රියාපටිපාටි, රේගු ආඥාපනත සහ ආශ්‍රිත නීති,භාණ්ඩ වර්ගීකරණය,මිල පිරික්සුම් ක්‍රම, ශ්‍රී ලංකා වරාය අධිකාරි ක්‍රියාපටිපාටි, **ASYCUDA** පද්ධතිය, පාරිසරික සහ සමාජ ආරක්ෂණ ප්‍රඥප්ති ආදිය පිළිබඳ සමස්ත දැනුමක් මෙම පුහුණු පාඨමාලාව මගින් ලබාදේ. මෙම සියළුම දේශන පළපුරුදු රේගු නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන අතර ඇතැම් පාඨමාලා මොඩියුල සඳහා අප විසින් බාහිර සංවිධාන වලින් සම්පත් දායකයින්ට ආරාධනා කරනු ලැබේ.

මෙම වැඩසටහන මගින් බලපත්‍රලාභී රේගු මූලස්ථාන අනු නියෝජිතයකු බිහිකිරීමේ පදනම සැකසෙන බැවින් මෙයට ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. රේගු මූලස්ථාන අනු නියෝජිත බලපත්‍රයක් ලබාගැනීම සඳහා මෙම වැඩසටහන හදාරා පාඨමාලාව අවසානයේදී පැවැත්වෙන පරීක්ෂණය සමත් වීම අනිවාර්ය වේ. මෙම රේගු මූලස්ථාන අනු නියෝජිත බලපත්‍රලාභීන් රටේ ආනයන/අපනයන වෙළඳාමේ වැදගත් කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

බලපත්‍රලාභී රේගු මූලස්ථාන අනු නියෝජිතයකු බවට පත්වීමට අමතරව මෙම පරීක්ෂණය අවසානයේදී පිරිනමනු ලබන සහතික පත්‍රයට ඇති ඉහළ පිළිගැනීම හේතුවෙන් බොහෝ ඉල්ලුම්කරුවෝ මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කරති.මානව සම්පත් සංවර්ධන අංශය මගින් පිරිනමනු ලබන මෙම සහතික පත්‍රයට දේශීය හා විදේශීය වශයෙන් පිළිගැනීමක් පවතී.

2022 වර්ෂයේදී පවත්වන ලද රේගු මූලස්ථාන අනු නියෝජිත පරීක්ෂණයේ පළමු කණ්ඩායමෙ තොරතුරු පහත වගුව මගින් නිරූපනය වේ.

වගුව **05: 2022-** රේගු මූලස්ථාන අනු නියෝජිත පරීක්ෂණයේ පළමු කණ්ඩායමේ සාරාංශය

පරීක්ෂණය	සහභාගිවූවන්	සමත්වූවන්	ප්‍රතිශතය
2022 පළමු කණ්ඩායම	284	252	88.73%

රේගු පුස්තකාලය

මානව සම්පත් සංවර්ධන සඳහා ඉතා වැදගත් අංගයක් වන රේගු පුස්තකාලය **2005.01.26** වන දින මානව සම්පත් සංවර්ධන අංශය යටතේ අනුබද්ධ ඒකකයක් වශයෙන් ස්ථාපිත කරන ලදි.

දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා පුස්තකාල පහසුකම් සපයන අතර, සාමාජිකයන් නොවන අයට ද පුස්තකාලය භාවිතා කළහැකිය. පොත්වලට අමතරව විවිධ සඟරා හා පුවත්පත් ද ඇති අතර පුස්තකාලය විසින් අනාගත පරිශීලනය සඳහා දෙපාර්තමේන්තු නියෝග, වාර්තා එකතු කර ආරක්ෂා කරනු ලැබේ.

පුස්තකාල සාමාජිකත්වය ඉහල ගොස් ඇති බව නිරීක්ෂණය වී ඇති අතර, එම නිසා ඒ සම්බන්ධයෙන් පහත සඳහන් පහසුකම් සැපයීම අවශ්‍ය වේ.

(අ) භාවිතයට සුදුසු පුස්තකාල මෘදුකාංගයක් හඳුන්වා දීම.
(ආ) නවීන පරිගණක සහිතව අන්තර්ජාල පහසුකම් ලබාදීම.

මානව සම්පත් සංවර්ධන අංශය මගින් සපයන් ලබන අනෙකුත් සේවාවන්

පශ්චාද් උපාධි පාඨමාලාවන්හි පාඨමාලා ගාස්තු ප්‍රතිපූරණය කිරීම

රේගු නිලධාරීන්ට තම ඉදිරි උසස්වීම් සඳහා පශ්චාද් උපාධි සුදුසුකමක් ලබාගැනීම ඉතා වැදගත් වේ. තම පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා රේගු නිලධාරීන්ට දැරීමට සිදුවන පාඨමාලා ගාස්තු ප්‍රතිපූරණය කිරීම මානව සම්පත් සංවර්ධන අංශය මගින් සිදුකරනු ලැබේ.
මෙම සේවාව මගින් රේගු නිලධාරීන්ට පශ්චාද් උපාධි සුදුසුකම් සපුරා තම උසස් අධ්‍යාපන කටයුතු වල නිරත වීමට දෙයීමත් කිරීම පමණක් නොව දීර්ඝ කාලීන වශයෙන් ගත් කළ සමස්ත රාජ්‍ය සේවය තුළ ඉහළම අධ්‍යාපන සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් සහිත දෙපාර්තමේන්තුව බවට රේගු දෙපාර්තමේන්තුව පත්වීම සිදුවනු ඇත.

නිබන්ධන ඉදිරිපත් කිරීම

බඳවා ගැනීමේ පටිපාටියට අනුව තම උසස්වීම් ලබාගැනීම සඳහා පශ්චාද් උපාධි සුදුසුකම වෙනුවට නිබන්ධනයක් ඉදිරිපත් කිරීමට, 2006 වර්ෂයට පෙර සේවයට බැඳුනු නිලධාරීන්ට අවස්ථාව ලබා දී ඇත.එම නිබන්ධන ඉදිරිපත් කිරීමේ සැසිවාරයන් මානව සම්පත් සංවර්ධන අංශය මගින් සංවිධානය කරනු ලබන අතර ඉහළ රේගු නිලධාරීන්ගෙන් සමන්විත නිබන්ධන ඇගයීම් කමිටුවක් මගින් ඒවා ඇගයීම සිදුකරනු ලැබේ. එම නිබන්ධන ඉදිරිපත් කිරීමේ සැසි සම්බන්ධීකරණය කිරීමේ වගකීම රේගු අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන අංශය සතු වේ.

වර්තමානයේදී මානව සම්පත් සංවර්ධන අංශය මුහුණ දෙන අභියෝග සහ යෝජනාවන්

වර්තමානයේදී මානව සම්පත් සංවර්ධන අංශය ක්‍රියාත්මක වනුයේ මුල් අනුමත කාර්ය මණ්ඩලයට වඩා ඉතා අඩු කාර්ය මණ්ඩලයකිනි. (යොමුව: 01 වගුව) එමනිසා, කාල සීමාවකට අනුව දෙපාර්තමේන්තුමය ඉලක්ක සපුරාලීම සඳහා රාජකාරි ඉටු කිරීමට වර්තමාන මානව සම්පත් සංවර්ධන කාර්ය මණ්ඩලයට අතිවිශාල කාර්යයන් ප්‍රමාණයක් මෙහෙයවිය යුතුව පවතින බැවින් එය ප්‍රධාන ගැටළුවක් බවට පත්ව තිබේ.

සමස්ත රේගු දෙපාර්තමේන්තුවේම ධාරිතා සංවර්ධනය කිරීමේ පරම වගකීම මානව සම්පත් සංවර්ධන අංශය වෙත පැවරී ඇති බැවින්, දෙපාර්තමේන්තුවේ වර්ධනය වන පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අපට අවශ්‍ය වේ. එබැවින්, අනුමත කාර්ය මණ්ඩලයට අනුකූලව දැඩි අවශ්‍යතාවක්ව පවතින කාර්ය මණ්ඩල අවශ්‍යතා සපුරාලීම සඳහා රේගු පරිපාලනය අවශ්‍ය පියවර ගත යුතුය.

8.4.3 කාර්යමණ්ඩල සේවා අංශය

අරමුණු

දෙපාර්තමේන්තුමය අරමුණු ඉටුකර ගැනීමේ ක්‍රියාවලියේදී සේවකයන්හට නව්‍ය ආකාරයෙන් හා නිර්මාණාත්මකව දායකවිය හැකි පරිසරයක් සැපයීම .

ප්‍රධාන ක්‍රියාකාරකම්

I. විනය පිළිබඳ කළමනාකරණය:

අදාල නිලධාරීන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් වන්නේ නම් ඒ පිළිබඳව මූලික විමර්ශන හා විනය පරීක්ෂණ පැවැත්වීම, රේගු දෙපාර්තමේන්තුවේ විනය ක්‍රියාපාටිපාටියට අනුගතව ආචාර ධර්ම පද්ධතියක් අනුගමනය කරන්නේද යන්න නිරීක්ෂණය කිරීම, ආචාර ධර්ම පද්ධතිය අනුගමනය නොකරන්නේ නම්, ඔවුන්ට විරුද්ධව විනය ක්‍රියාපටිපාටිය අනුගමනය කොට ආචාර ධර්ම පද්ධතිය ඵලදායි බවට පත් කිරීම.

II. රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම:

සියලු අංශ සම්බනධීකරණය කරමින් විගණකාධිපති විසින් විමසන ලද විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.

III. දුක් ගැනවිලි කළමනාකරණය :

කළමනාකරණය සම්බන්ධව සේවකයින් අතර තෘප්තිය වර්ධනය කිරීම සහ අතෘප්තිය අවම කිරීම සඳහා දුක් ගැනවිලි කළමනාකරණය කිරීම, සබඳතා ගොඩනැගීම සඳහා පිළිගත් වෘත්තීය සමිති සමඟ නිරන්තර සාකච්ඡා පැවැත්වීම. මතභේදාත්මක කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමට සාකච්ඡා කමිටු ස්ථාපිත කිරීම, සේවක ගැටලු හඳුනා ගැනීම සහ සමථයකට පත් කිරීම සඳහා සාකච්ඡා පැවැත්වීම.

IV. සුභසාධක කළමනාකරණය :

දැනට සැපයෙන සුභසාධන සේවා හා ඒවායේ ප්‍රමිතිය හඳුනාගෙන ගුණාත්මක සුභසාධන සේවාවක් සැපයීම පිණිස පියවර ගැනීම.

2022 වර්ෂය සඳහා අංශයේ කාර්යසාධනය

- විනය කළමනාකරණය

මූලික විමර්ශන

2022 වර්ෂයේ පවත්වන ලද මූලික විමර්ශන සංඛ්‍යාව	අවසන් කරන ලද මූලික විමර්ශන සංඛ්‍යාව	දැනට පවතින මූලික විමර්ශන සංඛ්‍යාව
13	01	12

විධිමත් විනය පරීක්ෂණ

පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණ සංඛ්‍යාව	අවසන් කරන ලද විධිමත් විනය පරීක්ෂණ සංඛ්‍යාව	ඉතිරිව පවතින විනය පරීක්ෂණ සංඛ්‍යාව
04	02	02

- විගණන විමසුම් වලට පිලිතුරු සැපයීම

විගණන විමසුම්

ලැබුණු විගණන විමසුම් සංඛ්‍යාව	පිළිතුරු සැපයූ විගණන විමසුම් සංඛ්‍යාව	දැනට පවතින විගණන විමසුම් සංඛ්‍යාව
30	28	2

රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම්

2022 වර්ෂයේදී රාජ්‍ය ගිණුම් කාරක සභා උප කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලද අතර උප කමිටු රැස්වීමේ ව්‍යවස්ථාවෙන් පැන නැඟුණු කරුණු පිළිබඳව කටයුතු කෙරෙමින් පවතී.

- සුබසාධනය

ආපන ශාලාව මගින් සපයනු ලබන සේවාවන්ට අදාළව කමිටු රැස්වීමක් පවත්වන ලද අතර ආපන ශාලාව මගින් සපයනුලබන සේවාවන් පුළුල් කිරීම සහ ගුණාත්මක බවින් යුතු සේවාවන් ලබාදීම පිළිබඳව ආපන ශාලා කළමනාකාරීත්වයට උපදෙස් ලබාදෙන ලදී.

- කාර්ය මණ්ඩල සේවා අංශය ශක්තිමත් කිරීම

පුහුණුවීම්

කාර්ය මණ්ඩලය සඳහා වඩා හොඳ ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම් සලසමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් දෙකක් ලබා දෙන ලදී.

කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීම

කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබාදීමට පහසුකම් සලසමින් අංශයේ කාර්ය මණ්ඩලය පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ ඉහළ කළමනාකාරීත්වයට යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

මූලික විමර්ශන ක්‍රියාවලිය වේගවත් කිරීම

අනවශ්‍ය ප්‍රමාදයන්ගෙන් තොරව මූලික විමර්ශන අවසන් කෙරෙන බවට සහතික වීම අවශ්‍ය වේ. එබැවින්, එම විමර්ශනයන් අවශ්‍ය කරන කාල සීමාව තුළ අවසන් කෙරෙන බවට සහතික වීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

8.4.4 සේවා සැපයීම් අංශය

හැඳින්වීම

එලදායී ලෙස හා විනිවිදභාවයෙන් යුතුව රේගුවේ සියලුම අංශයන් සඳහා සියලු අවශ්‍යතා සැපයීම, නඩත්තු කිරීම හා සේවා කටයුතු සිදු කිරීම සේවා සැපයීම් අංශයේ ප්‍රධාන පරමාර්ථය වේ.

ප්‍රධාන කාර්යයන්

- දෙපාර්තමේන්තුවේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් නියමිත වේලාවට අදාළ අංශ වෙත සේවා හා සැපයීම් ලබාදීම.
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා භාණ්ඩාගාර චක්‍රලේඛවලට අනුගත වෙමින් විනිවිදභාවයෙන් යුක්ත ආකාරයට භාණ්ඩ හා සේවා මිලදී ගැනීම.
- විධිමත් ආකාරයේ තොග පාලනයක් හා කාර්යක්ෂම ගබඩා කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යාම සහතික කරමින්, මිලදී ගන්නා භාණ්ඩවල ආරක්ෂාව හා උපරිම ප්‍රයෝජනය සැලසෙන පරිදි ගබඩා කිරීම හා ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම.
- රේගු දෙපාර්තමේන්තුවේ වංචල හා නිශ්චල වත්කම් කළමනාකරණය.
- සැලසුම්ගත පරිදි නව රේගු මූලස්ථාන ගොඩනැගිල්ල තුළ ඉදිකිරීම් කටයුතු සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීම සහ විධිමත් පරිශ්‍ර කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන බවට සහතික වීම.
- රේගු දෙපාර්තමේන්තුවේ රථවාහන සමූහය උපරිම ධාවන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා සුදුසු පියවර ගැනීමට වග බලා ගැනීම.

2022 වර්ෂය තුළ කාර්ය සාධනය **3.8** කොටසෙහි සහ **7** වන පරිච්ඡේදයෙහි සඳහන් වේ.

8.5 පළාත් පර්ෂදය

8.5.1 මගී සේවා (කටුනායක) අංශය

8.5.2 මගී සේවා (කොළඹ) අංශය

8.5.3 ආදායම් හා සේවා (කටුනායක) අංශය

8.5.4 ආදායම් හා සේවා (ප්‍රාදේශීය) අංශය

8.5.1 මගී සේවා අංශය (කටුනායක)

ශ්‍රී ලංකා රේගුව යනු ශ්‍රී ලංකා දේශ සීමාව හා සම්බන්ධ අදාළ රාජකාරී සහ කාර්යයන් ඉටු කරමින්, ශ්‍රී ලංකාවට පැමිණෙන සහ ශ්‍රී ලංකාවෙන් පිටත්වන මගීන් සහ ඔවුන් සතු භාණ්ඩ පාලනය සහ නියාමනය සිදු කරමින් ශ්‍රී ලංකාව තුළ සියළුම අන්තර්ජාතික ගුවන්තොටුපොළවල් සම්බන්ධව කටයුතු කරන්නා වූ දේශසීමා නියාමන නියෝජිතායතනයකි. රේගුව හරහා මගීන්ගේ ගමන් බිමන් සඳහා අවශ්‍ය පහසුකම් සපයමින් නීති විරෝධී අයුරින් භාණ්ඩ ගෙන ඒම සහ රටින් ගෙන යාම වලක්වාලීම උදෙසා රේගු නීති රීති සහ ඒ සම්බන්ධ අනෙකුත් නීති බලාත්මක කරමින් රේගුව ද්විත්ව කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ගුවන් තොටුපොළ අංශය, අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (පළාත්) ගේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන අතර ගුවන් තොටුපොළ මගීන් රට තුලට පැමිණීම සහ රටින් පිටවීම සහ ඔවුන්ගේ ගමන් මලු කාර්යක්ෂමව පාලනය කිරීම පිළිබඳව සහතික වීම උදෙසා වගකිව යුතුවේ.

ගුවන් තොටුපොළෙහි දෛනික කාර්යයන් විධිමත්ව ක්‍රියාත්මක කිරීම පිළිබඳව සහතිකවීම, ගුවන් තොටුපොළට අනුයුක්ත කර ඇති රේගු අධ්‍යක්ෂවරයා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් යටතේ සිටින රේගු අධිකාරීවරුන්ගේ වගකීමකි. ගුවන් තොටුපොළෙහි රාජකාරී සඳහා සේවා මුර යටතේ රාජකාරියේ යෙදෙන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණය යටතේ රේගු අධිකාරීවරයා විසින් නිවාඩු දින, සති අන්ත සහ කාර්යාල වේලාවෙන් පසුව පරිපාලනමය කාර්යයන්හි නිරත වනු ලැබේ.

රේගුවෙහි අරමුණු අතර ගුවන් තොටුපළ අංශය විසින් පහත සඳහන් අරමුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලබයි .

- රට තුළට පැමිණෙන හා රටින් පිට වන මගීන්ගේ ප්‍රවේශය හා පිටවීමේ කාර්යාවලිය විධිමත් පටිපාටිය ඔස්සේ සිදු කිරීමට සහ මගී ගමන් මලු නිෂ්කාශනය සඳහා පහසුකම් සැපයීම.
- ආදායම සුරක්ෂිත කරමින් සීමා කරනු ලැබූ සහ තහනම් කරනු ලැබූ භාණ්ඩ ආනයනය සහ අපනයනය වැලැක්වීම
- නීති විරෝධී භාණ්ඩ සංචරණය වැළැක්වීම, අනාවරණයකර ගැනීම සහ මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට එරෙහි වැඩ පැවැත්වීමේ කටයුතු සිදු කිරීම
- සමාජයෙහි සමාජ-ආර්ථික, සංස්කෘතික සහ පාරිසරික බැඳියාවන් ආරක්ෂා කිරීම

රේගු කාර්යයන් ඉටු කිරීමේ දී නිලධාරීන් විසින් රේගු ආඥා පනතේ (235 වන අධිකාරය) හි අඩංගු විධිවිධාන හා අදාළ අනෙකුත් නීති රෙගුලාසි ප්‍රකාරව පහත සඳහන් කරුණු පිළිබඳව අදාළ අවශ්‍ය අධිකාරය ලබා ගනී.

- සත් භාවයකින් යුතුව රට තුළට පැමිණෙන හා රටින් පිටවන මගීන්ගේ ප්‍රවේශය හා පිටවුම මෙන්ම ඔවුන්ගේ ගමන් මලු ගෙන යාම සහ ඒම සඳහා පහසුකම් සැලසීම.
- එක් ගුවන්යානයකින් තවත් ගුවන්යානයකට මාරුවන මගීන් වෙත සහ එම මගින්ගේ ගමන් මලු ගෙන යාම සහ ඒම සඳහා පහසුකම් සැලසීම.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළහි ප්‍රභූ ගමන් බිමින් (VVIP,VIP) සේද මාර්ග මගීන් සහ වාණිජමය වශයෙන් වැදගත් වන මගීන් (CIP) ප්‍රවේශය හා පිටවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- ශ්‍රී ලංකාවට පැමිණෙන හා ඉන් පිටවන ගුවන් යානා හා ඒවායේ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත්වන ගුවන්යානා සඳහා නිෂ්කාශන කටයුතු සිදු කිරීම .
- අවශ්‍ය අවස්ථාවන්හිදී මගීන් කැටුව එන ගමන්මලු පරීක්ෂා කිරීම .
- මගී ගමන් මලු සඳහා තීරුබදු රහිත ගමන් මලු දීමනාව ලබා දීම .
- වාණිජමය ප්‍රමාණයන්ගෙන් යුත් සහ වාණිජ ස්වභාවයේ භාණ්ඩ වලින් සමන්විත ගමන්මලු සඳහා තීරුබදු හා අනෙකුත් බදු අය කර ගැනීම.
- අවශ්‍ය අවස්ථාවලදී ATA කානේ පත්, ඇපකර හා විශේෂ තැන්පතු මත භාණ්ඩ මුදා හැරීම සහ අවශ්‍ය අවස්ථාවලදී පසු විපරම් කාර්යයන් සිදු කිරීම .
- ශ්‍රී ලංකාවට ගෙන එන සහ ශ්‍රී ලංකාවෙන් රැගෙන යන මැණික් පාර්සල් සම්බන්ධ නිෂ්කාශන කටයුතු ඉටු කිරීම
- රට තුළට පැමිණෙන/ ඉන් පිටවන මගීන්ගේ විදේශ මුදල් සම්බන්ධ රේගු සටහන් කර හෙවත් ප්‍රකාශන මාර්ගගතව ඉදිරිපත් කිරීම සහ ඒ සඳහා නිල රිසිට්පත් නිකුත් කිරීම.
- මගියා පිට වූ පසු ඔහු විසින් රැගෙන නොගිය මලු ඇටෝනි බලපත්‍ර සහිත බලයලත් පුද්ගලයෙකු හට ඉතිරි ගමන් මලු දීමනාව ලබා දීම අනුමත කිරීම.
- අක්‍රමවත්ව හසුරුවනු ලැබූ ගමන් මලු නිෂ්කාශනය .
- රාජ්‍ය තාන්ත්‍රික තැනැත්තන්ගේ ගමන් මලු නිෂ්කාශනය.
- අවශ්‍ය අවස්ථාවලදී පුද්ගලයින් පරීක්ෂණයට ලක් කිරීම

- සීමා කරනු ලැබූ සහ තහනම් කරනු ලැබූ භාණ්ඩ ආනයනය සහ අපනයනය වැලැක්වීම
- රේගු නීති රීති උල්ලංඝනය කරනු ලබන වැරදි හඳුනාගනු ලැබුවහොත් ඒ සම්බන්ධ පරීක්ෂණ සහ විමර්ශන පැවැත්වීම
- සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීම, දඩ මුදල් අයකර ගැනීම සඳහා උචිත ක්‍රියා මාර්ග ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී අධිකරණ ක්‍රියාමාර්ග හරහා තවදුරටත් තහනමට ගත් භාණ්ඩ රාජසන්තක කිරීම සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීම
- රේගු අධීක්ෂණය යටතේ හිමිකම් නොපෑ භාණ්ඩ ඉවත් කිරීම සඳහා පහසුකම් සැපයීම
- රේගු අධීක්ෂණය යටතේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් රඳවාගත් භාණ්ඩ විනාශ කිරීම අධීක්ෂණය කිරීම
- රේගු ආඥා පනතේ (235 වන අධිකාරය) ප්‍රකාරව තහනමට ගත් අයිතමයන් ඉවත් කිරීම, දඩ මුදල් ගණනය කිරීම සහ අභිමිකරණ හා දණ්ඩන ක්‍රියාමාර්ග ගැනීම.
- සංචාරකයින් හා සම්බන්ධයෙන් වූ සංචාරක වැට බදු ආපසු ගෙවීමේ ක්‍රමය යටතේ TVRS ඉන්වොයිසි අනුමත කිරීම මගින් අගය එකතු කළ බදු නැවත ගෙවීම සඳහා පහසුකම් සැලසීම
- ගුවන් තොටුපළෙහිදී ක්‍රියාත්මක වන අනෙකුත් නියෝජ්‍යායතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම

කාර්ය සාධනය

ආදායම	වටිනාකම (රු.)
රේගු ආනයන බදු (CID)	23,714 ,908
එකතු කළ අගය මත බදු (VAT)	159,732,568
වරාය හා ගුවන්කොටුපළ සංවර්ධන බදු (PAL)	70,650,933
ආනයන සෙස් බදු	177,446,655
දඩ	167,268,509
අධිභාර	2,675,688
සමාජ ආරක්ෂණ බදු (SSL)	14,130,813
වෙනත් ගාස්තු	Amount (Rs.)
අධිභාර ගාස්තු	1,542,840
අතිකාල ගාස්තු	8,864,300
DFSC රේගු ගාස්තු	415,200
පරිගණක ගාස්තු	4,106,000

අනාවරණය කරගත් සිද්ධි සංඛ්‍යාව	169
රාජසන්තක කළ භාණ්ඩවල වටිනාකම (රු.)	2,048,487,834
රාජසන්තක කල මුදල්වල වටිනාකම (රු.)	228,996,874
රාජසන්තක කළ මැණික්වල වටිනාකම	182,500
රාජසන්තක කළ රත්‍රංවල වටිනාකම	1,813,161,809
රාජසන්තක කළ රිදීවල වටිනාකම	480,000
රාජසන්තක කළ දුම්කොළ නිෂ්පාදනවල වටිනාකම	Not Valued
අනාවරණය කරගත් ඖෂධ ප්‍රමාණය (ග්‍රෑ.)	3,389
පැවැත්වූ රේගු විමර්ශන සංඛ්‍යාව	133
රඳවාගත් තහනම්කළ අයිතම සංඛ්‍යාව	
විලවුන් (සංඛ්‍යාව)	3,389
කෘමිනාශක (කි.ග්‍රෑ.)	710
පොහොර (කි.ග්‍රෑ.)	145
ඉඟුරු (කි.ග්‍රෑ.)	258
එනසාල් (කි.ග්‍රෑ.)	2,564
කහ (කි.ග්‍රෑ.)	2,409
කජු (කි.ග්‍රෑ.)	626
ජංගම දුරකථන (සංඛ්‍යාව)	4,031

රාජසන්තක කරන ලද සිගරට් සංඛ්‍යාව	1,419,335

8.5.2 මගී සේවා (කොළඹ) අංශය

අරමුණු

විදේශ රැකියාවන්හි නියුතු විදේශගත ශ්‍රමිකයන් සහ වෘත්තිකයන් කෙරෙහි විශේෂ සැළකිල්ලක් යොමු කරමින් කොළඹ වරායේ සහ කොළඹ පිහිටි පෞද්ගලික ගමන්මළු ගුදම්වලදී මගීන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට තම ගමන්මළු නිෂ්කාශණ කාර්යයයේදී ආචාරශීලී සහ සතුටුදායක සේවාවක් කාර්යක්ෂම සහ ඵලදායී අයුරින් සැපයීම.

ප්‍රධාන කාර්යයන්

- රට තුළට පැමිණෙන හා රටින් පිට වන මගීන් සහ මගී ගමන් මලු නිෂ්කාශනය සඳහා පහසුකම් සැපයීම
- ආදායම සුරක්ෂිත කරමින් සීමා කරනු ලැබූ සහ තහනම් කරනු ලැබූ භාණ්ඩ ආනයනය සහ අපනයනය වැලැක්වීම
- සමාජයෙහි සමාජ ,ආර්ථික- සංස්කෘතික සහ පාරිසරික බැඳියාවන් ආරක්ෂා කිරීම
- කැටුව නොඑන මගී ගමන්මළුලු ගුදම් පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම

කැටුව නොඑන මගි ගමන්මළු ගුදම් ලැයිස්තුව

- ගමන්මලු කාර්යාලය- විකිණුම් (BO Sales)
අප්‍රේල්	1,447,573	41,768,728	0	43,216,301
මැයි	2,233,588	32,066,020	0	34,299,608
ජූනි	3,748,718	23,376,955	0	27,125,673
ජූලි	3,213,757	4,309,415	0	7,523,172
අගෝස්තු	6,069,479	26,794,368	5,000,000	37,863,847
සැප්තැම්බර්	8,475,038	24,887,402	0	33,362,440
ඔක්තෝබර්	15,657,881	35,185,982	9,347,625	60,191,488
නොවැම්බර්	9,160,840	28,795,930	61,690	38,018,460
දෙසැම්බර්	21,639,630	61,176,304	0	82,815,934
එකතුව	**78,691,264**	**391,343,248**	**14,409,315**	**484,443,827**



1.2 කැටුව නොඑන මගී ගමන් මලු : තීරු බදු හා ගාස්තු සහ දණ්ඩන -2022 (රු.)

මාසය	තීරු බදු හා වෙනත් ගාස්තු	දණ්ඩන/ රාජසන්තක කිරීම්/ ලිහිල් කරන ලද රාජසන්තක කිරීම්	විකිණීමෙන් ලද මුදල්	එකතුව

ජනවාරි	3,740,040	4,165,580	0	7,905,620
පෙබරවාරි	3,050,942	1,804,584	0	4,855,526
මාර්තු	7,219,969	3,625,855	0	10,845,824
අප්‍රේල්	4,329,753	391,982	0	4,721,735
මැයි	4,696,771	1,953,881	0	6,650,652
ජූනි	4,122,679	6,223,187	0	10,345,866
ජූලි	5,070,324	3,224,391	0	8,294,715
අගෝස්තු	5,937,382	24,255,579	47,670	30,240,631
සැප්තැම්බර්	12,392,087	17,479,104	0	29,871,191
ඔක්තෝබර්	9,236,667	28,539,295	0	37,775,962
නොවැම්බර්	4,480,119	27,469,321	0	31,949,440
දෙසැම්බර්	1,570,558	45,478,132	0	47,048,690
එකතුව	**65,847,291**	**164,610,891**	**47,670**	**230,505,852**



1.3 ජංගම ඒකකය: තීරු බදු හා ගාස්තු සහ දණ්ඩන 202 -2(.රු)

මාසය	තීරු බදු හා වෙනත් ගාස්තු	දණ්ඩන/ රාජසන්තක කිරීම්/ ලිහිල් කරන ලද රාජසන්තක කිරීම්	විකිණීමෙන් ලද මුදල්	එකතුව

ජනවාරි	0	9,685,660	0	9,685,660
පෙබරවාරි	0	3,379,013	0	3,379,013
මාර්තු	0	24,813,968	0	24,813,968
අප්‍රේල්	0	36,445,509	0	36,445,509
මැයි	2,752,258	12,067,943	0	14,820,201
ජූනි	0	19,178,869	0	19,178,869
ජූලි	1,617,455	9,991,651	0	11,609,106
අගෝස්තු	0	9,655,710	0	9,655,710
සැප්තැම්බර්	0	35,015,548	0	35,015,548
ඔක්තෝබර්	9,030	52,248,836	0	52,257,866
නොවැම්බර්	0	50,230,406	0	50,230,406
දෙසැම්බර්	1,740,104	24,392,642	0	26,132,746
එකතුව	**6,118,847**	**287,105,755**	**0**	**293,224,602**



2. <u>2022 වසර තුල කාර්ය සාධනය (.රු)</u>

මාසය	තීරු බදු හා වෙනත් ගාස්තු	දණ්ඩන/ රාජසන්තක කිරීම්	විකිණීමෙන් ලද මුදල්	මුළු අයකර ගැනීම්

ජනවාරි	5,693,668	30,076,204	0	35,769,872
පෙබරවාරි	3,160,978	35,532,722	0	38,693,700
මාර්තු	12,201,065	94,847,878	0	107,048,943
අප්‍රේල්	5,777,326	78,606,219	0	84,383,545
මැයි	9,682,617	46,087,844	0	55,770,461
ජූනි	7,871,397	54,779,011	0	62,650,408
ජූලි	9,901,536	17,525,457	0	27,426,993
අගෝස්තු	12,006,861	60,705,657	5,047,670	77,760,188
සැප්තැම්බර්	20,867,125	77,382,054	0	98,249,179
ඔක්තෝබර්	24,903,578	115,974,113	9,347,625	150,225,316
නොවැම්බර්	13,640,959	106,495,657	61,690	120,198,306
දෙසැම්බර්	24,950,292	131,047,078	0	155,997,370
එකතුව	**150,657,402**	**849,059,894**	**14,456,985**	**1,014,174,281**

3. 2016,2017,2018, 2019, 2020, 2021 සහ 2022 වසරවල කාර්යසාධනය සැසඳීම (.රු)

වසර	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
2016	17,698,812	17,811,346	138,286,404	89,141,272	119,850,551	113,060,721	64,182,599	62,556,875	91,189,599	129,781,900	80,145,852	97,893,847	**1,021,599,778**
2017	66,144,454	75,714,798	127,269,787	69,029,645	110,082,914	123,500,044	52,390,280	80,939,513	56,554,884	68,507,892	95,581,361	93,856,568	**1,019,572,140**
2018	71,777,006	43,664,952	95,365,260	51,143,731	61,029,325	57,401,795	74,483,225	45,049,287	75,061,641	76,976,381	64,909,153	58,271,611	**775,133,367**
2019	49,698,510	39,240,402	108,407,495	109,312,985	63,012,892	35,264,648	128,786,509	83,242,220	62,247,164	69,953,464	122,664,049	86,279,538	**958,109,875**
2020	39,112,637	53,692,037	25,464,056	8,988,117	24,100,403	58,690,040	65,388,804	31,022,306	79,133,770	116,556,119	23,786,977	52,463,502	**578,398,768**
2021	36,888,630	69,252,619	75,108,398	46,358,479	45,156,992	53,449,188	48,817,749	69,930,879	60,676,187	84,035,927	56,332,065	44,886,278	**690,893,391**
2022	36,816,074	40,453,374	118,200,152	86,844,212	56,408,534	65,002,017	30,493,054	77,760,188	98,868,546	152,007,301	125,975,271	164,685,919	**1,053,514,642**



4. 2011202-2 දක්වා කාලසීමාවේදී අයකර ගැනීම්වල එකතුව (.රු)

	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022
දණ්ඩන/ ලිහිල්කරන ලද රාජසන්තක කිරීම් සහ තීරුබදු හා වෙනත් ගාස්තු	671,474,362	407,821,431	511,089,957	461,475,705	392,305,046	997,205,323	980,366,355	669,046,773	833,713,797	552,342,478	688,416,725	**1,039,057,657**
විකිණීමෙන් ලද මුදල්	58,642,363	91,004,686	113,553,285	64,908,466	15,394,455	24,394,455	39,205,785	106,086,594	124,396,078	26,056,290	2,476,666	**14,456,985**
එකතුව	**730,116,725**	**498,826,117**	**624,643,242**	**526,384,171**	**1,021,725,682**	**1,021,599,778**	**1,019,572,140**	**775,133,367**	**958,109,875**	**578,398,768**	**690,893,391**	**1,053,514,642**



8.6.4 අභියාචනා අංශය

හැඳින්වීම

ශ්‍රී ලංකා රේගුවේ අභියාචයා අංශය ලෝක රේගු සංවිධානයේ (WCO) සංශෝධිත කියෝතෝ ප්‍රඥාප්තිය (RKC) හා ලෝක වෙළඳ සංගමයේ (WCO) වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුමේ (TFA) විධිවිධාන යටතේ දක්වා ඇති ජාත්‍යන්තර වෙළඳ ක්‍රියාමාර්ගයන්ට අනුකූලව පිහිටුවා ඇත.
මෙම අංශය ඍජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මකවේ .
රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරන අභියාචනා සළකාබලා වෙළඳාම සඳහා පහසුකම් සැලසීම, කරුණු සනාථ කර ගැනීමෙන් අනතුරුව සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම හා පසු විපරම් සිදුකිරීම මෙම අංශයේ අරමුණු වේ.
පරිපාලන ක්‍රියාමර්ග හෝ මෙහෙවර නිවැරදි කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස සුදුසු විටක සමාලෝචනය කිරීම සඳහා ඵලදායි අභියාචනා යාන්ත්‍රණයක් ඇති කිරීමේ අරමුණ ඇතිව අභියාචනා කමිටුවක් පත් කර ඇත. රේගු අධ්‍යක්ෂ(අභියාචනා) තනතුර අනුව මෙම කමිටුවේ සාමාජිකයෙකු වන අතර ක්‍රමානුකූල පදනම්න් කමිටුවට සහභාගීවීම මගින් අනෙකුත් සාමාජිකයින් ඔහුට සහය දක්වනු ඇත.
රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රේගු අධ්‍යක්ෂ (අභියාචනා) වෙත යොමු කරනලද අභියාචනා එහි වලංගුතාවය හා විෂයපථය තහවුරු කර ගැනීම සඳහා රේගු අධ්‍යක්ෂ (අභියාචනා) විසින් පරීක්ෂාකර බලනු ලැබේ. ක්‍රියාකිරීම සඳහා වැඩිදුර තොරතුරු හා කරුණු අවශ්‍ය කෙරෙන අභියාචනා, විස්තරාත්මක වාර්තා හා විෂයට අදාල වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා අදාල අංශ වෙත යොමු කෙරේ.
මෙම තොරතුරු ලබාගැනීමෙන් පසුව පමණක් යම් සහනයක් සැලසීම සඳහා සළක බැලීම පිණිස අභියාචනා කමිටුවට ඉදිරිපත් කිරීමට රේගු අධ්‍යක්ෂට (අභියාචනා) හැකිවේ.
එබැවින් සෑම වසරකම අභියාචනා කමිටුව වෙත යොමු කරන අභියාචනා සංඛ්‍යාව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම අංශයට යොමුකරන අභියාචනා සංඛ්‍යාව මත රදා පවතී.

මෙම අංශයේ කාර්ය සාධනය

	කාර්යසාධනය	ප්‍රතිශතය
2022 වසරේදී ලියාපදිංචිවූ අභියාචනා සංඛ්‍යාව	96	-
2021 දෙසැම්බර් අවසානය වනවිට ඉතිරිව ඇති අභියාචනා සංඛ්‍යාව	23	-
2022 වසරේදී සළකා බැලියයුතු මුළු අභියාචනා සංඛ්‍යාව	119	-
2022 වසරේදී සළකා බලන ලද අභියාචනා සංඛ්‍යාව	108	90.75%
2022 වසරේදී නිමකරන ලද අභියාචනා සංඛ්‍යාව	84	70.58%
පසු විපරම් සිදුකරනු ලැබූ අභියාචනා සංඛ්‍යාව	84	70.58%

8.6.5 නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශය

හැඳින්වීම

1994 අංක 08 දරන හා 1990 අංක 40 දරන පනතින් සංශෝදිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, ශ්‍රී ලංකා රජයේ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) බදු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවෙන ප්‍රධාන නෛතික මූලාශ්‍රයි.

මුදල් අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා රේගුව යටතේ ක්‍රියාත්මක වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) අංශය විසින් ජාතියේ සුභසිද්ධිය උදෙසා නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ ඇති විධිවිධාන සහ ඒ යටතේ සාදනු ලැබූ නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති ආයතනය ලෙස ජාතික වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

ප්‍රධාන කාර්යයහන්

1. **සිගරැට් හා අනෙකුත් අදාල නිෂ්පාදන ආයතන අධීක්ෂණය සහ නියාමනය තුළින් නිවැරදි ලෙස ආදායම රැස්කිරීම.**
2. **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු පනතේ නීති බලාත්මක කිරීමේ අධිකාරිය ලෙස කටයුතු කිරීම සහ නිෂ්පාදන බදු වලට යටත් අදාළ ආනයනික සහ එමගින් දේශීය වශයෙන් නිෂ්පාදිත අයිතමයන් මත පැනවෙන නිෂ්පාදන බදු රැස් කිරීම.**
3. **නිෂ්පාදන බදු පැනවීම සම්බන්ධ කටයුතුවල නිරතවීම.**

මෙහෙවර සහ අරමුණු

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශයේ මෙහෙවර වන්නේ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන ලද හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද භාණ්ඩ සඳහා පනවා ඇති නිෂ්පාදන බදු ආදායම කාර්යක්ෂම ලෙස එකතු කිරීම මගින් ජාත්ක සංවර්ධන ක්‍රියාවලියට දායක වීමයි.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අංශයේ අරමුණු වඩාත් පුළුල් ආකාරයෙන් පහත පරිදි හඳුනාගනු ලැබිය හැකිය :-

අ. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම.
ආ. ඛනිජ තෙල්, සිගරැට්, සිසිල් බීම, තුරඟ ප්‍රකාශන, දේශීයව එකලස් කරන ලද වාහන, මේද අම්ල, පලතුරු බීම හා නිෂ්පාදන බද්දට අයත් අනෙකුත් අයිතම වලින් එන බදු ආදායම එකතු කිරීම සහ ආරක්ෂා කිරීම.

පද්ධති සහ ක්‍රියා පටිපාටි

මෙම අංශය ආරම්භ කළ දින සිට පනත යටතේ සාදන ලද රේගුලාස් සහ නියෝගමාලා ඇතුළත් ගැසට් නිවේදන කලින් කලට නිකුත් කරනු ලැබ ඇත. නිෂ්පාදන බදුවල ව්‍යුහය ද ඉහත රෙගුලාසි සහ නියෝගයන්ට අනුව ක්‍රියාත්මක කරනු ලැබිණි.

2022 වසර තුළ සිදුකළ මූලික වෙනස්කම්

සිගරැට් සඳහා නිෂ්පාදන බදු

i. සිගරැට් සඳහා වන ස.ව.කේත **2402.20, 2402.30, 2402.40, 2402.50, 2402.60** සංශෝදනය කිරීම – (**2022.12.31** දිනැති අංක. **2312/68** දරණ ගැසට් නිවේදනය සංශෝධනය කිරීම)

ii. **MIB** ක්‍රියාවලිය යටතේ බැදුම්කර අංශය විසින් දේශීයව එක්ලස් කරන ලද වාහන මත බදු එකතුකරනු ලැබේ. එය නිවැරදි කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ පාර්ශව සමග සාකච්ඡා කිරීමට නියමිතයි.

2021 සහ 2022 වසර තුළ නිෂ්පාදන බද්දට යටත් අයිතම සහ එකතුකරන ලද ආදායම (දේශීය) (රු.මිලියන)

	2021	**2022**
සිගරැට්	90,698.92	103,57**0.84**
ඛණිජ තෙල්	9,078.63	2,398.34
මෝටර් රථ (දේශීයව එකළස් කරන ලද)	824.02	1,5**5.48**
සිසිල් බීම	2,531.75	3,184.83
තුරඟ ප්‍රකාශන	9.57	11.99
විදුලි භාණ්ඩ (දේශීය) වෙනත්	13.86	**0**
පළතුරු බීම	153.52	189.68
මේද අම්ල	3.68	4.00
උසාවි ආදායම	0.22	00
ලියාපදංචි ගාස්තු	0.004	0.009
එකතුව	**103,314.17**	**109,515.17**

දේශීය ක්‍රියාකාරකම්

හිඟ බදු සහ දඩ මුදල් අයකර ගැනීම සඳහා නිෂ්පාදන බදු ගෙවීම පැහැර හරිනු ලැබූ සමාගම් වලට විරුද්ධව නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනු ලැබ ඇත. විස්තර පහත දක්වා ඇත.

උසාවියෙහි විභාග කරන ලද නඩු සංඛ්‍යාව	04
ඉදිරියට ගෙනගිය නඩු සංඛ්‍යාව	01
වර්ෂය තුළදී ගොනු කළ නඩු සංඛ්‍යාව	00
වර්ෂය තුළදී අවසන් කළ නඩු සංඛ්‍යාව	03 (ලියාපදිංචි නොකිරීම සඳහා නඩු ගොනු කරන ලදී)
වර්ෂය තුළදී අයකරගත් ආදායම	00

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. PUR/A/CUS/2022/FA

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 30 දින

රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විතව මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ඇස්තමේන්තුගත තක්සේරු වටිනාකම රු. 4,420,000 ක් වූ වාහන 06ක් රු. 11,920,200 ක වටිනාකමකට විකුණා තිබුණු නමුත් එකී වත්කම්වල වටිනාකම ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට අනුව දේපල පිරියත හා උපකරණවලට වර්ෂයේ එකතු වූ වටිනාකම රු. 1,427,868,086 ක් වුවද, භෞතික වත්කම් අලුත්වැඩියා වියදම් රු.83,258,004 ක් ද සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 1,511,126,090 ක් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වූ මුදල් ගෙවීම් ප්‍රවාහය රු.83,258,004 න් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් වටිනාකම රු. 4,171,150,000 ක් ලෙස දැක්වුවද, පොදු 287 ආකෘතියේ පවත්වාගෙන යනු ලබන වත්කම් ලේඛනයේ අදාල වටිනාකම් නොදැක්වුනු බැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඉඩම් වටිනාකම සැසඳීමට නොහැකි විය.

1.6.2 තැන්පතු ගිණුම් ශේෂ

(අ) රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල සහ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල යන තැන්පතු ගිණුම් දෙකට අදාලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2022 ජනවාරි 01 දිනට දැක්වුණු ශේෂයන් ඒසිඒ 4 ප්‍රකාශනයේ ආරම්භක ශේෂයන් සමග සැසඳීමේදී පිළිවෙලින් රු. 2,122,369 ක සහ රු. 11,264,393 ක වෙනසක් වූ අතර හේතු හඳුනාගැනීමකින් තොරව එකී වෙනස රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට 2016 දක්වා ගුවන් මගීන් රැගෙන එන භාණ්ඩ පිළිබඳ තැන්පතු ගිණුමේ ආරම්භක ශේෂය රු. 2,003,201 ක් වැඩියෙන් සටහන් කර තිබුණද, එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

1.6.3 අග්‍රිම ශේෂය

2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ මාර්ගස්ථව පැවති මුදල් ශේෂය රු.196,139,682 ක් වූ අතර දෙපාර්තමේන්තුවේ ගිණුම් අනුව මාර්ගස්ථ මුදල් ශේෂය රු.4,648,584,888 ක් වීම නිසා පොත් අනුව රු.4,452,445,206 ක වෙනසක් පැවතුණි.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

2022 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2277 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.2,143,225,499 ක් ද රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.1,064,935,195 ක්ද වශයෙන් එකතුව රු.3,208,160,694 ක් ගෙවා තිබූ අතර එකී වියදම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ සාක්ෂිය වන සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. රේගුවේ අංශ 04ක පැමිණීමේ සහ පිටවීමේ ලේඛන, අතිකාල ලේඛන සහ නිවාඩු ලේඛන පරීක්ෂාවේදී සති අන්තයන් සහ රජයේ නිවාඩු දිනයන්ද ඇතුළුව නිවාඩු නොගෙන සෑම දිනකම සේවකයන් සේවයට වාර්තා කර තිබුණි. මෙම සේවකයන් දිනකට පැය 24ක් දක්වා අතිකාල දීමනා ද ලබා ගන්නා අතර පැමිණීම් සහ පිටවීම් පිළිබඳව නිසි සනාථ කිරීමකින් තොරව ඉහත ගෙවීම් සිදු කරන බව නිරීක්ෂණය කෙරේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

රේගු අධ්‍යක්ෂ ජනරාල් ආදායම් සංකේත 13 කට අදාලව ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු වශයෙන් කටයුතු කර තිබුණි. එම ආදායම් සංකේත සම්බන්ධව පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තු ගත ආදායම

(i) ආදායම් සංකේත 12 කට අදාලව මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර සියයට 8 සිට සියයට 81 දක්වා වූ පරාසයක ඌණ විචලනයක් විය.

(ii) ඒසීඒ - 1 (ii) ලේඛනය ප්‍රකාරව මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර වෙනස ප්‍රතිශතයක් ලෙස දැක්වීමේදී එකී වෙනස මූලික ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස ගණනය කළ යුතු වුවද, ආදායම් සංකේත 12 ක ඒ වෙනුවට සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව මූලික ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස ගණනය කර දක්වා තිබූ අතර මේ හේතුව නිසා ආයතනය විසින් වෙනසට හේතු වශයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු පිළිගත නොහැකි විය.

(ආ) **සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම හා තත්‍ය ආදායම**

ආදායම් ශීර්ෂයන් 3ක සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 05 සිට සියයට 19 ක් දක්වා වූ පරාසයක ඌණ විචලනයක් සිදු වී තිබුණි.

(ඇ) **පූර්ව වර්ෂයේ ආදායම් සමඟ සැසඳීම**

(i) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා පූර්ව වර්ෂයේ ආදායම් සමඟ සැසඳීමේදී ආදායම් සංකේතාංක 07 කට අදාලව ආදායමෙහි සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණු අතර එය සියයට 4 සිට සියයට 28 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ii) ආනයන සීමා කිරීම මත හා රුපියල අවප්‍රමාණය වීම මත ඉහත ශීර්ෂවල ආදායම් පූර්ව වර්ෂයට සාපේක්ෂව අඩු වී තිබුණ ද සමහර ශීර්ෂවල ආදායම් රැස්කිරීම පොදුවේ පූර්ව වර්ෂයට සාපේක්ෂව වර්ධනය වී තිබුණි. ඒ අනුව ආදායම් සංකේත 04 කට අදාලව පූර්ව වර්ෂයට සාපේක්ෂව වර්ධනයක් නිරීක්ෂණය වූ අතර එය සියයට 11 සිට 43 ක පරාසයක් ගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා රේගුව විසින් රැස්කරන ලද සමස්ථ ආදායම රු.523,346,484,733 ක් වූ අතර රු.104,160,061,906 ක මුදලක් සිගරට් මත අයකරන බද්දෙන් එකතු කර තිබූ අතර එය සමස්ථ ආදායමින් සියයට 20 ක් විය. එය පූර්ව වර්ෂයට සාපේක්ෂව සියයට 18ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

(iv) ඇඟළුම් සඳහා දේශීය විකුණුම් මත ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ දී රු.196,200,390 ක් රැස්කර තිබූ අතර එම අගය පූර්ව වර්ෂයට සාපේක්ෂව සියයට 36 ක වර්ධනයක් පෙන්නුම් කරයි.

(v) දඩ හා රාජසන්තක ආදායම ලෙස පූර්ව වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල රු.457,854,736 ක වර්ධනයක් පෙන්නුම් කර තිබූ අතර එය පූර්ව වර්ෂයට සාපේක්ෂව සියයට 11 ක වර්ධනයක් පෙන්නුම් කල ද සමස්ථ ආදායම ඉහල යාමේ දායකත්වය සියයට 0.9 කි.

(vi) සමාලෝචිත වර්ෂය තුල දී ශ්‍රී ලංකා රේගුව විසින් වාහන හිමිකම මත අයකරන බද්ද ලෙස රු.108,004,802 ක් රැස් කර තිබූ අතර එය පූර්ව වර්ෂයේ රැස්කරන ලද රු.75,703,249 සාපේක්ෂව සියයට 43 ක හෙවත් රු.32,301,553 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

(ඇ) හිඟ බදු ආදායම්

(i) 2022 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු ආදායමෙන් රු. 23,230,293,071 ක් හෙවත් සියයට 38 ක් නියෝජනය කරනු ලබන්නේ ආනයන හිඟ බදු වේ. ඉන් රු. 22,714,244,813 ක් 2019 වර්ෂයට ද පෙර සිට පැවත එන හිඟ ආදායම් ය.

(ii) 2022 දෙසැම්බර් 31 දිනට සමස්ත හිඟ බදු ආදායමෙන් රු. 16,076,072,367 ක් හෙවත් සියයට 26 ක් නියෝජනය කරනු ලබන්නේ විශේෂ වෙළඳ භාන්ඩ බදු වලිනි. ඉන් රු. 16,064,240,567 ක් 2019 වර්ෂය හා ඊට පෙර වර්ෂවල සිට පැවත එන හිඟහිටි ආදායම් වන අතර සමාලෝචිත වර්ෂය අවසානය වනතෙක් එම ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2022 දෙසැම්බර් 31 දිනට සමස්ත හිඟ බදු ආදායමෙන් රු. 10,476,732,912 ක් එනම් සියයට 17 ක් වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු වූ අතර ඉන් ද රු.10,247,074,664 ක් එනම් සියයට 98 ක් 2019 වර්ෂය හා ඊට පෙර වර්ෂවල සිට පැවත එන හිඟ ආදායම් ය. වර්ෂය තුළ අයකරගත් හිඟ ආදායම රු.10,480,209 ක් වූ අතර එම ප්‍රමාණය වරාය හා ගුවන්තොටුපල සංවර්ධන හිඟ බදු ආදායමෙන් සියයට 17 ක් විය.

(iv) 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ බදු ආදායමෙන් රු. 6,137,991,353 ක් හෙවත් සියයට 10 ක් නිරූපණය කරන්නේ ආනයන සෙස් බදු මුදලින් වන අතර එයින් රු.6,135,212,781 ක් 2019 වර්ෂය දක්වා පැවති හිඟ ආදායම් වූ අතර සමාලෝචිත වර්ෂය තුල දී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු. 61,254,145,583 ක් වූ සමස්ථ හිඟ බදු ආදායමෙන් සමාලෝචිත වර්ෂය තුල රු. 5,767,519,628 ක් අය කරගෙන තිබුණු අතර එම ප්‍රමාණය සමස්ථ හිඟ බදු ආදායමෙන් සියයට 09 ක් වැනි අවම මට්ටමක පැවතුණි.

(vi) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පවතින රු. 61,254,145,583 ක් වූ සමස්ථ හිඟ බදු ආදායමෙන් රු.39,063,403,231 ක් එනම් සියයට 63 ක් මුදල් අමාත්‍යාංශයෙන් අය විය යුතු හිඟ ආදායම් වටිනාකමක් ඇතුලත් විය.

2.2 වියදම් කළමනාකරණය

2.2.1 පුනරාවර්ථන වියදම්

(අ) මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු

සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයන් 08 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට 20 ක සිට සියයට 136 ක් වූ පරාසයක විචලතාවයන් විය. ඒ අනුව මූලික ඇස්තමේන්තු සකස් කිරීමේ දී පසුගිය වර්ෂයන් හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය.

(ආ) ප්‍රතිපාදන ඉතිරිවීම

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වියදම් සම්බන්ධයෙන් වැය විෂයයන් 21 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 6 සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් නිරීක්ෂණය විය.

(ඇ) ඉතිරි වීම් සඳහා තිබුණු හේතු ප්‍රමාණවත් නොවීම

ඉතිරිවීම් සිදුවීමට සෘජුව බලපෑ හේතුව මු.රෙ. 66/69 මාරු කිරීම් වුවද, ACA – 2 (II) ආකෘතියේ වැය විෂයයන් 09කට අදාලව වෙනත් හේතූන් දක්වා තිබුණි.

(ඈ) වියදමේ විචලතාවයන්

වැය විෂයයන් 13ක් සඳහා 2021 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම වැඩි වී තිබුණු අතර ඒ අනුව වියදම් සීමා කිරීමක් සිදු වී නොතිබුණි.

2.2.2 මූලධන වියදම්

(අ) මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලධන වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන මු.රෙ. 66/69 වීරමොං ක්‍රියාපටිපාටිය මඟින් වෙනස් කර තිබුණු අතර, ඒ හේතුවෙන් එම වැය විෂයයන් දෙකෙහි මූලික ඇස්තමේන්තු හා සංශෝධිත ඇස්තමේන්තු අතර සියයට 25 ක් හා සියයට 42 ක බැගින් විචලතාවයක් විය. ඒ අනුව මූලික ඇස්තමේන්තු සකස් කිරීමේ දී අවශ්‍යතා පිළිබඳ සමාලෝචනයක් සිදුකර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ඉතිරි වීම් සඳහා තිබුණු හේතු ප්‍රමාණවත් නොවීම**

2102 වැය විෂයය සඳහා ඉතිරිවීම් සිදුවීමට සෘජුව බලපෑ හේතුව මු.රෙ. 66/69 මාරු කිරීම් වුවද, ACA – 2 (II) ආකෘතියේ ඒ සඳහා වෙනත් හේතූන් දක්වා තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) **ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළැඹීම**

2022 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුව විසින් 247-1-1-1403 වැය විෂයයට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු. 6,288,052 ක් වූ බැරකම්වලට එළැඹ තිබුණි.

(ආ) **අනිකුත් බැඳීම් හා බැරකම්**

ලංකා විදුලිබල මණ්ඩලයට අදාලව රු.9,673,881 ක වගකීමක් වුවද එය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැඳීම් හා බැරකම් ලේඛනය තුළ දක්වා නොතිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල හෝ බැරකම් ලේඛනයේ ඇතුළත් නොවූ නමුත් වැය විෂයයන් 12කට අදාළව ගෙවූ 2023 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසයන්හි මුළු බැරකම් එකතු වටිනාකම රු. 22,399,020 ක් විය.

(ඈ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් ලෙස දක්වා තිබූ රු.82,902,394ක ශේෂයන් 2022 වර්ෂය තුළ නිරවුල් කළ ආකාරය ලේඛනවලින් තහවුරු කර ගැනීමට නොහැකි විය.

2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු අතර එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ)	1968 අංක 17 දරන රේගු ආඥා පනත	
(i)	153 (2) (ආ) වගන්තිය	ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද,1988 ජනවාරි 28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වසරේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 23 ක් තුළ ත්‍යාග අරමුදල් ලෙස නිලධාරීන් සඳහා රු.20,870,564,416 ක්ද, ඔත්තුකරුවන් සඳහා රු.3,143,829,243 ක් ද බෙදා හැර තිබුණි.
(ii)	84 (අ) (3) වගන්තිය	බන්දිත ගුදම් (Manufacture in Bond – MIB) පහසුකම ලබාගත් යම්කිසි කර්මාන්තයකට අදාලව භාණ්ඩ දේශීය වෙළඳපොලට නිකුත් කිරීමේ දී ආනයන සේ සලකා තීරු බදු ගණන් බැලිය යුතු වුව ද, එවැනි සමාගම් 02 ක් අංක 1448/1 හා 2006 ජුනි 05 දිනැති කර්මාන්ත විෂයභාර අමාත්‍යවයා විසින් නිකුත් කරන ලද "දේශීයව සියයට 30 ට නොඅඩු අගයක් සහිත උපාංග යොදා ගනිමින් එකලස් කරන වාහන සඳහා ලබා දෙන සියයට 70 ක බදු සහනය" ලබා ගනිමින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු. 7,191,949,084 ක නිෂ්පාදන බදු ගෙවීම් පැහැර හැර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

(i) XIV පරිච්ඡේදයේ 2.2 උප වගන්තිය

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් රාජකාරී අවශ්‍යතා සඳහා රේගු පරිශ්‍රයෙන් බැහැරව යාමට අදාළව වියදම් ඉල්ලුම් කිරීමේදී ගමන ආරම්භ වන ස්ථානය හඳුනාගැනීමට අවශ්‍ය ස්ථීර ලිපිනය, රාජකාරී ලිපිනය හා තාවකාලික ලිපිනය ආදී තොරතුරු වවුවර්පත්වල ඇතුළත් කර නොතිබුණ ද. ඒ පිළිබඳ පරීක්ෂාවකින් තොරව ගමන් වියදම් ගෙවීම් සිදුකර තිබුණි. ජනවාරි සිට මාර්තු දක්වා වූ වවුවර් පරීක්ෂාවේදී එපරදි අනාවරණය වූ අවස්ථා 33ක් වූ අතර, ගෙවූ වටිනාකම රු598,023 ක් විය.

(ii) XIV පරිච්ඡේදයේ 4.1 හා 4.4 උප වගන්ති

2022 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා සිදුකළ වවුවර් පරීක්ෂාවේදී යොමුගත වගන්තියට පටහැනිව ගමනේ දුර සැතපුම් හතකට වැඩි යන්න හෝ ගත වූ කාලය පිළිබඳව සැලකිල්ලක් නොදක්වා අවස්ථා 207 කදී රු.5,378,494 ක මුදලක් සැතපුම් කුලී හා ගමන් වියදම් සඳහා ගෙවීම් සිදුකර තිබුණි.

(iii) XXIV පරිච්ඡේදයේ 4 වන උප වගන්තිය

- සමාලෝචිත වර්ෂය අවසාන දිනට මිය ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂය රු.59,426 ක් ද, වර්ෂ 01 සිට 02 දක්වා පැරණි අයකර නොගත් ණය ශේෂය රු.428,842 ක් ද, වසරකට වඩා අඩු ණය ශේෂය රු. 816,906 ක් ද විය.
- සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂය රු.513,577 ක් ද, වර්ෂ 03 සිට 04 දක්වා ණය ශේෂය රු.211,273 ක් ද, වර්ෂ 01 සිට 02 දක්වා ණය ශේෂය රු.444,399 ක් ද, වසරකට වඩා අඩු ණය ශේෂය රු. 3,386,791 ක් ද විය.

- ස්ථානමාරුවී ගිය නිලධාරීන්ගෙන් වර්ෂ 05 ක් ඉක්මවූ රු.394,007 ක ණය ශේෂය පියවීමට පියවර ගෙන නොතිබුණි.
- වැඩ තහනම්කර ඇති නිලධාරීන්ගෙන් වසරකට වඩා අඩු ණය ශේෂය රු. 591,959 ක් ද, වර්ෂ 01 සිට 02 දක්වා පැරණි ණය ශේෂය රු.321,884 ක් ද, වර්ෂ 04 සිට 05 දක්වා පැරණි ණය ශේෂය රු.68,800 ක් ද, වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂය රු.1,370,235 ක් ද වූ අතර, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් වර්ෂ 01 සිට 02 දක්වා පැරණි ණය ශේෂය රු.309,534 ක් ද, වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂය රු.473,073 ක් ද විය. අදාල නිලධාරීන්ගෙන් මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මු.රෙ. 102 සිට 110

විදේශීය පුද්ගලික ආයතනයක් විසින් නැවකින් නැවකට භාණ්ඩ මාරු කිරීමේ ක්‍රමය යටතේ (Transshipment) සිංගප්පුරුවෙන් නැව්ගත කරනු ලැබූ දුම්වැටි තොගයක් ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගෙන විමර්ශනයක් සිදු කර තිබුණු අතර එහි තීන්දුව අනුව අදාල සිගරට් තොගය ප්‍රතිනැව්ගත කිරීමට අවසර ලබා දී තිබුණි. එසේ තිබියදී රේගුව විසින් මතබේදාත්මක ලෙස එම දුම්වැටි තොගය වෙන්දේසිකර විකුණා රු. 5,901,750 ක මුදලක් උපයාගෙන තිබුණි. කෙසේවුවද, එම විකිණීමට එරෙහිව අදාල විදේශ ආයතනය නඩු පවරා තිබුණු අතර දිසා අධිකරණයෙන් රේගුව වැරදිකරු වී තිබුණි. එකී තීන්දුවට එරෙහිව රේගුව සිවිල් අභියාචනාධිකරණයේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු

		පවරා තිබුණු නමුත් ඉන් ආනයනකරුට සිදුවූ අලාභය වෙනුවෙන් රු.37,529,749 ක්ද, නෛතික පොළිය ලෙස රු.63,464,121 ක්ද, නඩු ගාස්තුව ලෙස රු.190,000 ක්ද ගෙවීමට නියමව තිබුණි. නෛතික ගාස්තු රු.31,732,060 ක් දක්වා අඩු කිරීමට ආනයනකරු හෙවත් පැමිණිලිකාර පාර්ශවය එකගව තිබූ අතර ඒ අනුව රේගුවට මෙම වැරදි තීරණය මත ගෙවීමට සිදුවූ මුලු අලාභය රු.69,451,809ක් විය. මෙම විමර්ශනයට අදාළ ගොනුව අස්ථානගත වී ඇති බව විගණනයට 2022 සැප්තැම්බර් 22 දින රේගුව විසින් වාර්තා කර තිබුණු අතර එයට වගකිවයුතු නිලධාරීන්ට සහ ඉහත වැරදි තීරණයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.
(ii)	මු.රෙ. 104 (3) හා මු.රෙ. 104 (4)	අනතුරක් සිදුවූ දින සිට දින 07 ක් ඇතුළත ප්‍රාරම්භක වාර්තාවක් හා අවසන් වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද වාහන 07ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.
(iii)	මු.රෙ. 133 (i)	දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳ පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගි වී එම කටයුතු වල වැරදි හා වංචා වැලැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් සිදුකරනු ලබන බවට ගමන් වියදම් ගෙවීම් සම්බන්ධව පරීක්ෂාවට අනුව තහවුරු නොවුණි.
(iv)	මු.රෙ. 756	ආයතනය විසින් 2021 දෙසැම්බර් 31 දිනට වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2023 මැයි 04 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ

(i) 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ ඇමුණුම VI

ඉඩම් සම්බන්ධ විස්තර කොමිට්‍රෝල් ජනරාල් කාර්යාලයට වාර්තා කල යුතු වුවත් සමාලෝචිත වසර අවසානය තෙක් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ii) 2022 අප්‍රේල් 04 දිනැති අංක 05/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය

රජයේ දේපල අස්ථානගත වීම සහ අවභාවිතා වීම වැළැක්වීමට සහ රජයේ දේපල උපරිම ඵලදායිතාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කිරීම සඳහා සියලුම වත්කම් ලේඛනගත කල යුතු වුවද, ගිණුම් අංශයේ පවත්වාගෙන යනු ලබන සිගෑස් වැඩසටහනට අදාල වත්කම් ලේඛනය අනුව වාහන 102 ක් පැවති අතර, සැපයුම් හා සේවා අංශය විසින් නඩත්තු කරන ලද වාහන වියදම් වාර්තාව අනුව වාහන 109 ක් විය. කෙසේවුවද, එම අංශය විසින්ම වාහන වලට අදාලව නඩත්තු කරන ලද ස්ථාවර වත්කම් ලේඛන 03ට අනුව ආයතනය සතු වාහන 165 ක් විය.

(ඉ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ

(i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය

රාජ්‍ය ආයතනවල සියලුම නිලධාරීන් ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර පැමිණීම සහ පිටවීම සටහන් කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුව ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. දෙපාර්තමේන්තුව තුළ ඇඟිලි සළකුණු යන්ත්‍ර සටහන් කිරීමට ඇති අපහසුතාවය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විමසා ඉන් අනුමැතිය ලබා ගන්නා ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාවෙන් කරන ලද නිර්දේශය ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂක විසින් සත්‍ය වශයෙන්ම ඇඟිලි සළකුණු යන්ත්‍ර

සටහන් කිරීමේ දී ඇතිවන ගැටලු ඉදිරිපත් කරන ලෙස අංක EST-6/07/OFT/4021 සහ 2022 අප්‍රේල් 08 දිනැති ලිපියෙන් කරන ලද දැනුම්දීමට 2023 මාර්තු 28 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

(ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන චක්‍රලේඛය. — සමාලෝචිත වර්ෂය තුල දී දෙපාර්තමේන්තුව සතු වූ සියළුම වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

2.6 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මූදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු.රෙ.371 (2) ආ ප්‍රකාරව අත්තිකාරම් එම කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවද, අවස්ථා 20 කදී රු.17,400 සිට රු.1,100,000 ක අත්තිකාරම් දින 14 ක සිට දින 120 දක්වා ප්‍රමාද වී තිබුණි.

2.7 අධිභාර

රේගු දෙපාර්තමේන්තුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්ගතව ඔරුගොඩවත්ත අංක 12 ගබඩාව පිහිටි ස්ථානය කුලී පදනම් මත ලබාගෙන තිබුණු අතර එහි මාසික ගෙවීම් ප්‍රමාදවීම මත පැනවූ අධිභාරය රු. 3,655,985 ක් විය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මූදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023 පෙබරවාරි 28 දිනට ඉදිරිපත් නොකළ බැවින් එකී වාර්තාවේ සඳහන් මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යා හා අනෙකුත් තොරතුරුවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) රේගු ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාලවලට 2022 වර්ෂය වෙනුවෙන් ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සුදුසු ආයතන වලින් ලංසු

කැඳවීමකින් තොරව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PFD/RED/01/05/2015/3 සහ 2015 මැයි 22 දිනැති ලිපිය ප්‍රකාරව වසර 05 ට වැඩි කාලයක සිට පෙර වර්ෂයන්හි ආරක්ෂක සේවාව සැපයූ ආයතනයෙන්ම සමාලෝචිත වර්ෂයේද සේවය ලබා ගැනීමට එකඟවී තිබුණි. ඒ අනුව එම ආරක්ෂක සමාගමට සමාලෝචිත වර්ෂයේදී ද රු.27,821,760 ක මුදලක් ආරක්ෂක සේවා සැපයීම සඳහා ගෙවා තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව නව සැපයුම්කරුවන් තෝරා නොගෙන 2015 සිට ගොඩනැගිලි කුලියට සැපයූ පාර්ශවයන්ගෙන්ම ගිවිසුම් අලුත් කරමින් මීගමුව, ඔරුගොඩවත්ත, මට්ටක්කුලිය, යාපනය සහ මත්තල යන ප්‍රදේශවලින් නිලධාරීන් සඳහා ගොඩනැගිලි කුලියට ගෙන සමාලෝචිත වර්ෂ සඳහා ද එකතුව රු.15,206,322 ක් ගෙවා තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

(අ) WP KD – 3399, 62 – 0772, NA – 6906 හා 64 – 5948 දරන වාහන 04 සම්බන්ධයෙන් අලුත්වැඩියාකර භාවිතා කිරීම හෝ අපහරණය කිරීම අතුරින් වඩාත් ඵලදායී තත්ත්වය පිළිබඳ තීරණයක් නොගෙන 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ධාවනයෙන් තොරව ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) රේගු මූලස්ථානය පිහිටි අංක 352/2005 දරන පිඹුරු පතේ වූ අක්කර 02 පර්චස් 31 ක ඉඩම, නො.40 මෝගන් පාර, කොම්පඤ්ඤවීදිය, කොළඹ 02 පිහිටි අංක කො. 8111 දරන පිඹුරු පතේ වූ හෙක්ටයාර 0.2746 ක ඉඩම සහ වරාය අධිකාරියේ ගේට්ටු අංක 01 අසල පිහිටි පර්චස් 94ක ඉඩම විගණන දිනය වූ 2023 අප්‍රේල් 30 දින වන විටත් විධිමත්ව රේගුව වෙත පවරාගෙන නොතිබුණි.

3.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

නැගෙනහිර පළාත් ජල සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ජපන් රජය විසින් ලබාදී ඇති ආධාරයක් මත ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරය විසින් එම ව්‍යාපෘතියට අවශ්‍ය DI පයිප්ප හා උපාංග ගෙන්වීමේ කාර්යය සඳහා ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයට පවරා තිබුණු අතර ඒ සඳහා මණ්ඩලය පෞද්ගලික ආයතනයකට කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. රේගු ආඥා පනතේ 72 වන වගන්තිය ප්‍රකාරව පළමු අවස්ථාවේදී බදු නොගෙවා භාණ්ඩ ගුදම් ගත කිරීම සඳහා රේගුව විසින් එම පෞද්ගලික ආයතනයට අවස්ථාව ලබාදී තිබූ අතර ඒ සඳහා රේගු සටහන්කර (Cusdec) 08 ක් නිකුත් කර ඇ.ඩො. 5,139,621 ක භාණ්ඩ ගුදම් කර (To Bond) තිබුණි. රේගු ආඥා පනතේ 86 වන වගන්තිය අනුව භාණ්ඩ ගුදමෙන් නිදහස් කර ගැනීමේදී කලින් ප්‍රකාශ කරන ලද භාණ්ඩ තොගයේ ඉන්වොයිස් අගයම ප්‍රකාශ විය යුතු වුවද,

දේශීයව සැකසූ ඉන්ධොයිස් භාවිතා කර අදාල වටිනාකම මගින් ඇ.ඩො. 6,350,364 ක් ලෙස ව්‍යාජ තොරතුරු සහිත ආනයන සටහන්කර ඉදිරිපත් කර එමඟින් ඇ.ඩො. 1,210,743 ක වටිනාකමක් අදාල ආයතනයට වැඩිපුර ලබා ගැනීමට අවස්ථාව සලසා තිබුණි. ව්‍යාජ ඉන්ධොයිස් සැකසීම හා ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම ආදී වශයෙන් අදාල ආයතනය සිදු කරන ලද වැරදි සම්බන්ධව වැඩිපුර වැය වී ඇති මුදල නැවත අයකර ගැනීමේ හැකියාවන් පිළිබඳ අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස 2021 අප්‍රේල් 06 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී නියෝග කර තිබුණ ද, විගණන දිනය වූ 2023 අප්‍රේල් 30 දින වන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි.

3.5 පාඩු හා හානි

නො.40 මෝගන් පාර, කොම්පඤ්ඤවීදිය, කොළඹ 02 යන ස්ථානයේ රේගු නිලධාරීන් සඳහා නිල නිවාස 16ක් ඉදිකර තිබුණු අතර ඉන් නිල නිවාස 08ක් 2023 අප්‍රේල් 30 දින වන විට අබලන්ව පදිංචියට නුසුදුසු තත්ත්වයේ පැවති අතර, නිවාස 02ක් උපයෝජනය කර නොතිබුණි. එකී පරිශ්‍රයේ අනවසරයෙන් නිවාස 15 ක් ඉදිකර තිබුණ ද අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීතිමය කටයුතු කර නොතිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

(අ) 2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දි න දක්වා දෙපාර්තමේන්තුවේ අංශ (Directorate) 40 ට අදාලව රේගු විමර්ශන 9754 ක් පැවතුණු අතර, ඉන් ආදායම් අධීක්ෂණ ඒකකයට (RTF) අදාළව විමර්ශන 3199 ක් ද, නිවාරණ අංශයට (Preventive) අදාළව විමර්ශන 1593 ක් ද, මධ්‍යම විමර්ශන අංශයට අදාළව විමර්ශන 738 ක් ද, අනෙකුත් අංශ 37ට අදාලව විමර්ශන 4224ක් ද විය. සමාලෝචිත වර්ෂය අවසාන දිනට සමස්ත විමර්ශන සංඛ්‍යාවෙන් වසර 07 ට වඩා පැරණි 1518 ක් ද, වසර 06 ට වඩා පැරණි 1026 ක් ද, වසර 05 ට වඩා පැරණි 1038 ක් ද, වසර 04 ට වඩා පැරණි 852 ක් ද, වසර 03 ට වඩා පැරණි 1009 ක් ද, වසර 02 ට වඩා පැරණි 1442 ක් ද, වසරකට වඩා පැරණි 1417 ක් ද සහ වසරක් ඇතුළත වූ විමර්ශන 1452 ක් ද විය.

(ආ) ටැන්සැනියාවේ Zanzibar වරායේ සිට ශ්‍රී ලංකා වරාය හරහා Hong Kong වෙත ප්‍රති අපනයනය කිරීම සඳහා අප්‍රිකානු සණ්ඩු දැව (African Hard Wood) ලෙස සඳහන් කරමින් වඳවීමට ලක්ව ඇති හා ජාත්‍යන්තර වෙළඳාම සීමා කර ඇති මැලගසි රෝස (Rose Wood) මෙට්‍රික් ටොන් 420ක් බර දැව කඳන් 3669ක තොගයක් රේගුව විසින් රාජසන්තක කර විකිණීමට කිහිප අවස්ථාවකදී සැලසුම්කර තිබුණු නමුත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කල යුතු CITES බලපත්‍රය ලබා ගැනීමට නොහැකි වීම මත 2014 සිට 2023 අප්‍රේල් 30 දින වන විටත් ඉවත් නොකර රේගු අංගනයක ගබඩා කර තිබුණි.

පදම් නොකළ කඳන් වීම මත මෙම දැව තොගයට මේ වන විටත් කෘමීන්ගෙන් හානි සිදු වී තිබුණු අතර 2014 සිට 2022 ජනවාරි දක්වා දැව තොගය ගබඩාකර තබා ගැනීම වෙනුවෙන් ග්‍රේ ලයින් කන්ටේනර් අංගනය මඟින් රේගුව වෙත රු.81,621,820 ක ඇස්තමේන්තු වියදමක් පිළිබඳව දැනුම්දී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් 2021 අප්‍රේල් 23 දින ආනයනය කරන ලද අධි බලැති විකිරණශීලී මූල ද්‍රව්‍යයක් සඳහා වරාය සංවර්ධන බදු සහ එකතු කළ අගය මත බදු වශයෙන් රේගුවට ගෙවිය යුතු එකතුව රු. 30,285,861 ක් වෙනුවෙන් සූර්ය බල සුළං හා ජල විදුලි ජනක ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද වලංගු කාලය සඳහන් නොකරන ලද සමාගම් ඇපකරයක් මත මුලද්‍රව්‍යන් නිදහස් කර තිබුණි. කෙසේවුවද, 2023 ජනවාරි 01 දින වන විටත් දින 600 කට අධික කාලයක් ගතවී තිබුණ ද එම බදු මුදල් මණ්ඩලය විසින් ගෙවා නොතිබුණි.

(ඈ) බ්‍රසීලයේ සිට ආනයනය කරන ලද සීනි බහාලුම් තුළ කෝකේන් මත් ද්‍රව්‍ය ඇති බවට ආනයනකරුගේම දැනුම් දීම මත රඳවා පරීක්ෂා කර පසුව මත් ද්‍රව්‍ය අඩංගු නොවන බවට තහවුරු කරගැනීමෙන් පසු ආනයනකරුට ආදාල සීනි බහාළුම් වලින් 04ක් නියමිත දිනට පෙර මුදා ගැනීමට අපොහොසත් වීම නිසා එම බහාලුම් සම්බන්ධයෙන් 2017 පෙබරවාරි මස විමර්ශණයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව රේගු ආඥා පනතේ 109 වගන්තිය යටතේ අදාල සීනි තොගය රාජසන්තක කර 2022 අප්‍රේල් මාසයේදී සත්ත්ව ආහාර ලෙස නැවත විකුණා තිබුණු අතර ඒ සඳහා වසර 05ක් ගතවී තිබුණි. තවද, සීනි තොගය සත්ත්ව ආහාර ලෙස විකිණීමට තෝරාගත් ටෙන්ඩර්කරු විසින් 2022 මැයි 28 දින රු. 10,536,303 ක මුදල් ගෙවා තිබුණු නමුත් එසේ මුදල් ගෙවීමට පෙර 2022 මැයි 25 දින එක් සීනි තොගයක්ද මුදල් ගෙවීමෙන් දින 24කට පසු හෙවත් 2022 ජුනි 22 දින අනෙක් තොගයද නිදහස් කර ගෙන තිබුණි. ඒ අනුව මුදල් ගෙවීමට පෙර සීනි තොගයක් නිදහස් කිරීම මෙන්ම මුදල් ගෙවීමෙන් පසු තොගය ඉවත් කර ගැනීමට දින 24 ක කාලයක් රේගුව විසින් ලබා දීමද ප්‍රශ්නකාරී විය.

(ඉ) විවිධ අංශ විසින් සිදුකරන රේගු විමර්ශන වලදී රේගු භාරයට ගන්නා ලද, වෙනත් නියාමන ආයතන විසින් රේගුවට බාර දෙන ලද සහ රාජසන්තක කරන ලද වාහන සහ බහාලුම් වෙන්දේසි හෝ අපහරණය කරන තෙක් රේගු අධීක්ෂණයේ රඳවා ගැනීම සඳහා වර්ග අඩි 18,000 ක භූමි භාගයක් පෞද්ගලික ආයතනයකින් කුලියට ගැනීම සඳහා 2015 වර්ෂයේදී රේගුව ගිවිසුම්ගතව තිබුණු අතර එකී අංගනයේ 2023 ජනවාරි 31 දිනට රථවාහන 435ක් ද, බහාලුම් 91ක් ද ගාල්කර තිබුණි. ඉන් වාහන 261ක් සහ බහාලුම් 86ක් වසර 05කට වඩා අධික කාලයක සිට එම භූමියේ රඳවා තිබුණු අතර, වාහන 133 ට අදාල විමර්ශන ගොනු අස්ථානගතව තිබුණි. 2015 වර්ෂයේ සිට 2020 කාලපරිච්ඡේදය දක්වා පමණක් රේගුව අදාල පෞද්ගලික සමාගම සමඟ විධිමත් ගිවිසුමකට එළඹ තිබුණු අතර ඉන්පසුව 2023 ජනවාරි දක්වා අවස්ථා 05ක දී කාලය දීර්ඝ කරමින් භූමිය ප්‍රයෝජනයට ගෙන තිබුණි. 2015 වර්ෂයේ

සිට 2023 ජනවාරි දක්වා අදාළ පෞද්ගලික ආයතනයට ගෙවූ සහ ගෙවිය යුතු මුලු කුලී මුදල් එකතුව රු. 77,485,548 ක් විය. වසර 05කට වඩා අධික කාලයක සිට ගාල්කර තිබුණු මෙම වත්කම් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග නොපමාව ගතයුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) **මිනිස් පරිභෝජනයට නුසුදුසු මාළු කන්ටේනර් 102 ක් රේගුවෙන් නිදහස් කිරීම**

සී ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ටුනා මත්ස්‍යයින් ගබඩා කළ බහාළුම් රැගත් CMA CGM Kailas නැමති නෞකාව කොළඹ වරායට ආසන්න මුහුදු ප්‍රදේශයේදී කාර්මික දෝෂයකට ලක්වීම හේතුවෙන් දින 20 ක් තිස්සේ විදුලි සැපයුම නතර වී ඇති බව සඳහන් කර ආසන්නම වරාය වූ ශ්‍රී ලංකාවේ වරාය අධිකාරිය වෙත දැනුම්දී තිබුණි. ඒ අනුව කඩිනම් පියවරක් ලෙස විදුලි ජනන යන්ත්‍ර භාවිතා කර විදුලිය ලබා දී ලංකාවේ තග් යාත්‍රා උපයෝගී කරගෙන 2022 ජනවාරි 13 දින අදාළ නැව මෙරට තුළම නවතා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර තිබුණි. අදාල නැවෙහි තිබූ මාළු බහාළුම් 102 ක් මේ අවස්ථාව වන විට නරක් වී ඇති බවත් එම තොග නැවත අපනයනකරු භාර නොගන්නා බවත් පවසා නැව් නියෝජිත ආයතනය විසින් මාළු තොගය පිටස්තර පාර්ශවයකට සත්ව ආහාර හා කාබනික පොහොර සැකසීමට රේගුව මඟින් නිදහස් කිරීම සම්බන්ධයෙන් විගණනයේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම මාළු තොගය අඩංගු නෞකාවෙහි ස්වභාවය Transshipment Status වුවද Import cargo status ලෙස වෙනස් කිරීමට ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂවරයා පත් කරන ලද කමිටුව විසින් තීරණය කර තිබුණ ද ඒ සඳහා HS Code වර්ගීකරණ කමිටුවක විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණු අතර මෙම මාළු තොගය නරක් වූ ස්වභාවයක් ගෙන ඇති බව වාර්තා කළ ද, HS Code 511.91.10 යටතේ Whole Round Tuna In Bulk ලෙස රේගු සටහන්කරයේ ඇතුළත් කර ඒ අනුව රේගුව විසින් රු. 6,288,357 බදු අයකරගෙන තිබුණි.

(ii) ආනයන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ආනයන අපනයන පාලක ජනරාල්වරියගෙන් අයදුම් කළ යුත්තේ මෙම මාළු තොගය මිලට ගත් Echo N Rich සමාගම වුව ද, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ, මධ්‍යම අපහරණ අංශය(Central Disposal Directorate) විසින් 2022 මැයි 22 දින ආනයන පාලන බලපත්‍රයක් අවශ්‍ය බවට ආනයන හා අපනයන පාලකවරියට දැනුම් දී තිබුණි.

(iii) පොහොර නිෂ්පාදකයාගේ ධාරිතාවය පිළිබඳව නොසලකා හැර විශාල මාළු තොගයක් පොහොර නිපදවීමට ලබාදීමෙන් ප්‍රමාණවත් ධාරිතාවයෙන් යුතුව කටයුතු සිදු නොවීම (ප්‍රමාණවත් ශ්‍රමය හා උපකරණ නොමැති නිසා) හා ඇතැම් බහාළුම්වල ශීතකරණ සඳහා

විදුලිය සැපයීම ඇණ හිටීමෙන් එම මාළු ගබඩා ආශ්‍රිතව සෞඛ්‍යාට අහිතකර තත්ත්වයක් නිර්මාණය වී අධික දුගඳ හමන තත්ත්වයක් හා බහාලුම්වලින් ගලන අපවිත්‍ර ද්‍රාවණයන් හේතුවෙන් අවට පරිසරය අපවිත්‍ර වීමේ තත්ත්වයක් උද්ගත වී ඇති බවත් එම ගබඩා පරිශ්‍රයන්ට අදාළව 2022 අගෝස්තු 16 දින සිදු කළ ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් ප්‍රදේශවාසීන්ගෙන් චෝදනා එල්ල වී තිබුණු අතර, 2022 ජූලි 07 දින මහබාගේ පොලිස් ස්ථානාධිපතිවරයා විසින් සී කන්ටේනර් සර්විස් සමාගම යටතේ ගබඩා කර ඇති බහාළුම් 60 ක් ඉවත් කර ගන්නා ලෙස ද දැනුම් දී තිබුණු බව ද නිරීක්ෂණය විය.

(iv) හදිසි අවස්ථාවක දී නෞකාවට සිදුවන දෝෂයන්ට ආසන්නතම වරායේ යම් පහසුකම් සැපයීමක් ලබා දීම සිදු කළ ද, රේගු ආඥා පනතේ (අ) උපලේඛනයට අනුව රට තුළට ගෙන්වීම තහනම් සහ සීමා කරන ලද භාණ්ඩ අතරට එම උපලේඛනයේ (12) වගන්තිය අනුව පළුදු වූ දුගඳ හමන හෝ අප්‍රිය තත්වයේ හෝ ආහාරයට නුසුදුසු සහ නීත්‍යානුකූල පාවිච්චියට නුසුදුසු හෝ ස්පර්ශයට නුසුදුසු හෝ ලෙඩ රෝග සෑදෙන සුළු මාළු වර්ග, ධාන්‍ය වර්ග හා වෙනත් දේ ආනයනය තහනම් කර තිබිය දී සහ රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රතිඅපනයනය කිරීමට මෙරට නැව් නියෝජිත ආයතනයට දැනුම් නොදී ඊට පටහැනි ලෙස රේගුව විසින් මෙම නුසුදුසු මාළු තොගය ශ්‍රී ලංකාව තුළට නිදහස් කිරීමට තීරණය කර තිබුණි.

(v) මාළු තොග නිදහස් කිරීමේ දී රේගු සටහන්කර 17 ක් පිළිගෙන ඉහත සඳහන් ආයතනය වෙත නිදහස් කිරීමට පියවර ගෙන තිබුණු අතර මෙම රේගු සටහන්කර සැකසීමට දේශීයව සැකසූ Way Bill, Invoice, Packing List උපයෝගී කර ගැනීම විගණනයේ දී ප්‍රශ්නගත විය.

(vi) කාර්මික දෝෂයකට ලක් වූ බව පවසන CMA CGM KAILAS නෞකාව ලංකා වරායට ලඟා වූ දිනය 2022 ජනවාරි 13 ලෙස නැව් නියෝජිත ආයතනයේ ලිපිවල සඳහන්ව තිබිය දී රේගු සටහන්කරවල නැව වරායට ලඟා වූ දිනය 2022 පෙබරවාරි 08 ලෙස සටහන් කර තිබුණි.

(vii) රේගු ආඥා පනතේ 162 වගන්තිය ප්‍රකාරව මාළු තොගය නීතිවිරෝධී බව ප්‍රකාශකිරීමක් සිදු නොකර රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට රේගු ආඥා පනතේ 12 සහ 43 වගන්ති ප්‍රකාරව අපහරණය කළ නොහැකි වුව ද එවැනි ප්‍රකාශ කිරීමකින් තොරව අපහරණය සිදු වී තිබුණි.

(viii) රේගු ආඥා පනතේ 34(1) වගන්තිය අනුව ශ්‍රී ලංකා වරායට බඩු බෑම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවසරපත්‍රයක් දෙනු ලැබී නම් මිස යම් නැවකින් කිසිම

භාණ්ඩයක් ගොඩ නොබෑ යුතු අතර ගොඩබානු ලබන සියළුම බහාළුම් සඳහා ශ්‍රී ලංකා රේගුවේ අවසරය හා අනුමැතිය අවශ්‍ය වුව ද අදාළ ගොනු පරීක්ෂා කිරීමේ දී එවැනි අවධානයක් රේගුව යොමු කළ බවට සාක්ෂි නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රේගුව විසින් බහාළුම් අංගනවල රඳවාගෙන ඇති අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාව**

රේගුව විසින් රඳවාගෙන ඇති අත්‍යවශ්‍ය භාණ්ඩ පිළිබඳව සිදුකළ විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2021 වර්ෂයේ ජනවාරි මාසයේ සිට 2022 අගෝස්තු 01 දින වන විට රේගු පරීක්ෂණ සිදු කරමින් පැවතුණු ආහාර ද්‍රව්‍ය ඇතුළත් බහාළුම් 27 ක් සම්බන්ධයෙන් ආනයනකරුවන් විසින් අදාල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා එම බහාළුම් ඔවුන් වෙත නිදහස් කිරීම දින 95 සිට දින 563 ක් දක්වා ප්‍රමාද වූ අවස්ථා විය. ආනයනික ද්‍රව්‍ය සඳහා අනුමැතීන් (නිර්දේශ) ලබා දිය යුතු ආයතන වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ආදියෙන් එකී සහතික ලැබීමේ ප්‍රමාදය මෙයට බලපා තිබුණි.

(ii) රේගු විමර්ශන කටයුතු හේතුවෙන් ඒ යටතේ පවතින රෑන්කින් කන්ටේනර් ටර්මිනල් (RCT)අංගනයේ 2022 අගෝස්තු 01 දිනට ආහාර ද්‍රව්‍ය ඇතුලත් බහාළුම් 88 ක් දින 60 සිට දින 778 දක්වා කාලයක් රඳවා තිබුණි. ඒවායේ වටිනාකම රු. 745,383,250 ක් විය.

(iii) ශ්‍රී ලංකාවට කහ ආනයනය කිරීමේ දී සංයෝජිත වර්ගීකරණ සංකේත 0910.30.10 ට අදාල කුඩු නොකළ හා නොඇඹරූ කහ සඳහා බලපත්‍රයක් ලබාගත යුතු බව 2019 දෙසැම්බර් 06 දින අංක 2152/63 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර තිබුණි. ඒ සමඟම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් "විරෝධතා නොමැත"(No objection letters) යනුවෙන් ලිපියක් ද ලබාගත යුතු විය. කෙසේවුවද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආනයන අපනයන පාලක ජනරාල්වරයා ඇමතූ අංක DGO/04/01 දරන 2020 අප්‍රේල් 30 දිනැති ලිපිය අනුව 2020 මැයි 10 දිනෙන් පසුව කහ තොග නිදහස් කර ගැනීම සඳහා අදාල වන ඉහත සඳහන් කළ "විරෝධතා නොමැත"(No objection) ලිපි නිකුත් නොකිරීමට තීරණය කළ බව දැනුම් දී තිබුණි. ඉහත තීරණය ගැනීමෙන් පසුව 2020 මැයි 10 දින රු.151,979,588 ක් වටිනා කහ කිලෝග්‍රෑම් 624,877 ක් ලංකාවට ආනයනය කර තිබූ අතර 2022 අගෝස්තු 01 දින වන විට ද රේගුව විසින් වසර 02 කට අධික කාලයක සිට අවශ්‍ය නීතිමය කටයුතු සිදු නොකර රඳවාගෙන තිබුණි.

(ඌ) Temporary Importation for Export Processing Scheme (TIEP) යෝජනා ක්‍රමය යටතේ පොල්තෙල් (Coconut oil) ආනයනය කර අගය එකතු කර ප්‍රතිඅපනයනය කිරීම සඳහා රේගුවේ ලියාපදිංචි වූ සමාගමක් විසින් එපරිදි පොල්තෙල් ප්‍රතිඅපනයනය නොකර වර්ෂ ගණනාවක සිට දේශීය වෙළඳපොලට අලෙවිකර රජයට බදු ආදායම් අහිමි කර තිබුණි. මේ සම්බන්ධයෙන් රේගුව සිදුකළ විමර්ශනයට අනුව 2014 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුළ දී ඉහත පෞද්ගලික සමාගම විසින් දේශීය සමාගමකට අලෙවි කළ පොල්තෙල් ප්‍රමාණය 463,065kg ක් වූ අතර රේගු විමර්ශණයෙන් නියම කළ අහිමිකිරීම් වටිනාකම රු. 477,377,802 ක් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) TIEP යෝජනා ක්‍රමය යටතේ පහසුකම් ලබන ආයතන පිළිබඳව රේගු නිලධාරීන් විසින් සෑම වර්ෂයකම විධිමත් අධීක්ෂණයක් සිදු කළ යුතු වුවද, එවැනි අධීක්ෂණයක් සිදු වී නොතිබීම නිසා මෙවැනි තවත් වංචා සමාගම් විසින් සිදුකළ හැකි බව විගණනයේදී බැහැර කළ නොහැකිය.

(ii) පෞද්ගලික සමාගමට පැනවූ රු.477,377,802 ක දණ්ඩන වටිනාකම අහිමි කිරීම රේගු ආඥා පනතේ 163 වගන්තිය ප්‍රකාරව රු. 90,000,000 ක් දක්වා ලිහිල් කිරීමට (Mitigate) රේගුව කටයුතු කර තිබුණු අතර එහිදී රේගු ආඥා පනතේ 166 (ආ) ප්‍රකාරව දණ්ඩනයට හෝ රාජ සන්තක කිරීමට මුල් වූ කඩකිරීමේ බරපතලකම, අහිමි වූ ආදායම් ප්‍රමාණය ආදී කරුණු නොසලකා හැර තිබුණි. කෙසේවුවද, TIEP යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වීම හේතුවෙන් රජයට මෙම සමාගම විසින් අහිමි කළ මුළු අලාභය රු.63,567,715 ක් වූ අතර අහිමි කිරීම් වටිනාකම රු. 90,000,000 ක් දක්වා අඩු කිරීම හේතුවෙන් මහා භාණ්ඩාගාරයට සත්‍ය වශයෙන්ම ලද ආදායම රු. 27,000,000 ක් (Rs. 90,000,000 × 30%) දක්වා අඩු වී තිබුණි.

4 මානව සම්පත් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	710	300	410
තෘතීයික මට්ටම	876	765	111
ද්විතික මට්ටම	1097	840	257
ප්‍රාථමික මට්ටම	392	372	20
	3075	**2277**	**798**

සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශ්‍රී ලංකා රේගුවේ අනුමත සේවක සංඛ්‍යාව 3075 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 2277 ක් වී තිබුණි. පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) ආයතනයේ ක්‍රියාකාරිත්වයට හා කාර්ය සාධනයට අවශ්‍යම වූ නීති නිලධාරියෙකු, තාක්ෂණික නිලධාරීන් 02 ක් හා සංඛ්‍යාන නිලධාරියෙකුගේ සේවය සමාලෝචිත වර්ෂය අවසාන දිනට ද පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 අනුව සෑම නිලධාරියෙකුටම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළින් තහවුරු කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට,

ඊ.එම්.කේ.එම්. පද්මලාල්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත් : 01. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

02. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. පියූආර්/ඒ/සීයූඑස්/2022/සීඕඑම්එස්/1/1

මගේ අංකය / எமது இல. / Our No.

දිනය / திகதி / Date 2023 ජූනි 27 දින

රේගු අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා රේගුව.

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා අරමුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවදුරටත් භාවිතා කරන දේපල පිරියත හා උපකරණවල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 150,816,061 ක් වූ, පුස්තකාල පොත්,පරිගණක, පරිගණක උපාංග, රූපවාහිනී සහ රසායනාගාර උපකරණ පිළබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අරමුදලේ 2022 දෙසැම්බර් 31 දින වන විට ගෙවීම් සඳහා මූල්‍ය අංශයට ලැබී ඇති ගොනු අනුව පමණක් ගණනය කර ගෙවිය යුතු මුදල දැක්වීම නිසා එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වූ රු.990,546,591 ක ගෙවිය යුතු මුදල් වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) වත්කම් කාණ්ඩ 08ක් යටතේ පිරිවැය රු.275,286,858 ක් වූ දේපල පිරියත හා උපකරණ ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණ ද, එකී වත්කම් සංනිරීක්ෂණය කිරීමට අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛණ, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, රඳවා ඇති ස්ථාන ආදි තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ

අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1993 නොවැම්බර් 05 දිනැති අංක 792 දරන ගැසට් පත්‍රය	ගැසට් පත්‍රයේ පළ කරන ලද රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ විධිවිධාන අනුව අරමුදලේ මුදල් බැහැර කළ හැකි ප්‍රධාන රීති 5ක් හඳුන්වා දී තිබුණු අතර එකී රීතීවලින් ප්‍රතිපාදන සලසා නැති එහෙත් රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අදහස අනුව දෙපාර්තුමේන්තුවේ කළමනාකරණ සාපල්‍යය සඳහා අවශ්‍ය යම් විශේෂ වැඩ සටහනක් වෙතොත් මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව දැරිය හැකි බව දක්වා තිබුණ ද, කළමනාකරණ සාපල්‍යය ඉහළ යාමට සෘජු සම්බන්ධතාවයක් නොමැති රාජකාරි වියදම්, සංග්‍රහ වියදම් ආදී විවිධ වියදම් සඳහා රු.4,705,715 ක් මෙම අරමුදලින් දරා තිබුණි.
(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	• චක්‍රලේඛයේ 15(3)(2)(ඇ) ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුලත ඒ ඒ අරමුදල පිළිබඳ සහතික කළ මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත යොමු කළ යුතු වුවද, රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2023 මාර්තු 29 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණු අතර අරමුදලේ කටයුතු සම්බන්ධව කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. • එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කල හැකි වන පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව කාර්තුමය වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.

3.2 කාර්යසාධනය

විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් හා රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් සියයට 20 කට සමාන මුදල් ප්‍රමාණයක් මෙම අරමුදලට බැර කරනු ලබන අතර රේගු ආඥා පනතේ 153 (ආ) 1 වගන්තිය අනුව අරමුදලේ කාර්යයන් පහත සඳහන් පරිදි විය.

- රේගු කළමනාකරණයෙහි සාඵල්‍යය වර්ධනය කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන පහසුකම් සැලසීම සඳහා වියදම් දැරීම.
- ස්ථීර වශයෙන් හෝ පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අබල වූ හෝ තාවකාලික අශක්නුතාවයකට පත් වූ යම් රේගු නිලධාරීන්ට වන්දි ගෙවීම.
- යම් රේගු නිලධාරියෙකු මිය ගිය විට ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්ට වන්දි ගෙවීම.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තුමේන්තුවේ කළමනාකරණ සාපල්‍ය අරමුණු කරගනිමින් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වර්ෂ 6ක කාලපරිච්ඡේදයක දී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා කළමනාකරණ හා වන්දි අරමුදලෙන් වැය කළ මුදල රු. 127,466,286 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට පාඨමාලා හැදෑරූ නිලධාරීන් 323 ක් වුවද, පාඨමාලා අවසන් කර සහතික පත්‍ර ඉදිරිපත් කර තිබුණේ 149 දෙනෙක් පමණි. ඉතිරි නිලධාරීන් එම පාඨමාලාව සාර්ථකව අවසන් කළාද, අත්හැරියේද යන්න පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණු අතර පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් ද නොතිබුණි.

(ආ) රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සාඵල්‍යය වර්ධනය කිරීම හා නිලධාරීන්ට වන්දි ගෙවීම සඳහා නිශ්චිත නිර්ණායක හා අනාගත අපේක්ෂිත අරමුණුගත වියදම් නිවැරදිව සැලසුම් කිරීමකින් තොරව මෙම අරමුදලට මුදල් වෙන් කිරීම නිසා අරමුදලේ සමුච්චිත ශේෂය වාර්ෂිකව අඛණ්ඩව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 8,591 ක් වූ අරමුදලේ සමුච්චිත ශේෂය 2022 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 10,090 ක් දක්වා රු. මිලියන 1499 න් හෙවත් සියයට 17 කින් වර්ධනය වී තිබුණි. එනම් සමාලෝචිත වර්ෂයේ ආදායමින් සියයට 96 ක්ම අරමුදල තුළ සමුච්චනය වී ඇති බව නිරීක්ෂණය විය. අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩව වර්ධනය සඳහා පහත සඳහන් හේතු ද මූලික ලෙස බලපා තිබුණි.

(i) රේගු බදු වංචාවන් පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් පියවර අනුගමනය නොකිරීම හේතුවෙන් ඇතිවන විවිධ රේගු වැරදි සඳහා නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට සිදුවීමත් ඉන් සියයට 20 කට

සමාන ප්‍රතිශතයක් මෙම අරමුදලට බැර වීමත් හේතුවෙන් මෙම අරමුදල අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

(ii) රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේදී අහිමි වූ රජයේ බදු ආදායම ද එම දණ්ඩනයේ කොටසක් ලෙස සැලකීමත් එම දණ්ඩනය පදනම් කරගෙන නිලධාරීන්ගේ ත්‍යාග තීරණය කිරීමත් හේතුවෙන් ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු රාජ්‍ය ආදායම අහිමි වී රේගු නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් මෙන්ම මෙම අරමුදලට වෙන්කරන මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් ද සිදු වී තිබුණි.

(iii) වර්තමානයේ පවත්නා නීදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයන හා අපනයනවල ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අදාල අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය වී නොතිබීම මෙම වර්ධනයන් සඳහා මූලික වශයෙන් බලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අරමුදලට බැර කළ වටිනාකම රු. මිලියන 1554 ක් වුවද අරමුදලේ මූලික අරමුණු වෙනුවෙන් වැයකර ඇති මුදල ආසන්න වශයෙන් රු. මිලියන 47 ක් හෙවත් බැර කළ වටිනාකමට සාපේක්ෂකව සියයට 3ක පමණ ඉතා අඩු අගයක් විය.

(ඈ) මෙම අරමුදලේ මූලික අරමුණුවලින් එකක් ලෙස රේගු නිලධාරීන් සිය රාජකාරීවල නිරතවීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම හඳුනාගෙන තිබුණ ද පරීක්ෂාවට භාජනය කරන ලද ඉකුත් වර්ෂ 10 ක කාල පරිච්ඡේදය තුළ එවැනි කිසිදු වන්දි ගෙවීමක් වාර්තා වී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ 4 ක එකතු අදායම රු. 4,560,396,205 ක් වූ අතර එම කාලපරිච්ඡේදය තුල අරමුදලින් වැය කර තිබූ මුදල (ක්ෂයවීම් හැර) රු. 513,667,244ක් විය. ඒ අනුව මුළු ආදායමෙන් සියයට 11ක පමණ ඉතා අඩු ප්‍රතිශතයක් අරමුදලින් වියදම් කර ඉතිරි සියයට 89 ක් අරමුදලට සමුච්චිත වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

Annex III

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. පියූඅාර්/ඒ/සියූඑස්/2022/ ඔටිසිර්/ඉලා/ඒ

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ජූනි 27 දින

රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

රේගු දෙපාර්තමේන්තුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රේගු දෙපාර්තමේන්තුවේ රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් සහ වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා අරමුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) රේගු අතිකාල අරමුදලින් සියයට 10 ක වටිනාකමක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන අතර ඒ අනුව වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු අගය රු.7,052,811 ක් වුවද එය රු. 2,216,702ක් ලෙස දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ණයහිමියන්ගේ ශේෂය රු.4,836,109 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අතිකාල ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී ආදායම් රැස්කරන මධ්‍යස්ථාන සමඟ ඇස්තමේන්තුගත අතිකාල පැය හා අනුයුක්ත කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව සම්බන්ධයෙන් ඇතිකරගත් එකඟතාවයන් ඇතුළත් ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගෙවිය යුතු අතිකාල හා නැවිබඩු පරීක්ෂා කිරීමේ ගාස්තු ගිණුම්වල පිළිවෙලින් රු.76,788,471 ක හා රු.398,417,022 ක ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. කෙසේවුවද, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු, බාහිර පරීක්ෂණ සඳහා සහභාගි වන නිලධාරීන් සංඛ්‍යාව සහ ඊට වැය වන කාලය ආදී දෑ පුරෝකථනය කිරීමට නොහැකි බවත් විවිධ අංශවල ගෙවීමට ඇති සමහර ගොනු මූල්‍ය අංශයට නොඑවා රඳවාගෙන ඇති බවත් විගණනයට දන්වා තිබුණු අතර ඒ හේතුවෙන් මෙම ගෙවියයුතු වටිනාකම්වල නිවැරදිකාවය තහවුරු නොවුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට

කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති /විධානවල යොමුව	නිරීක්ෂණය
(අ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 3/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සියළුම රාජ්‍ය සේවකයන් සිය පැමිණීම හා පිටවීම සටහන් කිරීම වෙනුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ සේවයේ නියුතු රජයේ නිලධාරීන් කිසිවෙකු එම අවශ්‍යතාවය ඉටු කර නොතිබියදී , සමාලෝචිත වර්ෂය සඳහා රු.938,872,620 ක මුදලක් අතිකාල ලෙස ගෙවා තිබුණි. මෙම ගෙවීම් සිදුකිරීමේදී සාමාන්‍ය රාජකාරී වේලාවෙන් පරිබාහිරව සේවයේ යෙදෙන බවට තහවුරු කිරීමට "අතිකාල සටහන් පත්‍රය" භාවිතා කර තිබුණු අතර එහි අතිකාල සේවයේ යෙදුනු බවට සේවකයන් දින කිහිපයක් එකවර සටහන් කිරීම සහ දිනපතා ඉහළ නිලධාරියෙකුගේ අධීක්ෂණයට ළක් නොකිරීම ආදී අභ්‍යන්තර පාලන දුර්වලතා විය. තවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව පරීක්ෂාවට ළක් කරන ලද අංශ හතරක සේවකයන් කිසිවෙක් නිවාඩු ලබාගත් බවට නිවාඩු ලේඛණවල සටහන් කර නොතිබුණි.
(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ	
(i) 15(1) (2) (ඇ)ඡේදය .	අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසුව ඉතිරිවන මුදල් ඒකාබද්ධ අරමුදලට මාරුකිරීමට පියවර ගත යුතු වුවද, අනිකාල අරමුදල තුළ සමුච්චිත වූ රු.1,765,360,124 ක මුදලක් දීර්ඝ කාලයක සිට පැවතිය ද එපරිදි කටයුතු කර නොතිබුණි.

(ii) 15 (3)(1) (ඇ) ඡේදය.	මුදල් වර්ෂය අවසන් වී මාස 02ක් ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවද,මූල්‍ය ප්‍රකාශන පමනක් 2023 මාර්තු 29 විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.
(iii) 15 (3)(2) (අ) ඡේදය.	අරමුදලේ ගිණුම් කටයුතු සඳහා වෙනමම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(iv) 15 (3)(2) (ඇ) ඡේදය.	අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව කාර්තුමය වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.

3.2 කළමනාකරණ හා මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අතිකාල ආදායම් ලෙස රු. 841,480,851 ක් රැස් කර තිබුණු අතර ඒකාබද්ධ අරමුදල සඳහා වූ දායකත්වය හා ණයගැතියන් සඳහා වෙන්කිරීම් ගැලපූ පසුව අරමුදලේ මුළු වියදම රු.938,780,650 ක් විය. අතීතයේ එකතු කළ අතිකාල ආදායම් වර්තමාන අතිකාල ගෙවීම් සඳහා යොදා ගැනීම නුසුදුසු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අතිකාල අරමුදලේ ඌණතාවය වූ රු.180,967,588 ක් පියවා ගැනීම සඳහා ඉකුත් වර්ෂය තුළ අරමුදලේ පැවති සමුච්චිත ශේෂයන් උපයෝජනයට ගෙන තිබුණි. මෙම ඌණතාවය ඇතිවීම කෙරෙහි 2018 ඔක්තෝබර් 01 දින සිට පැයකට ගෙවනු ලබන අතිකාල ගෙවීම සියයට 50 කින් වැඩිකිරීමට ගත් තීරණය හේතුවී තිබුණි. තවද, අතිකාල රේට ඉහල දැමීමට හා අතිකාල ගෙවිය යුතු නව පාර්ශවයන් ඇතුලත් කිරීමට දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කමිටුවක් විසින් පමණක් ගත් අවිධිමත් තීරණය සඳහා නිශ්චිත වලංගු අනුමැතියක් මුදල් අමාත්‍යාංශයෙන් මෙතෙක් ලබාගෙන නොතිබුණි.

(ආ) 1967 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී ආයතන 65 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ තැන්පත් කර තිබූ රු. 220,418 ක මුදල සාමාන්‍ය ඉතුරුම් තැන්පත් ගිණුම්වල යෙදවීම තුළින් සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.13,062,659 ක පොළී මුදලක් උපයා තිබුණු අතර වසර අවසාන දිනට ආයෝජන ගිණුමේ මුලු වටිනාකම රු.13,283,077 ක් විය. කෙසේවුවද, මෙම ආයතනවල පැවැත්ම, තවදුරටත් සේවා සැපයීම, දෙපාර්තමේන්තුව සමග

ඇති බැදියාව ආදිය පිළිබඳව කිසිදු විමර්ශනයක් සිදු නොකර අදාල ශේෂය ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණයගැති ශේෂය රු.68,682,571 ක් වූ අතර ඉන් වසර 4 කට වඩා පැරණි ණයගැති ශේෂය රු.260,180 ක් ද වසර 3 කට වඩා පැරණි ශේෂය රු.1,125,605 ක් ද,වසර 2 කට වඩා පැරණි ශේෂය රු.1,991,434 ක් ද වසරකට වඩා පැරණි ශේෂය රු.3,648,600 ක් ද විය. ඉන් රු. මිලියන 2 සිට රු. මිලියන 15 දක්වා හිඟ හිටි ගුවන් සමාගම් 4 ක් ද, බන්දික ගුදම් හා නැව් සමාගම් 6 ක් ද විය.

(ඈ) අරමුදලේ ඌණතාවය පසුගිය වර්ෂයට වඩා රු. 4,001,149 කින් වැඩි වී තිබුණු අතර ඌණතාවය පියවා ගැනීම සඳහා සමුච්චිත අරමුදල් යොදා ගැනීම මත 2018 වර්ෂයේ සිට සමුච්චිත අරමුදලේ ශේෂය ක්‍රමයෙන් පිරිහෙමින් පැවතුණි. ඒ අනුව 2018 වර්ෂයේදී රු.2,331,074,672 ක්ව පැවති සමුච්චිත අරමුදලේ ශේෂය 2022 දෙසැම්බර් 31 දින වන විට රු. 1,765,360,124ක් දක්වා අඩුවී තිබුණි.

(ඉ) 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව රේගුවේ නිලධාරීන් සඳහා නියම කර ඇති සාමාන්‍ය රාජකාරී වේලාවෙන් පිටස්තර වේලාවන්හිදී හෝ රාජකාරී සඳහා රේගුව වසා ඇති දිනවල එම නිලධාරීන් විසින් ඉටු කරනු ලබන සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් වශයෙන් අයකරනු ලබන සියලුම මුදල් සහ ඕනෑම රේගු නිලධාරියෙකු ස්වකීය නියම කාර්යාලයේ හෝ සේවා නියුක්ත ස්ථානයෙහි හෝ හැර වෙනත් කිසියම් කාර්යාලයක හෝ ස්ථානයක රාජකාරියෙහි නිරතවීම වෙනුවෙන් එකතු කරන ගාස්තු හෝ අයකිරීම් අතිකාල ගිණුමට බැර කරනු ලබයි. ඒ අනුව රේගු නිලධාරීන් අතිකාල වැඩ නිරතවීම තුලින් ලබන මුදල් පාදක කරමින් අතිකාල ගෙවීම් සිදු කල යුතු වුවද, රේගු නිලධාරීන්ට අමතරව දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි මෙම අරමුදලින් අතිකාල ගෙවීම් හේතුවෙන් එලෙස අතිකාල අරමුදල් ගිණුමේ ශේෂය ක්‍රම ක්‍රමයෙන් හීන වී තිබුණි.

3.3 අයවැය ලේඛනමය පාලනය

අතිකාල අරමුදලේ 2022 ආදායම ලෙස රු.1,111,915,500 ක් ඇස්තමේන්තු ගත කර තිබුණ ද උපයාගත් සත්‍ය ආදායම රු. 841,480,851ක් වීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා සත්‍ය ආදායමේ රු. 270,434,649 ක අහිතකර විචලතාවයක් නිරීක්ෂණය විය. මෙය ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 24 ක පිරිහීමකි. ඊට ප්‍රධාන හේතු වශයෙන් ''කොළඹ'' අනුශීර්ෂය යටතේ වූ ආදායම රු. 270,578,467 කින් අඩුවීම බලපා තිබුණි. ඒ අනුව අතිකාල අරමුදලේ අයවැය ඇස්තමේන්තුව අනුව රු.723,950 ක අතිරික්ත ආදායමක් අපේක්ෂා කළද ප්‍රතිඵලය වී තිබුණේ රු.180,967,588 ක ඌනතාවයකි.

3.4 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ අරමුදලට අයකරගන්නා ලද ආදායම අතිකාල, නැව්බඩු පරීක්ෂණ හා තොරතුරු තාක්ෂණ කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.841,480,851 ක්, රු.228,163,550 ක් හා රු.14,976,000 ක් වී තිබුණි. එම කාර්යයන්ගේ කටයුතුවල නිරත වූ නිලධාරීන්ට අතිකාල ආදායමෙන් සියයට 111 ක් ලෙස රු.938,872,620 ක් ද, නැව්බඩු පරීක්ෂණ ආදායමෙන් සියයට 50 ක් ලෙස රු.114,081,775ක් ද හා තොරතුරු තාක්ෂණ ආදායමෙන් සියයට 80 ක් ලෙස රු.11,980,800 ක්ද ගෙවා තිබුණි. ඉහත ගෙවීම් ක්‍රියාවලිය තුල පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අතිකාල අරමුදලේ ගෙවීම් විධිමත් පාලනයක් යටතේ සිදු නොවන බව ඉකුත් විගණන වාර්තාවල අඛණ්ඩව පෙන්වා දී තිබුණද, මෙම තත්ත්වය විධිමත් කිරීම සඳහා මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) වර්ෂය තුළ දී රැස් කළ අතිකාල ආදායම ඉක්මවා රු.97,391,769 ක් අතිකාල වියදම් ලෙස නිලධාරීන්ට ගෙවා තිබුණි. තව ද පෙර වර්ෂයට සාපේක්ෂව රැස් කළ අතිකාල ආදායම ඉක්මවූ වියදම රු.3,441,271 කින් ඉහළ ගොස් තිබුණි.

(ඇ) නැව් බඩු පරීක්ෂණ ගාස්තු ගිණුමේ ප්‍රවර්ථන වර්ෂයේ ආදායම රු.25,213,318 කින් අඩුවී තිබූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 9.95 ක පහළ යෑමකි.

(ඈ) ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් වෙත අතිකාල ගෙවීම ශ්‍රී ලංකා රේගු අතිකාල අරමුදල මඟින් මෙන්ම ශ්‍රී ලංකා රේගුවේ 247-1-1-1002 වැය ශීර්ෂය මඟින්ද සිදුකර තිබුණු අතර, ඇතැම් නිලධාරීන් සඳහා රේගු අතිකාල අරමුදල මඟින් මාසිකව පැය 600 ක උපරිමයකට යටත්ව අතිකාල ගෙවීම් සිදුකරන තත්ත්වයක් තුල එකම නිලධාරියා වෙත අතිකාල අරමුදල මඟින් මෙන්ම ඒකාබද්ධ අරමුදලින්ද ගෙවීම් කිරීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.

Annex IV

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීයූආර්/ඒ/සීයූඑස්/2022/ආර්ඊඩබ්ඩ්ඩ්ඒ/ඒ.ඒ. ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 ජුනි 27 දින

රේගු අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කළයුතු වුවද, රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබිය යුතු රු.299,083,645,129ක මුදලක් ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ප්‍රකාරව අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා අරමුදල් ලබාගත් ආකාරය සහ එම මුදල් පාවිච්චි කළ ආකාරය පිළිබඳව තොරතුරු මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට ලබාදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රේගු නිලධාරීන්ට ගෙවූ රු.2,246,308,353 ක්, තොරතුරු සපයන්නන්ට ගෙවූ රු.623,413,401 ක්, පොලිසිය, නාවික හමුදාව සහ ගුවන් තොටුපල නිලධාරීන්ට ගෙවූ රු.38,475,594 ක්, බදු වශයෙන් ගෙවූ රු. 156,892,470 ක් අරමුදලේ මුදල් ගලායාම් ප්‍රවාහයක් ලෙස සහ මහා භාණ්ඩාගාරයෙන් ත්‍යාග මුදල් ගෙවීම සඳහා ලද රු.3,517,772,169 ක් අරමුදලේ මුදල් ලැබීම් ප්‍රවාහයන් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඇ) අරමුදලේ 2022 දෙසැම්බර් 31 දින වන විට ගෙවීම් සඳහා මූල්‍ය අංශයට ලැබී ඇති ගොනු අනුව පමණක් ගණනය කර ගෙවිය යුතු ත්‍යාග මුදල දැක්වීම නිසා එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වූ රු.1,944,495,119 ක ගෙවිය යුතු ත්‍යාග මුදල් වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය කෙරේ.

(ඈ) 2018 වර්ෂයට පෙර සිට පැවත එන භාණ්ඩාගාර පොත් සහ අරමුදලේ පොත් අතර රු.11,264,393ක වෙනසට හේතු හඳුනාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රජයේ ආදායමට බැර කර තිබුණි.

(ඉ) 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 වගන්තිය ප්‍රකාරව දණ්ඩන හා රාජසන්තක ද්‍රව්‍ය විකුණුම් ආදායමින් රේගු ත්‍යාග අරමුදල සඳහා සියයට 50 ක්ද, කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා සියයට 20 ක්ද වශයෙන් දායක විය යුතු විය. ඒ අනුව කළමනාකරණ හා වන්දි අරමුදලේ සමාලෝචිත වර්ෂය සඳහා ආදායම ලෙස හඳුනාගත් සියයට 20 ක දායකය වූ රු.153,610,984 ට සමානුපාතිකව ත්‍යාග අරමුදලේ සියයට 50 ක දායකය රු 384,027,460 ක් විය යුතු වුවද ත්‍යාග අරමුදලේ ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණේ රු.3,517,772,169 ක් වීම නිසා ආදායමේ රු.3,133,744,709 ක නොසැසඳීමක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ

මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	විස්තරය
1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය	ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද,1988 ජනවාරි 28 දින අංක පිඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වසරේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 24 ක් තුළ ත්‍යාග අරමුදල් ලෙස නිලධාරීන් සඳහා රු.20,870,564,416 ක්ද, ඔත්තුකරුවන් සඳහා රු.3,143,829,243 ක් ද ගෙවා තිබුණි.

3.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

(අ) රේගු වැරදි සම්බන්ධව සිදු කරන රේගු විමර්ශනවලදී එම වැරදිවලට අදාලව ආනයනයන් සාමාන්‍ය ක්‍රමයට සිදු කරන ලද ආනයනයන් වූයේ නම් ඒ මත රජයට ලැබිය යුතුව පැවති අවම බදු ආදායමේ ප්‍රමාණය අයකර රාජ්‍ය ආදායමට බැර කිරීම නොසලකා එම අහිමි වූ බදු ආදායම ද දණ්ඩනයක් සේ සලකා එසේ පනවන දණ්ඩන මුදලින් සියයට 50 ක් නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ගෙවීමට යොදා ගැනීම හේතුවෙන් රාජ්‍ය ආදායමට සිදු කරන අහිතකර බලපෑම පිළිබඳව වර්ෂ ගණනාවක සිට විගණනය විසින් පෙන්වා දී තිබුණි. මෙම තත්ත්වය නොසලකා හැරීම නිසා නිලධාරීන් වෙත බෙදාහරින ත්‍යාග මුදල්වල ප්‍රමාණය දිගින් දිගටම වැඩි වීමක් නිරීක්ෂණය වන අතර මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් නිරීක්ෂණ පහත සිදුකෙරේ.

(i) රටේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති මත ආනයනයන්ගේ හා අපනයනයන්ගේ ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත මෙන්ම මෙම අරමුදල්වල නෛතික ප්‍රතිපාදන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පැවතිණි.

(ii) රේගු ආඥා පනතේ 162 වගන්තියේ දැක්වෙන පරිදි රේගු නියමයන් කඩකිරීම සම්බන්ධයෙන් අදාල වන දෑ පිළිබඳව රේගු අධ්‍යක්ෂවරයාට සුදුසු පරිදි ක්‍රියා කිරීමට බලය පවරා තිබුණි. එහෙත් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් දක්වන අවධානය සතුටුදායක මට්ටමක නොපැවතුණි.

(iii) රේගු ආඥා පනතේ ගෙවීම් සම්බන්ධ ප්‍රමුඛතා ලබාදිය යුතු කිසිදු අවස්ථාවක් සඳහන්ව නොමැති වුවද සෑම වර්ෂයකම මෙන්ම 2022 වර්ෂය තුලදීද ඔත්තුකරුවන්ටහා ත්‍යාගලාභීන්ට පොරොත්තු ලේඛනය නොසලකා විවිධ හේතූන් මත ප්‍රමුකත්වය ලබාදී ගෙවා තිබූ මුදල රු.721,180,899 ක් වූ අතර මෙම තත්වය පවත්නා නීතිරීතිවලට පටහැනි මෙන්ම නිසි විගණනයක් කිරීමටද බාධාවක් වී තිබුණි.

(iv) වර්ෂය තුල සම්පූර්ණ ගොණු 257 කට මෙන්ම කොටස් වශයෙන් හා ඔත්තුකරුවන් සඳහා කලින් ගොණු 56ක් සඳහා ගෙවීම්කර තිබුණු නමුත් බාහිර පාර්ශවයන්ගෙන් ලද තොරතුරු මත විමර්ශන ගොණු සඳහා ගෙවීම් කිරීමට ප්‍රමාණවත් උනන්දුවක් නොදක්වන බව බාහිර පාර්ශවයන් වෙතුවෙන් ඔම්බුඩ්ස්මන් විසින් රේගු අධ්‍යක්ෂවරයාගෙන් කරන ලද විමසීම් ලිපි අනුව අනාවරණය විය.

(ආ) බ්‍රසීලයේ සිට ආනයනය කරන ලද සීනි බහාලුම් තුළ කෝකේන් මත් ද්‍රව්‍ය ඇති බවට ආනයනකරුගේම දැනුම් දීම මත රඳවා පරීක්ෂා කර පසුව මත් ද්‍රව්‍ය අඩංගු නොවන බවට තහවුරු කරගැනීමෙන් පසු ආනයනකරුට ආදාල සීනි බහාළුම් වලින් 04ක් නියමිත දිනට පෙර නිදහස් කර ගැනීමට ද අපොහොසත් වීම නිසා එම බහාලුම් සම්බන්ධයෙන් 2017 පෙබරවාරි

මස විමර්ශණයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව රේගු ආඥා පනතේ 109 වගන්තිය යටතේ අදාල සීනි තොගය රාජසන්තක කර 2022 අප්‍රේල් මාසයේදී සත්ත්ව ආහාර ලෙස නැවත විකුණා තිබුණු අතර ඒ සඳහා වසර 05ක් ගතවී තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා රේගුව විසින් බහාළුම් අංගනවල රඳවාගෙන ඇති අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාව**

රේගුව විසින් රඳවාගෙන ඇති අත්‍යවශ්‍ය භාණ්ඩ පිළිබඳව සිදුකළ විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2021 වර්ෂයේ ජනවාරි මාසයේ සිට 2022 අගෝස්තු 01 දින වන විට රේගු පරීක්ෂණ සිදු කරමින් පැවතුණු ආහාර ද්‍රව්‍ය ඇතුළත් බහාළුම් 27 ක් සම්බන්ධයෙන් ආනයනකරුවන් විසින් අදාල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා එම බහාළුම් ඔවුන් වෙත නිදහස් කිරීම දින 95 සිට දින 563 ක් දක්වා ප්‍රමාද වූ අවස්ථා විය. ආනයනික ද්‍රව්‍ය සඳහා අනුමැතීන් (නිර්දේශ) ලබා දිය යුතු ආයතන වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ආදියෙන් එකී සහතික ලැබීමේ ප්‍රමාදය මෙයට බලපා තිබුණි.

(ii) රේගු විමර්ශන කටයුතු හේතුවෙන් ඒ යටතේ පවතින රෑන්කින් කන්ටේනර් ටර්මිනල් (RCT)අංගනයේ 2022 අගෝස්තු 01 දිනට ආහාර ද්‍රව්‍ය ඇතුලත් බහාළුම් 88 ක් දින 60 සිට දින 778 දක්වා කාලයක් රඳවා තිබුණි. ඒවායේ වටිනාකම රු. 745,383,250 ක් විය.

(iii) ශ්‍රී ලංකාවට කහ ආනයනය කිරීමේ දී සංයෝජිත වර්ගීකරණ සංකේත 0910.30.10 ට අදාල කුඩු නොකළ හා නොඇඹරූ කහ සඳහා බලපත්‍රයක් ලබාගත යුතු බව 2019 දෙසැම්බර් 06 දින අංක 2152/63 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර තිබුණි. ඒ සමඟම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් "විරෝධතා නොමැත" (No objection letters) යනුවෙන් ලිපියක් ද ලබාගත යුතු විය. කෙසේවුවද, 2020 අප්‍රේල් 30 දිනෙන් පසුව එවැනි ලිපියක අවශ්‍යතාවයක් නොතිබියදී, 2020 මැයි 10 දින ආනයනය කර තිබූ රු.151,979,588 ක් වටිනා කහ කිලෝග්‍රෑම් 624,877 ක් 2022 අගෝස්තු 01 දින වන විට ද වසර 02 කට අධික කාලයක සිට නිදහස් නොකර රේගුව විසින් රඳවාගෙන තිබුණි.

(ඈ) Temporary Importation for Export Processing Scheme (TIEP) යෝජනා ක්‍රමය යටතේ පොල්තෙල් (Coconut oil) ආනයනය කර අගය එකතු කර ප්‍රතිඅපනයනය කිරීම සඳහා රේගුවේ ලියාපදිංචි වූ සමාගමක් විසින් එපරිදි පොල්තෙල් ප්‍රතිඅපනයනය නොකර වර්ෂ ගණනාවක සිට දේශීය වෙළඳපොලට අලෙවිකර රජයට බදු ආදායම් අහිමි කර තිබුණි. මේ සම්බන්ධයෙන් රේගුව සිදුකළ විමර්ශනයට අනුව 2014 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුළ දී ඉහත පෞද්ගලික සමාගම විසින් දේශීය සමාගමකට අලෙවි කළ පොල්තෙල් ප්‍රමාණය 463,065kg ක්

වූ අතර රේගු විමර්ශණයෙන් නියම කළ අහිමිකිරීම් වටිනාකම රු. 477,377,802 ක් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පෞද්ගලික සමාගමට පැනවූ රු.477,377,802 ක දණ්ඩන වටිනාකම අහිමි කිරීම රේගු ආඥා පනතේ 163 වගන්තිය ප්‍රකාරව රු. 90,000,000 ක් දක්වා ලිහිල් කිරීමට (Mitigate) රේගුව කටයුතු කර තිබුණු අතර එහිදී රේගු ආඥා පනතේ 166 (ආ) ප්‍රකාරව දණ්ඩනයට හෝ රාජ සන්තක කිරීමට මුල් වූ කඩකිරීමේ බරපතලකම, අහිමි වූ ආදායම් ප්‍රමාණය ආදී කරුණු නොසලකා හැර තිබුණි. කෙසේවුවද, TIEP යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වීම හේතුවෙන් රජයට මෙම සමාගම විසින් අහිමි කළ මුළු ආදායම රු.63,567,715 ක් වූ අතර අහිමි කිරීම් වටිනාකම රු. 90,000,000 ක් දක්වා අඩු කිරීම හේතුවෙන් මහා භාණ්ඩාගාරයට සත්‍ය වශයෙන්ම ලද ආදායම රු. 27,000,000 ක් (Rs. 90,000,000 × 30%) දක්වා අඩු වී තිබුණි.

(ii) TIEP යෝජනා ක්‍රමය යටතේ පහසුකම් ලබන ආයතන පිළිබඳව රේගු නිලධාරීන් විසින් සෑම වර්ෂයකම විධිමත් අධීක්ෂණයක් සිදු කළ යුතු වුවද, එවැනි අධීක්ෂණයක් සිදු වී නොතිබීම නිසා මෙවැනි තවත් වංචා සමාගම් විසින් සිදුකළ හැකි බව විගණනයේදී බැහැර කළ නොහැකිය.

3.2 කාර්යසාධනය

1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් සහ රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් සියයට 50 කට සමාන මුදල් ප්‍රමාණයක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කරනු ලබන අතර රේගු බදු වංචාවන් අනාවරණය කරගැනීම, පාලනය කිරීම හා වැළැක්වීම වැනි අරමුණු පෙරදැරි කරගෙන නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ලබාදීම සඳහා මෙම අරමුදල පිහිටුවා තිබේ. 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වසර 10 ක කාලය තුල මෙම අරමුදලින් නිලධාරීන්, ඔත්තුකරුවන් හා විවිධ සේවා සපයන අංශ වෙනුවෙන් වූ උපඅරමුදල් සඳහා කරනු ලැබූ ගෙවීම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

වර්ෂය	ගෙවන ලද ත්‍යාග ලිපිගොනු සංඛ්‍යාව	ගෙවන ලද මුළු ත්‍යාග මුදල	නිලධාරීන් සඳහා ගෙවන ලද කොටස	ඔත්තුකරුවන් සඳහා ගෙවන ලද කොටස	අනෙකුත් අරමුදල් හා විවිධ සේවා
		රු.	රු.	රු.	රු.
2012	183	952,882,430	658,519,186	128,208,276	166,154,968
2013	286	1,509,280,909	1,089,268,962	121,281,124	298,730,823
2014	343	1,353,531,889	953,858,131	117,310,035	282,363,723
2015	274	1,252,772,591	1,090,976,365	123,347,553	38,448,673

2016	279	2,371,231,289	1,629,006,445	185,138,406	557,086,438
2017	246	2,316,128,767	1,658,990,867	109,462,461	547,675,439
2018	266	2,462,038,890	1,635,981,137	237,337,440	588,720,313
2019	231	1,843,013,865	1,104,988,629	295,409,615	442,615,621
2020	146	1,297,069,866	985,187,046	124,421,392	187,461,428
2021	177	2,832,805,136	2,104,040,195	425,266,803	281,687,527
2022	257	3,300,334,561	2,193,497,401	623,413,400	326,531,290
		21,491,090,193	15,104,314,364	2,490,591,505	3,717,476,243

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

(i) 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එකතුව රු.17,594,905,869 ක මුදලක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබුණු අතර, මින් රු.15,104,314,364 ක් හෙවත් සියයට 86 ක් නිලධාරීන් වෙත ගෙවා තිබුණි.

(ii) රේගු විමර්ශන සඳහා අවශ්ය ඉන්ධන වියදම් පියවා ගැනීම අරමුණු කරගෙන ත්යාග අරමුදලේ උප අරමුදලක් වශයෙන් ඉන්ධන අරමුදල පිහිටුවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ද රු.108,336,061 ක් එම අරමුදලට බැර කර තිබුණි. කෙසේවුවද, විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශීර්ෂයට වැය බරක් වී තිබීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම එම අරමුදලෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි. ඒ අනුව සත්‍ය අවශ්‍යතාවයකින් තොරව දිගින් දිගටම මෙම අරමුදලට මුදල් රැස්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට එහි සමුච්චිත ශේෂය රු.759,755,575 ක් වී තිබුණි.

(iii) ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා සහභාගි වන නිලධාරීන් වෙනුවෙන් ගෙවීම් සඳහා වන මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදල සඳහා (නාකොටික් අරමුදල) සමාලෝචන වර්ෂය තුළද රු. 38,912,961 ක් බැර කර තිබුණු නමුත් වර්ෂය තුළ ඉන් කිසිදු මුදලක් ගෙවා නොතිබුණි.

(iv) විමර්ශන කටයුතු සඳහා සෘජුව දායක නොවන නමුත් සහායක සේවා සපයන අංශවල නිලධාරීන් සඳහා ගෙවීම් වෙනුවෙන් ත්‍යාග අරමුදලේ උප අරමුදල් වශයෙන් පිහිටුවා ඇති සියයට 2.5 ක අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.56,257,455 ක් බැරකර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ සමුච්චිත ශේෂය රු.271,086,409 ක් විය. මෙම අරමුදලින්ද 2019 වර්ෂයේ සිටම කිසිදු ගෙවීමක් සිදු කර නොතිබුණු අතර අවශ්‍යතාවය සමාලෝචනය කිරීමකින් තොරව කළමනාකරණය විසින් මෙම උප අරමුදලද දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි.

(v) 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වර්ෂ 06 ක කාලය තුළ වැඩිම ත්‍යාග ලැබූ නිලධාරීන් සියදෙනා අතර රු. 4,963,272,932 ක් ත්‍යාග ලෙස බෙදා දී තිබුණි. ඒ අනුව එක් නිලධාරියෙකුට ගෙවා ඇති ත්‍යාග මුදලේ සාමාන්‍යය රු.මිලියන 50ක් පමණ විය. එක් අයෙකුට රු.මිලියන 50 කට වඩා වැඩිපුර ත්‍යාග මුදල් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව 09ක් විය. සමාලෝචිත වර්ෂයේදී ද වැඩිම ත්‍යාග මුදල් ලැබූ නිලධාරීන් 100 දෙනාගේ ත්‍යාග මුදල් වල එකතු වටිනාකම රු.1,039,219,122ක් වූ අතර එහි සාමාන්‍යය රු.10,392,191ක් විය. එම නිලධාරීන් 100 දෙනා තුළ රු.මිලියන 10ට වඩා ත්‍යාග ලබාගත් නිලධාරීන් 32ක් විය.

(vi) රේගු විමර්ශන ඔත්තුකරුවන් විසින් ලබාදෙන තොරතුරු පදනම් කරගෙන සහ රේගු නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරී තුල අනාවරණය කර ගන්නා රේගු වැරදි මත පදනම්ව සිදු කරනු ලබයි. **ඔත්තුකරුවන්** ලබාදෙන තොරතුරු පදනම් කරගෙන රේගු විමර්ශන පවත්වා ඉන් ලැබෙන ත්‍යාග මුදලෙන් ද යම් ප්‍රමාණයක් රේගු නිලධාරීන් වෙත බෙදා හැරීම සිදු කරන අතර සමාලෝචිත වර්ෂයේදී ඔත්තුකරුවන් සම්බන්ධ වී තිබුණු ත්‍යාග ගොණු 83 ක් පරීක්ෂාවේ දී ඉන් ඔත්තුකරුවන්ට ගෙවා තිබූ වටිනාකම රු.682,062,325 ක් වූ අතර රේගු නිලධාරීන්ට ද රු. 421,922,275 ක් ගෙවා තිබුණි.

(ආ) 2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේන්තුවේ අංශ (Directorate) 40 ට අදාලව රේගු විමර්ශන 9754 ක් පැවතුණු අතර, ඉන් ආදායම් අධීක්ෂණ ඒකකයට (RTF) අදාළව විමර්ශන 3199 ක් ද, නිවාරණ අංශයට (Preventive) අදාළව විමර්ශන 1593 ක් ද, මධ්‍යම විමර්ශන අංශයට අදාළව විමර්ශන 738 ක් ද, අනෙකුත් අංශ 37ට අදාලව විමර්ශන 4224ක් ද විය. සමාලෝචිත වර්ෂය අවසාන දිනට සමස්ත විමර්ශන සංඛ්‍යාවෙන් වසර 07 ට වඩා පැරණි 1518 ක් ද, වසර 06 ට වඩා පැරණි 1026 ක් ද, වසර 05 ට වඩා පැරණි 1038 ක් ද, වසර 04 ට වඩා පැරණි 852 ක් ද, වසර 03 ට වඩා පැරණි 1009 ක් ද, වසර 02 ට වඩා පැරණි 1442 ක් ද, වසරකට වඩා පැරණි 1417 ක් ද සහ වසරක් ඇතුළත වූ විමර්ශන 1452 ක් ද විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති.